# කාර්ය සාධන වාර්තාව
# සහ ගිණුම්
# 2020

**වැය ශීර්ෂ අංකය - 253**

විශ්‍රාම වැටුප් දෙපාර්තමේන්තුව
මාලිගාවත්ත
කොළඹ 10

# පටුන


**01. ආයතනික පැතිකඩ**

1.1. හැඳින්වීම ---------- 6

1.2. දැක්ම, මෙහෙවර හා අරමුණු ---------- 7

1.3. ප්‍රධාන කාර්යයන් ---------- 8

1.4. සංවිධාන සටහන ---------- 9-10

1.5. දෙපාර්තමේන්තුවේ ප්‍රධාන අංශ ---------- 11-17

පාලන අංශය ---------- 11

විමධ්‍යගත විශ්‍රාම වැටුප් අංශය ---------- 12

මධ්‍යගත විශ්‍රාම වැටුප් අංශය ---------- 12

සත්කාර පියස ---------- 13

ප්‍රතිපත්ති අංශය ---------- 13

සන්නද්ධ සේවා විශ්‍රාම වැටුප් අංශය ---------- 13

විදේශ විශ්‍රාම වැටුප් අංශය ---------- 14

වැන්දඹු හා අනත්දරු විශ්‍රාම වැටුප් අංශය ---------- 14

ගිණුම් අංශය ---------- 14-15

රාජ්‍ය සේවා අර්ථසාධක අරමුදල ---------- 15-16

නීති අංශය ---------- 16

අභ්‍යන්තර විගණන අංශය ---------- 16

තොරතුරු තාක්ෂණ අංශය ---------- 16

මාධ්‍ය අංශය ---------- 17

තැපැල් අංශය ---------- 17

විශ්‍රාමික සංගම් පරිපාලනය හා සම්බන්ධීකරණය ---------- 17

ව්‍යාපාරික අංශ සම්බන්ධීකරණය ---------- 17

**02. ප්‍රගතිය හා ඉදිරි දැක්ම**

විශේෂ ව්‍යාපෘති ---------- 20-34

අභියෝග ---------- 34

විශ්‍රාම වැටුප් දෙපාර්තමේන්තුවේ ඉදිරි ගමන්මග ---------- 34-35

**03. 2020.12.31 දිනෙන් අවසන් වූ වර්ෂය සඳහා වන සමස්ත මූල්‍ය කාර්ය සාධනය**

3.1. මූල්‍ය කාර්ය සාධන ප්‍රකාශය ---------- 38

3.2. මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශය ---------- 39

3.3. මුදල් ප්‍රවාහ පිළිබඳ ප්‍රකාශය ---------- 40

3.4. මූල්‍ය ප්‍රකාශ සටහන් ---------- 41

3.5. ආදායම් එකතු කිරීමේ කාර්ය සාධනය ---------- 42

3.6. වෙන් කරන ලද ප්‍රතිපාදන උපයෝගී කර ගැනීමේ කාර්ය සාධනය----------------------------------42

3.7. මු.රෙ.208 ප්‍රකාරව, වෙනත් අමාත්‍යාංශ/ දෙපාර්තමේන්තු වල නියෝජිතයෙකු ලෙස-----------------43
මෙම දෙපාර්තමේන්තුවට/ දිස්ත්‍රික් ලේකම් කාර්යාලයට/ පළාත් සභාවට ප්‍රදානය
කරන ලද ප්‍රතිපාදන

3.8. මූල්‍ය නොවන වත්කම් වාර්තා කිරීමේ කාර්ය සාධනය-------------------------------------------43

3.9. විගණකාධිපතිවරයාගේ වාර්තාව-------------------------------------------------------------44-73

**04. කාර්ය සාධන දර්ශක**

4.1. ආයතනයේ කාර්ය සාධන දර්ශක (ක්‍රියාකාරී සැලැස්ම මත පදනම්ව)-----------------------------76-78

**05. තිරසාර සංවර්ධන අරමුණු සපුරා ගැනීමේ කාර්යසාධනය**

5.1. හඳුනා ගන්නා ලද තිරසාර සංවර්ධන අරමුණු------------------------------------------------------80

5.2. තිරසාර සංවර්ධන ඉලක්ක සපුරා ගැනීමේ ජයග්‍රහණ හා අභියෝග----------------------------------80

**06. මානව සම්පත් පැතිකඩ**

6.1. සේවක සංඛ්‍යා කළමනාකරණය------------------------------------------------------------------82

6.2. මානව සම්පත් සංවර්ධනය-------------------------------------------------------------------82-83

**07. අනුකූලතා වාර්තාව**-------------------------------------------------------------------------85-92

# 1

# ආයතනික පැතිකඩ

## 1.1. හැඳින්වීම

රාජ්‍ය පරිපාලන අමාත්‍යාංශය යටතේ ඒ ශ්‍රේණියේ දෙපාර්තමේන්තුවක් ලෙස 1970.12.23 දින ස්ථාපිත කරන ලද විශ්‍රාම වැටුප් දෙපාර්තමේන්තුවට 2020 වර්ෂයට වසර 50ක් සපිරේ. එම ස්වර්ණ ජයන්තියක අභිමානවත් ඉතිහාසය තුළ රාජ්‍ය සේවක විශ්‍රාමිකයින්ගේ හා ඔවුන්ගේ යැපෙන්නන්ගේ අනාගත සුරක්ෂිතභාවය තහවුරු කරනු වස් රාජ්‍ය සේවක/අධිකරණ නිලධාරීන් හා ත්‍රිවිධ හමුදාවන් වෙනුවෙන් විශ්‍රාම වැටුප් සම්බන්ධ රාජ්‍ය ප්‍රතිපත්ති ක්‍රියාවට නංවමින් විශ්‍රාම වැටුප් දෙපාර්තමේන්තුව අනගිබවනීය සමාජ මෙහෙවරක යෙදී සිටී.

ශ්‍රී ලංකාවේ විශ්‍රාම වැටුප් පිළිබඳ නීතිය 1898 ජුනි මස 23 දින සිට 1898 අංක 01 දරන වැන්දඹු අනත්දරු ආඥා පනත අනුව ක්‍රියාත්මක වීම ආරම්භ වී ඇත. එතැන් සිට විශ්‍රාම වැටුප් ගෙවීම් කළමනාකරණය කිරීමේ කාර්යභාරය මහා භාණ්ඩාගාරය යටතේ සිදු වී ඇත. 1934 පෙබරවාරි 05 දින නිකුත් කර ඇති විශ්‍රාම වැටුප් ව්‍යවස්ථා සංග්‍රහය ලංකාවේ සිවිල් විශ්‍රාම වැටුප් පිළිබඳ මූලික නෛතික ලියවිල්ල ලෙස හඳුන්වා දිය හැකි අතර 1947 අංක 2 දරන ආඥා පනතේ 2 වන වගන්තියෙන් විශ්‍රාම වැටුප් ව්‍යවස්ථා සංග්‍රහය 1901 සිට ශ්‍රී ලංකාවේ පැනවූ නීතියේ කොටසක් බවට පත් කර ඇත. පසුකාලීන අවශ්‍යතා මත විශ්‍රාම වැටුප් ව්‍යවස්ථා සංග්‍රහය 1972 මැයි 05 දින නැවත ප්‍රතිශෝධනය කර ඇත.

වර්තමානයේදී විශ්‍රාම වැටුප් දෙපාර්තමේන්තුව රජයේ නිලධාරීන්ගේ විශ්‍රාම වැටුප් ක්‍රමය පරිපාලනය කරමින් 650,000කට අධික රජයේ විශ්‍රාමික ප්‍රජාව වෙත සාර්ථකව ප්‍රතිලාභ හිමිගන්වමින් ක්‍රියාත්මක වන රජයේ ප්‍රමුඛ පෙළේ දෙපාර්තමේන්තුවක් බවට පත්වී ඇත.

විශ්‍රාම වැටුප් දෙපාර්තමේන්තුව නවීන තාක්ෂණික හා කළමනාකරණ ක්‍රමවේද භාවිතා කරමින් තම ක්‍රියාවලි සරල කිරීමෙන් ඔබ්බට ගොස් විශ්‍රාම වැටුප් ගෙවීම් පමණක් නොව විශ්‍රාමිකයා වෙත තවදුරටත් සහන සැලසීමේ අරමුණින් පෞද්ගලික අංශය සමඟ එක්ව විශ්‍රාමිකයා වෙත සුවිශේෂි වරප්‍රසාද හා පහසුකම් ලබාදීමට කටයුතු කර ඇත.

විශ්‍රාම වැටුප් දෙපාර්තමේන්තුව ස්වර්ණ ජයන්තිය සමරණ මේ වර්ෂයේ විශ්‍රාම දිවියට එළඹෙන රාජ්‍ය සේවක විශ්‍රාමිකයා වෙත ඉහල සුරක්ෂිතතාවක් සහතික කොට ඇති අතර එම සුරක්ෂිතභාවයම රටේ සමස්ත ජනතාව වෙත ලබාදෙමින් විශ්‍රාම වැටුපක් නොලබන සියළු දෙනාට සහභාගී විය හැකි සමාජ ආරක්ෂණ වැඩසටහනක අවශ්‍යතාවය 'සැමට විශ්‍රාම' යෝජනාවලිය මගින් ඉදිරිපත් කර ඇත. ඒ අනුව වැඩිවන වැඩිහිටි ජනගහනය විධිමත්ව කළමනාකරණය කරමින් සමාජ ආරක්ෂණ හා ආර්ථික කළමනාකරණ අභියෝග සාර්ථකව ජය ගැනීම උදෙසා රජයට පිටුවහලක් වීමේ අධිෂ්ඨානයෙන් විශ්‍රාම වැටුප් දෙපාර්තමේන්තුව කටයුතු කරමින් සිටී.

2020 මුදල් වර්ෂය තුළ විශ්‍රාම වැටුප් දෙපාර්තමේන්තුව සිදු කරන ලද සමාජ ආරක්ෂණ ප්‍රතිලාභී මෙහෙයුමට අදාල භෞතික හා මූල්‍ය ක්‍රියාකාරකම්හි සාධනීය තත්ත්වයන් පිළිබඳ විස්තර ඇතුළත් කරමින් මෙම වාර්තාව සකස් කර ඇත්තේ රාජ්‍ය මුදල් දෙපාර්තමේන්තුව විසින් නිකුත් කරන ලද රාජ්‍ය මුදල් චක්‍රලේඛ අංක 02/2020 අනුකූලවය.

## 1.2. දැක්ම, මෙහෙවර හා අරමුණු

ශ්‍රී ලංකා විශ්‍රාම
இலங்கை ஓய்வு
Sri Lanka Pensions

**දැක්ම**

ආර්ථික හා සාමාජීය වශයෙන් තෘප්තිමත් විශ්‍රාමික ප්‍රජාවක්

**මෙහෙවර**

රාජ්‍ය සේවා විශ්‍රාමිකයන් හා ඔවුන්ගේ ප්‍රතිලාභීන් සඳහා තොරතුරු තාක්ෂණය හා තිරසාර කළමනාකරණ ක්‍රමවේද භාවිතයෙන් ද, පෞද්ගලික හා රාජ්‍ය අංශ මුහුවෙන් ඉහළ සේවාලාභී හා සේවාදායක තෘප්තිය තහවුරු කරමින් නෛතික ප්‍රතිලාභයන් පිළිගැන්වීම

### අරමුණු

- රාජ්‍ය සේවක විශ්‍රාම ප්‍රතිලාභ විශ්‍රාම වැටුප් ව්‍යවස්ථා සංග්‍රහය හා වැන්දඹු හා අනත්දරු ආඥා පනත හා වැන්දඹු පුරුෂ හා අනත්දරු පනතට අනුකූල වන පරිදි හිමිගැන්වීමේ ක්‍රියාවලිය නියාමනය කිරීම හා ඊට අදාල විධිවිධානයන් පැනවීම.
- විශ්‍රාම වැටුප් සම්බන්ධ නෛතික රාමු, රීතීන්ට හා ප්‍රතිපත්ති තීරණවලට අනුකූලව රාජ්‍ය සේවකයින්ගේ විශ්‍රාම වැටුප හිමිගැන්වීම.
- මාසික විශ්‍රාම වැටුප් ප්‍රතිලාභ අඛණ්ඩව ගෙවීම හා එක්වරක් ගෙවන ප්‍රතිලාභ නිරවද්‍යතාවයකින් යුක්තව හිමිගැන්වීම.
- රාජ්‍ය සේවා අර්ථ සාධක අරමුදල් ක්‍රමය නියාමනය හා ප්‍රතිලාභ හිමිගැන්වීම.
- රජය වෙනුවෙන් වැන්දඹු අනත්දරු දායක මුදල් රැස්කිරීම හා අනෙකුත් ආදායම් රැස්කිරීම හා කළමනාකරණය කිරීම.
- සන්නද්ධ හමුදා විශ්‍රාම වැටුප් හා පසු ප්‍රතිලාභ කළමනාකරණය.
- සක්‍රීය සේවයේ යෙදී සිටියදී ජීවිතක්ෂයට හෝ දුබලතාවයට පත් වූ ත්‍රිවිධ හමුදා හා පොලිස් සේවා සාමාජිකයන්ට වන්දි වැටුප් හා දීමනා ගෙවීම.
- සමාජ ආරක්ෂණය පිළිබද ලෝක ප්‍රවණතා අධ්‍යයනය කරමින් නූතන සමාජ ආරක්ෂණ ක්‍රමයන් පිළිබඳව ප්‍රතිපත්ති සම්පාදනය සඳහා සහාය වීම.
- වාර්ෂික අයවැය පිළියෙල කිරීම හා ප්‍රගතිය පිළිබදව ව්‍යවස්ථාදායකයට වගවීම.
- ජාතික විශ්‍රාමික දින සැමරුම් උළෙල පැවැත්වීම.

## 1.3. ප්‍රධාන කාර්යයන්

විශ්‍රාම වැටුප් දෙපාර්තමේන්තු සමස්ථ කාර්යභාරය ක්‍රියාවලි හතරක් ඔස්සේ සිදු කරනු ලබයි.

### 1.3.1 විශ්‍රාම වැටුප් හා ප්‍රතිලාභ ප්‍රදානය

**I. රජයේ හා අධිකරණ නිලධාරීන්ගේ විශ්‍රාම වැටුප් හිමිගැන්වීම**

රාජ්‍ය සේවකයින්, අධිකරණ, පිරිවෙන් ගුරු, පෞද්ගලික පාසල් ගුරු සහ "ට" උප ලේඛනයට ඇතුලත් කර ඇති නිලධාරීන් හට විශ්‍රාම වැටුප් ව්‍යවස්ථා සංග්‍රහයේ විධිවිධාන අනුව විශ්‍රාම වැටුප් හා පාරිතෝෂික හිමිගැන්වීම.

**II. සන්නද්ධ සේවාවන් සඳහා විශ්‍රාම වැටුප් හිමිගැන්වීම**

සන්නද්ධ සේවා නිලධාරීන් හා සෙසු නිලයන්ට විශ්‍රාම වැටුප් හා පාරිතෝෂික හිමිගැන්වීම, වන්දි, දුබලතා විශ්‍රාම වැටුප් හා යැපෙන්නන්ගේ දීමනා හිමිගැන්වීම.

**III. වැන්දඹු හා අනත්දරු හෝ වැන්දඹු පුරුෂ හා අනත්දරු විශ්‍රාම වැටුප් හිමිගැන්වීම**

සිවිල් අධිකරණ හා හමුදා සේවකයකුගේ හෝ විශ්‍රාමිකයකුගේ අභාවයකින් අනතුරුව වැන්දඹු හෝ වැන්දඹු පුරුෂ හා අනත්දරු විශ්‍රාම වැටුප් ගෙවීම ආරම්භ කිරීම, රාජ්‍ය සේවයේ යෙදී සිටියදී මියයන රාජ්‍ය සේවකයින් සහ ත්‍රස්තවාදී හේතුන් මත මියයන රාජ්‍ය සේවකයින් යන අයවලුන් සඳහා මරණ පාරිතෝෂික හිමිගැන්වීම, අනත්දරු හා ආබාධිත විශ්‍රාම වැටුප් හිමිගැන්වීම.

**IV. රාජ්‍ය සේවා අර්ථසාධක අරමුදලේ ප්‍රතිලාභ හිමිගැන්වීම**

රාජ්‍ය සේවයේ විශ්‍රාම වැටුප් රහිත පත්වීම් දරන්නන් වෙත සේවා අවසාන ප්‍රතිලාභ ගෙවීම.

### 1.3.2 ගෙවීම් නියාමනය


විශ්‍රාම වැටුප්, වැන්දඹු, වැන්දඹු පුරුෂ, අනත්දරු හා ආබාධිත විශ්‍රාම වැටුප් ආදී මාසිකව සිදු කරන ගෙවීම් ද, රාජ්‍ය සේවා අර්ථසාධක අරමුදලේ ප්‍රතිලාභ ගෙවීම්, වැන්දඹු හා අනත්දරු අරමුදල් ආපසු ගෙවීම්, විශ්‍රාම වැටුප් පාරිතෝෂික ගෙවීම්, මරණ පාරිතෝෂික ගෙවීම්, උරුමකරු ගෙවීම්, විශ්‍රාම වැටුප් හිමිකම නොලබා සේවයෙන් ඉවත්වන සන්නද්ධ සේවා නිලධාරීන්ගේ සේවා පාරිතෝෂික හා සිවිල් සේවා පාරිතෝෂික සැකසීම, විශේෂ වන්දි ගෙවීම්, විදේශගත විශ්‍රාමිකයින්ගේ විශ්‍රාම වැටුප් ආදී ගෙවීම් නිරවද්‍යතාවයෙන් යුතුව නියාමනය කිරීම.

### 1.3.3 ලැබීම් නියාමනය


පළාත් පාලන සේවා වැන්දඹු/ වැන්දඹු පුරුෂ හා අනත්දරු අරමුදල් ලැබීම්, පළාත් පාලන සේවා විශ්‍රාම වැටුප් අරමුදල් ලැබීම්, රාජ්‍ය සේවා අර්ථසාධක අරමුදල් ලැබීම්, ගොඩනැගිලි කුලී සහ නිවාඩු නිකේතන ආදායම් නියාමනය කිරීම.

### 1.3.4 සංවර්ධන ප්‍රවේශය

රජයේ ප්‍රතිපත්ති රාමුව හා තිරසාර සංවර්ධන ඉලක්ක සපුරා ගැනීම ඉලක්ක කර ගෙන ප්‍රතිපත්තිමය තීරණ ගැනීමට සහාය වීම, සමාජ ආරක්ෂණ ප්‍රතිපත්ති සම්බන්ධයෙන් නිරන්තර අධ්‍යයනය කිරීම, විශ්‍රාම වැටුප් දෙපාර්තමේන්තු සේවාලාභීන්ට රාජ්‍ය හා පුද්ගලික ආයතන සම්බන්ධ කර ගනිමින් විශේෂ ප්‍රතිලාභ හිමිගැන්වීම හා රජයේ ඉලක්ක සපුරාගත හැකි වන පරිදි මානව හා භෞතික සම්පත් නිරන්තරව සංවර්ධනය කර ගනිමින් කටයුතු කිරීම.



# 1.4. සංවිධාන සටහන



# විශ්‍රාම වැටුප් දෙපාර්තමේන්තුවේ අනුමත කාර්යය මණ්ඩලය- 2020.12.31 දිනට

| තනතුරේ ස්වභාවය | තනතුර | අදාළ වන සේවය | වැටුප් ක්‍රමය | අනුමත මුළු තනතුරු සංඛ්‍යාව | සේවයේ නියුතු සංඛ්‍යාව | පුරප්පාඩු තනතුරු සංඛ්‍යාව |
|---|---|---|---|---|---|---|
| ජ්‍යෙෂ්ඨ මට්ටම | විශ්‍රාම වැටුප් අධ්‍යක්ෂ ජනරාල් | SLAS (Special) | SL-3-2016 | 1 | 1 | 0 |
| | අතිරේක විශ්‍රාම වැටුප් අධ්‍යක්ෂ ජනරාල් | SLAS (Special) | SL-3-2016 | 1 | 1 | 0 |
| | වෛද්‍ය නිලධාරී (කොන්ත්‍රාත් පදනම) | Primary Grade | SL-2-2016 | 1 | 0 | 1 |
| | විශ්‍රාම වැටුප් අධ්‍යක්ෂ | SLAS (Class I) | SL-1-2016 | 4 | 3 | 1 |
| | ප්‍රධාන ගණකාධිකාරී | SLAcS(Class I) | SL-1-2016 | 1 | 1 | 0 |
| | ප්‍රධාන අභ්‍යන්තර විගණක | SLAcS(Class I) | SL-1-2016 | 1 | 1 | 0 |
| | නියෝජ්‍ය අධ්‍යක්ෂ / සහකාර අධ්‍යක්ෂ | SLAS(Class II or III) | SL-1-2016 | 10 | 7 | 3 |
| | ගණකාධිකාරී | SLAcS(Class I) | SL-1-2016 | 1 | 1 | 0 |
| | ගණකාධිකාරී | SLAcS(Class II or III) | SL-1-2016 | 9 | 8 | 1 |
| | නියෝජ්‍ය අධ්‍යක්ෂ / සහකාර අධ්‍යක්ෂ | SLITS(Class II or III) | SL-1-2016 | 1 | 1 | 0 |
| | නීති නිලධාරී | Dept | SL-1-2016 | 1 | 1 | 0 |
| | පරිගණක මෘදුකාංග සංවර්ධක (කොන්ත්‍රාත් පදනම) | Dept | | 3 | 1 | 2 |
| | | | | **34** | **26** | **8** |
| තෘතීය මට්ටම | පරිපාලන නිලධාරී | PMAS (Supra) | MN-7-2016 | 4 | 3 | 1 |
| | *භාෂා පරිවර්තක සිංහල - ඉංග්‍රීසි 01<br>සිංහල - දෙමළ 01 | TS | MN-6-2016 | 2 | 1 | 1 |
| | තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ නිලධාරී | SLICTS | MN-6-2016 | 5 | 1 | 4 |
| | | | | **11** | **5** | **6** |
| ද්විතීය මට්ටම | කාර්මික නිලධාරී | SLTS | MN-3-2016 | 1 | 0 | 1 |
| | අයවැය සහකාර | RS | MN-4-2016 | 1 | 1 | 0 |
| | විශ්‍රාම වැටුප් නිලධාරී | Dept. | MN-4-2016 | 233 | 222 | 11 |
| | සංවර්ධන නිලධාරී | DOS | MN-4-2016 | 505 | 417 | 88 |
| | කළමනාකරණ සේවා නිලධාරී | MSO | MN-2-2016 | 190 | 167 | 23 |
| | තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ සහකාර | SLICTS | MT-1-2016 | 5 | 4 | 1 |
| | ලේඛණ සහකාර | Dept. | MN-1-2016 | 141 | 120 | 21 |
| | Help Desk Operator | Dept. | | 2 | 0 | 2 |
| | | | | **1078** | **931** | **147** |
| ප්‍රාථමික මට්ටම | බංගලා භාරකරු | Dept. | PL-1-2016 | 2 | 1 | 1 |
| | අරක්කැමි / උද්‍යාන කම්කරු | Dept. | PL-1-2016 | 4 | 3 | 1 |
| | රියදුරු | DS | PL-3-2016 | 12 | 11 | 1 |
| | විදුලි කාර්මික | Dept. | PL-3-2016 | 1 | 0 | 1 |
| | කාර්යාල කාර්ය සහායක | OES | PL-1-2016 | 56 | 44 | 12 |
| | | | | **75** | **59** | **16** |
| එකතුව | | | | **1198** | **1021** | **177** |

***භාෂා පරිවර්තක** - සේවයේ නියුතු සේවක සංඛ්‍යාව - ඉංග්‍රීසි - දෙමළ - 01

# 1.5. දෙපාර්තමේන්තුවේ ප්‍රධාන අංශ

## පාලන අංශය

දෙපාර්තමේන්තුවේ සියළුම නිලධාරීන්ගේ පෞද්ගලික ලිපිගොනු නඩත්තු කිරීම, විනය සම්බන්ධ කටයුතු ඇතුළු සියළුම පරිපාලන කටයුතු සිදු කිරීම සහ දෙපාර්තමේන්තුවේ යටිතල පහසුකම් සැපයීම්, ඉදිකිරීම්, නඩත්තු, අළුත්වැඩියා කටයුතු හා සේවා කිරීම් සම්බන්ධයෙන් වන රාජකාරි කටයුතු මෙම අංශය මගින් සිදු කෙරේ.



කොරෝනා වසංගත තත්ත්වය හේතුවෙන් ඇඳිරිනීතිය පැනවූ කාලසීමාවේ සහ දෙපාර්තමේන්තු පරිශ්‍රය හුදෙකලා ප්‍රදේශයක් බවට නම් කිරීම හේතුවෙන් දෙපාර්තමේන්තුව වසා දැමූ කාලසීමාවේදී ද විශ්‍රාමිකයින්ගේ ගැටළු සඳහා විසඳුම් ලබාදීම අඛණ්ඩව සිදු කිරීම සඳහා 1970 ක්ෂණික දුරකතන අංකය, එම කාර්යය සඳහා යොදවා ඇති නිලධාරීන්ගේ ජංගම දුරකතන හා සම්බන්ධ කර එම කටයුතු අඛණ්ඩව පවත්වාගෙන යාම සිදු කරන ලදී.

විශ්‍රාම වැටුප් දෙපාර්තමේන්තුව පිහිටි ගොඩනැගිල්ලේ දෙපාර්තමේන්තුව ප්‍රයෝජනයට නොගන්නා ඉඩ ප්‍රමාණයන් වෙනත් ආයතන වෙත කුලී පදනම මත ලබාදී ඇති අතර එමගින් මාසිකව ආදායම් රැස් කිරීම සිදු කරනු ලැබේ. 2020 වර්ෂයේ ගොඩනැගිලි කුලී ලැබීම්වල වටිනාකම රු.13,824,450 ක් වේ.

2016 අංක 12 දරණ තොරතුරු දැනගැනීමේ අයිතිවාසිකම් පනත විශ්‍රාම වැටුප් දෙපාර්තමේන්තුව විසින් 2017 වර්ෂයේ සිට ක්‍රියාත්මක කරනු ලබයි. ඒ සඳහා 2020 වර්ෂය තුළ විශ්‍රාමික ගැටළු 140 ක් ඉදිරිපත් වී ඇති අතර ඉන් 133ක් සඳහා පිළිතුරු සපයා ඇත. විශ්‍රාමික ගැටළු 07ක් සඳහා පිළිතුරු යැවීමට නියමිතව ඇත.

විශ්‍රාම වැටුප් දෙපාර්තමේන්තුව විසින් විශ්‍රාමික ප්‍රජාව ඇතුළු සමස්ථ මහජනතාවගේ ප්‍රයෝජනය සඳහා පවත්වාගෙන යනු ලබන නිවාඩු නිකේතන පාලනය කිරීම හා නඩත්තු කිරීම් කටයුතු පවත්වාගෙන යාම සහ එමගින් මාසිකව ආදායම් ඉපැයීම සිදු කරනු ලැබේ. 2020 වර්ෂය තුළ උපයා ඇති නිවාඩු නිකේතන ආදායම රු.13,606,972.82ක් වන අතර දිවයින පුරා ව්‍යාප්තව පැවති කොරෝනා වසංගත තත්ත්වය හමුවේ නිවාඩු නිකේතන පහසුකම් සැපයීම නතර කිරීම හේතුවෙන් පෙර වර්ෂයට සාපේක්ෂව ඉපැයූ ආදායම අඩුවී ඇත.

ජනාධිපති කාර්යාලයෙන් හා අග්‍රාමාත්‍ය කාර්යාලයෙන් 2020 වර්ෂයේදී දෙපාර්තමේන්තුව වෙත ලැබී ඇති විශ්‍රාමික ගැටළු සඳහා කඩිනමින් පිළිතුරු ලබාදීමට කටයුතු කර ඇත.

කොවිඩ් 19 වසංගත තත්ත්වය හමුවේ වුවද සෞඛ්‍ය ආරක්ෂිත ක්‍රම අනුගමනය කරමින් දෙපාර්තමේන්තුව වෙත පැමිණෙන විශ්‍රාමිකයා හට තම ගැටළු නිරාකරණය කර ගැනීම සඳහා අවස්ථාව ලබා දෙන ලදී. සියළුම අංශ නියෝජනය වන පරිදි අංශභාර මාණ්ඩලික නිලධාරියෙකුගේ පූර්ණ අධීක්ෂණය යටතේ එම කටයුතු සිදු කරන ලද අතර එකී ගැටළු විසඳීමේ ප්‍රගතිය පිළිබඳව ද නිරීක්ෂණය කරන ලදී. ඒ අනුව පසුගිය වසර තුළ විශ්‍රාමික ගැටළු 5000කට ආසන්න ප්‍රමාණයක් ලැබී ඇති අතර ඒ සියළුම ගැටළු සම්බන්ධයෙන් පවතින වත්මන් තත්ත්වය පිළිබඳව අදාළ සේවාලාභීන් වෙත දැනුම් දී හෝ විසඳුම් ලබා දී හෝ ඇත.

## විමධ්‍යගත විශ්‍රාම වැටුප් අංශය

විමධ්‍යගත ක්‍රමය මගින් විශ්‍රාම වැටුප් ප්‍රදානය කිරීමේ විශේෂත්වය වන්නේ විශ්‍රාම වැටුප් ප්‍රදානය කිරීමේ බලය සම්පූර්ණයෙන්ම ආයතන ප්‍රධානියා වෙත විමධ්‍යගත කිරීමයි. එසේ වුවද සියළුම රාජ්‍ය ආයතන විසින් විශ්‍රාම වැටුප් ප්‍රදානයට ප්‍රථම නිලධාරීන්ගේ විශ්‍රාම වැටුප් අයදුම්පත් විශ්‍රාම වැටුප් දෙපාර්තමේන්තුව වෙත යොමු කළ යුතුවේ. එසේ අයදුම්පත් යොමු කිරීමේ මූලික අරමුණ වනුයේ විශ්‍රාමිකයින් සඳහා විශ්‍රාම වැටුප් අංක ලබා ගැනීම, ප්‍රථම විශ්‍රාම වැටුප් සක්‍රීය කිරීම හා පාරිතෝෂිකය ගෙවීම් කිරීම යන කරුණු සාක්ෂාත් කර ගැනීම උදෙසාය.

ඒ අනුව විශ්‍රාම අයදුම්පත විශ්‍රාම වැටුප් දෙපර්තමේන්තුවට යොමු කරන අවස්ථාවේ සිට සියළුම කටයුතු මාර්ගගත (Online) ක්‍රමයට සිදු කෙරේ. නිලධාරියා විශ්‍රාම ගැන්වීමේ දිනයට මාස 6කට පෙර සිට අදාල අයදුම්පත්‍ර විශ්‍රාම වැටුප් දෙපාර්තමේන්තුව වෙත යොමු කිරීමට පහසුකම් සලසා ඇත. මෙම ක්‍රමය යටතේ විශ්‍රාම ගන්වන දිනම එම විශ්‍රාමිකයාට අදාල විශ්‍රාම වැටුප් ප්‍රදානය ලබා ගෙන රාජ්‍ය සේවය වෙනුවෙන් නිලධරයා කරන ලද කැප කිරීම් අගය කරනු පිණිස මෙන්ම ආත්මාභිමානයක් ඇති කරනු වස් ඔහු/ඇය ගෞරවාන්විතව විශ්‍රාම ගැන්වීමට ආයතන වලට හැකියාව ලැබී තිබේ.



## මධ්‍යගත විශ්‍රාම වැටුප් අංශය

රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ අංක 16/1995 ප්‍රකාරව ආයතන ප්‍රධානීන්ට බලය ලබා දී ඇති විමධ්‍යගත විශ්‍රාම වැටුප් ගෙවීම හැර ආයතන ප්‍රධානීන්ට බලය විමධ්‍යගත නොකරන ලද විශ්‍රාම වැටුප්, හිමිකම පරීක්ෂාකර ගෙවීම් කිරිමේ කටයුතු දක්වා සියළු කාර්යයන් මධ්‍යගත අංශය හරහා සිදුවේ.

**ඉටු කෙරෙන කාර්යයන්**

- විනය හේතු මත විශ්‍රාම ගන්වනු ලබන නිලධාරීන් සඳහා විශ්‍රාම වැටුප් හිමිගැන්වීම. (විශ්‍රාම වැටුප් ව්‍යවස්ථා සංග්‍රහයේ 2 හා 12 වගන්ති)
- සේවා අකාර්යක්ෂමතාවය මත හා සානුකම්පිත විකල්පයක් ලෙස අනිවාර්ය විශ්‍රාම ගැන්වීමක් ලෙස විශ්‍රාම ගන්වන නිලධාරීන් සඳහා විශ්‍රාම වැටුප් හිමිගැන්වීම. (විශ්‍රාම වැටුප් ව්‍යවස්ථා සංග්‍රහයේ 2 සහ 15 වගන්ති)
- තනතුර අහෝසි විම මත හෝ ආයතනය වසා දැමීම මත විශ්‍රාම යන නිලධාරීන් සඳහා විශ්‍රාම වැටුප් හිමිගැන්වීම. (විශ්‍රාම වැටුප් ව්‍යවස්ථා සංග්‍රහයේ 2 සහ 7 වගන්ති)
- ස්ථිර මුදාහැරීම මත විශ්‍රාම වැටුප් හිමිගැන්වීම. (විශ්‍රාම වැටුප් ව්‍යවස්ථා සංග්‍රහයේ 2 සහ 48 වගන්ති)
- පෞද්ගලික පාසැල් හා පිරිවෙන් ගුරුවරුන් සඳහා විශ්‍රාම වැටුප් හිමිගැන්වීම.
- රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ අංක 04/2006, 07/2004, 44/90 යටතේ විශ්‍රාම වැටුප් හිමිගැන්වීම.
- වෛද්‍ය හේතුන් මත විශ්‍රාම වැටුප් හිමිගැන්වීම. ( විශ්‍රාම වැටුප් ව්‍යවස්ථා සංග්‍රහයේ 2 සහ 14 වගන්ති)
- සේවා කාලය අවුරුදු 20 සම්පූර්ණ වීම මත විශ්‍රාම වැටුප් හිමිගැන්වීම. (රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ 30/88)
- සේවා කාලය, විශ්‍රාම ගැන්වීම හා පත්වීම් පිළිබඳ ගැටලු මතුවන විශ්‍රාම වැටුප් අයදුම් පත් සම්බන්ධයෙන් කටයුතු කිරීම.



## සත්කාර පියස

රාජ්‍ය නිලධාරියෙකු විශ්‍රාම ගියවිට සිය ජීවිත කාලය තුල එක් වරක් පමණක් විශ්‍රාම වැටුප් දෙපාර්තමේන්තුවට පැමිණීමත්, එහිදී විශ්‍රාමිකයාගේ හා ඔහුගේ පවුලේ සාමාජිකයන්ට හිමි සියළු විශ්‍රාම වැටුප් හිමිකම් හා පසු ප්‍රතිලාභ තහවුරු කර දීමත් අරමුණු කරගෙන 2015 වර්ෂයේදී සත්කාර පියස ක්‍රියාවලිය ආරම්භ කරන ලදි. ඒ අනුව විශ්‍රාමිකයෙකුගේ විශ්‍රාම වැටුප් අයදුම්පත පරික්ෂාකර අනුමත කිරීමෙන් පසුව විශ්‍රාමිකයාව විශ්‍රාම වැටුප සක්‍රීය කිරීමේ සම්මුඛ පරීක්ෂණය සඳහා සත්කාර පියසට කැඳවනු ලැබේ. සෑම විශ්‍රාමිකයෙකුටම සත්කාර පියසට පැමිණීම සඳහා නියමිත දිනයක් හා වේලාවක් ලබා දෙන අතර, නියමිත වේලාවට අදාල සේවය සැලසීම සඳහා වෙනම නිලධාරියෙකු සූදානමින් සිටී.

එහිදී නිලධාරියාගේ අනන්‍යතාවය තහවුරු කර ගැනීමෙන් පසු විශ්‍රාම වැටුප සක්‍රිය කිරීම, විශ්‍රාමිකයාගේ යැපෙන්නන්ගේ තොරතුරු සනාථ කරගෙන විශ්‍රාම වැටුප් හිමිකම් පත්‍රය නිකුත් කිරීම, විශ්‍රාමිකයාගේ ඇඟිලි සලකුණු ලියාපදිංචි කිරීම හා විශ්‍රාමික හැඳුනුම්පත්‍රය නිකුත් කිරීම සිදු කෙරේ.

## ප්‍රතිපත්ති අංශය

රාජ්‍ය නිලධාරීන් සහ විශ්‍රාමික ප්‍රජාව වෙත විශ්‍රාම වැටුප් ගෙවීම සඳහා සම්පාදිතව පවත්නා ප්‍රතිපත්තිමය කරුණු අර්ථ දැක්වීම, අවස්ථානුකූලව එලෙස පවතින ප්‍රතිපත්තිමය කරුණු සංශෝධනය කිරීම හා නව ප්‍රතිපත්ති තීරණ වලට එළඹීම මෙම අංශයේ ප්‍රධාන කාර්යභාරය වේ.

**ඉටු කෙරෙන කාර්යයන්**

- විශ්‍රාම වැටුප් සම්බන්ධ ප්‍රතිපත්තිමය කරුණු සම්බන්ධයෙන් අදාල අමාත්‍යාංශ හා ආයතන සමඟ සම්බන්ධීකරණය කිරීම.
- ව්‍යවස්ථාපිත සංශෝධන සඳහා අදාල වන්නා වූ විශ්‍රාම වැටුප් දෙපාර්තමේන්තු චක්‍රලේඛ, උපදෙස් ලිපි නිකුත් කිරීම.
- විශ්‍රාමික ප්‍රජාව පෞද්ගලිකවද සියළුම රාජ්‍ය ආයතන මට්ටමින්ද විශ්‍රාම වැටුප් ප්‍රතිපත්ති සම්බන්ධව යොමු කරනු ලබන ගැටළු නිරාකරණය සඳහා අවශ්‍ය පැහැදිලි කිරීම්/ උපදෙස් සැපයීම.



## සන්නද්ධ සේවා විශ්‍රාම වැටුප් අංශය

ශ්‍රී ලංකා යුද්ධ හමුදාව, නාවික හමුදාව හා ගුවන් හමුදාව වශයෙන් ස්ථාපනය කර ඇති සන්නද්ධ හමුදා ත්‍රිත්වය පිළිවෙලින් 1949 අංක 17 දරන යුද්ධ හමුදා පනත, 1949 අංක 41 දරන ගුවන් හමුදා පනත හා 1950 අංක 34 දරන නාවික හමුදා පනත සහ ඒවාට කලින් කල සිදු කරනු ලබන සංශෝධන ප්‍රකාරව පනවනු ලබන ලද නීති රීති හා රෙගුලාසි අනුව සන්නද්ධ සේවා විශ්‍රාම වැටුප් හා පාරිතෝෂික ගෙවීම් කළමනාකරණය කිරීම සන්නද්ධ සේවා විශ්‍රාම වැටුප් අංශයෙන් සිදුවේ.

**ඉටු කෙරෙන කාර්යයන්**

- සේවා විශ්‍රාම වැටුප් හිමිගැන්වීම.
- පරිවර්තිත, මරණ හා සේවා පාරිතෝෂික ගෙවීම් කටයුතු සිදු කිරීම.
- දුබලතා විශ්‍රාම වැටුප, යැපෙන්නන් වෙනුවෙන් ගෙවනු ලබන දීමනාව, විශේෂ වන්දි, නැවත සේවා සංශෝධන වැනි කටයුතු හා බැඳි ක්‍රියා සම්බන්ධීකරණය කිරීම.

## විදේශ විශ්‍රාම වැටුප් අංශය

වසර දෙකකට වඩා වැඩි කාලයක් විදෙස්ගතව සිටින විශ්‍රාමිකයින්ගේ හා ද්විත්ව පුරවැසිභාවය හිමි විශ්‍රාමිකයින්ගේ විශ්‍රාම වැටුප් ගෙවීම්, වැටුප් සංශෝධන සහ විශ්‍රාමික ලිපිගොනු 10,000ක පමණ කටයුතු සම්බන්ධීකරණය, පාලනය කිරීම හා අධීක්ෂණය කිරීම විදේශ විශ්‍රාම වැටුප් අංශය මගින් සිදු කෙරේ.

## වැන්දඹු හා අනත්දරු විශ්‍රාම වැටුප් අංශය

1898 අංක 01 දරන වැන්දඹු හා අනත්දරු විශ්‍රාම වැටුප් ආඥා පනත හා ඊට අදාල සංශෝධන, 1983 අංක 24 දරන වැන්දඹු පුරුෂ හා අනත්දරු විශ්‍රාම වැටුප් පනතේ විධිවිධාන, 1970 අංක 18 දරන වැන්දඹු හා අනත්දරු(සන්නද්ධ සේවා) වැටුප් පනත හා ඒ යටතේ පනවන ලද නියෝග මාලාව හා පළාත් පාලන සේවා වැන්දඹු හා අනත්දරු විශ්‍රාම වැටුප් අරමුදල් පනතෙහි ප්‍රතිපාදනයන්ට යටත්ව ලියාපදිංචි කිරීම, සේවයේ යෙදී සිටියදී හෝ විශ්‍රාම ගිය පසු මිය යනු ලබන රජයේ නිලධාරීන්ගේ හෝ විශ්‍රාමිකයින්ගේ වැන්දඹුවන්ට/ වැන්දඹු පුරුෂයන්ට, අනත්දරුවන් හා ආබාධිත දරුවන් වෙත විශ්‍රාම වැටුප් හිමිගැන්වීම සම්බන්ධව කටයුතු සිදු කෙරේ.

**ඉටු කෙරෙන කාර්යයන්**

- සිවිල් හා අධිකරණ සේවා නිලධාරීන්ගේ වැන්දඹු/ වැන්දඹු පුරුෂ හා අනත්දරු විශ්‍රාම වැටුප් ක්‍රමයේ ලියාපදිංචි කිරීම.
- වැන්දඹු/ වැන්දඹු පුරුෂ හා අනත්දරු විශ්‍රාම වැටුප් හිමිගැන්වීම.
- ආබාධිත අනත්දරුවන් වෙත විශ්‍රාම වැටුප් හිමිගැන්වීම.
- මරණ පාරිතෝෂිකය හිමිගැන්වීම.

## ගිණුම් අංශය

253 වැය ශීර්ෂය යටතේ පාර්ලිමේන්තුව මගින් වෙන් කරනු ලබන ප්‍රතිපාදන, පවත්නා නීති රීති වලට අනුකූලව දෙපාර්තමේන්තුවේ ප්‍රධාන අරමුණ වන විශ්‍රාමික ප්‍රතිලාභ ගෙවීම සහ දෙපාර්තමේන්තුවේ සේවය කරන නිලධාරීන්ගේ වැටුප් හා අනෙකුත් පහසුකම් සලසමින් මූල්‍ය කළමනාකරණය පවත්වාගෙන යාමට සහයවීම සිදු කෙරේ.

## මාසික ගෙවීම් අංශය

දේශීය සහ විදේශගත සියළු විශ්‍රාමිකයින්ගේ මාසික විශ්‍රාම වැටුප් ගෙවීම් නියාමනය කරමින් රාජ්‍ය හා පෞද්ගලික බැංකු පද්ධතිය, තැපැල් කාර්යාල පද්ධතිය, ග්‍රාමීය බැංකු සහ සමූපකාර සමිති ඔස්සේ නියමිත දිනදී මාසික විශ්‍රාම වැටුප් සියළු විශ්‍රාමිකයින් අතට පත් කිරීම මෙම අංශය මගින් සිදු කෙරේ.

## පාරිතෝෂික ගෙවීම් අංශය

සියළුම විශ්‍රාමිකයින්ගේ සහ පසු ප්‍රතිලාභීන්ගේ ප්‍රධානතම බලාපොරොත්තුව වන එක්වරක් පමණක් ගෙවීම් සිදුකරන විශ්‍රාම පාරිතෝෂික, මරණ පාරිතෝෂික සහ සේවා පාරිතෝෂික ගෙවීම් හා ඒ පිළිබඳ තොරතුරු පවත්වාගෙන යාම සහ මහා භාණ්ඩාගාරය සමග සම්බන්ධීකරණය පවත්වාගෙන යාම මෙම අංශයෙන් සිදු කෙරේ.

## විෂමතා අංශය

විශ්‍රාම ගිය නිලධාරීන්ගේ විශ්‍රාම යාමෙන් පසුව විශ්‍රාම වැටුප සංශෝධනය කිරීම හෝ කලින් කලට ගන්නා ප්‍රතිපත්තිමය තීරණ අනුව විශ්‍රාම වැටුප පරිවර්තනය කිරීම හෝ සංශෝධනය කිරීම හෝ වෙනත් යම් හේතුවක් නිසාවෙන් විශ්‍රාම වැටුපේ සිදුවන වෙනස්කම් වලට අනුකූලව විශ්‍රාම වැටුප් ගැලපීම හා හිඟ විශ්‍රාම වැටුප් ගෙවීම මෙම අංශය මගින් සිදු කෙරේ.

## වැන්දඹු අන්තදරු දායක මුදල් කළමනාකරණ අංශය

මධ්‍යම රජය, පළාත් සභා සහ පළාත් පාලන ආයතන සේවකයින්ගේ වැන්දඹු/ වැන්දඹු පුරුෂ හා අනත්දරු දායක මුදල් එක්රැස් කිරීම, යම් රාජ්‍ය සේවකයකු සේවය අවසන් කරන දිනට වැන්දඹු / වැන්දඹු පුරුෂ හා අනත්දරු විශ්‍රාම වැටුප් සඳහා හිමිකම් ලැබිය හැකි ප්‍රතිලාභීන් නොමැති විට හෝ ප්‍රතිලාභීන් සඳහා හිමිකමක් නොමැති විට රාජ්‍ය සේවකයාගෙන් අයකරනු ලැබූ දායක මුදල රාජ්‍ය සේවකයාට හෝ ඔහු හෝ ඇය මිය ගොස් ඇත්නම් ඔහුගේ හෝ ඇයගේ උරුමකරුවන් වෙත ආපසු ගෙවීම් කිරීම වැන්දඹු හා අනත්දරු දායක මුදල් අංශයෙන් සිදු කෙරේ.

## සැපයුම් අංශය

වාර්ෂික ප්‍රසම්පාදන සැලැස්මේ ඉලක්ක අනුව දෙපාර්තමේන්තුවේ අවශ්‍යතා මත උපදේශන සේවා, භාණ්ඩ හා සේවා විධිමත් ප්‍රසම්පාදන ක්‍රියාවලිය අනුගමනය කරමින් අත්පත් කර ගැනීම, මිලදී ගැනීම හා භාණ්ඩ බෙදා හැරීම කළමනාකරණය කිරීම මෙම අංශයේ කාර්යය වේ.

## වැඩිපුර ගෙවීම් අයකිරීම් අංශය

රාජ්‍ය ආයතන විසින් මෙන්ම විවිධ ප්‍රතිපත්තිමය ගැටළු හේතුවෙන් විශ්‍රාමිකයින් හට වැඩියෙන් ගෙවී ඇති මුදල් නැවත අය කිරීම සහ රජයට අයකල යුතු යැයි දැනුම් දෙන අත්තිකාරම් බී ගිණුමේ ශේෂයන්, වැටුප් වැඩිපුර ගෙවීම් හා සේවා කාලය තුල සිදු කරන ලද වැරදීම් හා අතපසුවීම් වෙනුවෙන් වූ දණ්ඩන මුදල් විශ්‍රාම වැටුපෙන් අයකර අදාල ආයතන වෙත ප්‍රේෂණය කිරීම මෙම අංශයට පැවරී ඇති ප්‍රධාන වගකීමයි.

## රාජ්‍ය සේවා අර්ථසාධක අරමුදල

රාජ්‍ය සේවා අර්ථසාධක අරමුදල, 1942 අංක 18 දරණ රාජ්‍ය සේවා අර්ථසාධක අරමුදල් ආඥා පනත යටතේ 1942 අප්‍රේල් 01 දින මාසික වැටුප් ලබන, ස්ථිර, එහෙත් විශ්‍රාම වැටුප් රහිත රාජ්‍ය සේවකයින් සඳහා සේවා අවසාන මූල්‍ය ප්‍රතිලාභ සහතික කරනු වස් ආරම්භ කරන ලදී. 2003 අංක 17 දරණ සංශෝධන පනතින් හා, වරින් වර නිකුත් කරන ලද චක්‍රලේඛ මගින් රාජ්‍ය සේවයේ නියුක්ත අනියම්, තාවකාලික, දෛනික වැටුප් ලාභීන්, කොන්ත්‍රාත් පදනමින් බඳවා ගත් අයවලුන්, අභ්‍යාසලාභීන් ආදී පුළුල් පරාසයකින් යුත් සේවා කාණ්ඩයන් සඳහා ප්‍රතිලාභ ලබාගත හැකි වන පරිදි අරමුදලේ අරමුණු හා පරමාර්ථ පුළුල් කර ඇත.

ආරම්භයේ සිට මුදල් අමාත්‍යාංශය යටතේ ක්‍රියාත්මක වූ රාජ්‍ය සේවා අර්ථසාධක අරමුදල 1970-12-23 දින සිට විශ්‍රාම වැටුප් දෙපාර්තමේන්තුව බිහිවීමෙන් පසුව ඒ යටතේ ක්‍රියාත්මක වන අතර, රාජ්‍ය පරිපාලන විෂය භාර ගරු අමාත්‍යවරයාගේ අධීක්ෂණය යටතේ වන අරමුදල් කළමනාකරණ මණ්ඩලය මගින් බලතල ක්‍රියාත්මක කෙරේ.

1. විශ්‍රාම වැටුප් අධ්‍යක්ෂ ජනරාල් (සභාපති)

2. උප නීතිපති (සොලිසිටර් ජනරාල්)

3. එක් එක් තැනැත්තා රජයේ දෙපාර්තමේන්තුවක ප්‍රධානියෙකු හෝ ඒ දෙපාර්තමේන්තුවේ ප්‍රධානියාගේ නියෝජ්‍ය වන තැනැත්තන් දෙදෙනෙකු

4. අරමුදලට දායක වන තැනැත්තන්ගෙන් එක් අයෙක්

වශයෙන් කළමනාකරණ මණ්ඩලය සමන්විත වේ.

රාජ්‍ය සේවා අර්ථසාධක අරමුදල් ආඥා පනත ප්‍රකාරව රාජ්‍ය සේවා අර්ථසාධක අරමුදලේ සාමාජිකත්වය ලැබූ නිලධාරීන්ගේ වැටුපෙන් අයවන 8% ක දායක මුදලත්, සාමාජිකයා සේවය කරන ආයතනය විසින් ගෙවනු ලබන 12% ක දායක මුදලක් රාජ්‍ය සේවක අර්ථසාධක අරමුදල වෙත බැර වේ.

## නීති අංශය

විශ්‍රාම වැටුප් දෙපාර්තමේන්තුව සිය කාර්යයභාරය ඉටුකිරීමේදී නීතිපති දෙපාර්තමේන්තුව, මානව හිමිකම් කොමිසම, පාර්ලිමේන්තු කටයුතු පිළිබඳ කොමසාරිස් (ඔම්බුඩ්ස්මන්) කාර්යාලය හා විශ්‍රාම වැටුප් දෙපාර්තමේන්තුව වගඋත්තරකරු කරමින් උපරිමාධිකරණය ඇතුළු සියළු අධිකරණයන් වෙත ඉදිරිපත් කෙරෙන පැමිණිලි සම්බන්ධයෙන් කරුණු ඉදිරිපත් කරමින් සහ විශ්‍රාම වැටුප් ගෙවීමට අදාල සියළුම අණ පනත් පිළිබඳ අර්ථකථන හා නිර්දේශ ඉදිරිපත් කිරීමත් නිරීක්ෂණ ලබාදීමත් ආදී කටයුතු වෙනුවෙන් නීති අංශය ස්ථාපිත කර ඇත.

## අභ්‍යන්තර විගණන අංශය




දෙපාර්තමේන්තුවේ මුදල් කටයුතු පිළිබඳව පවත්නා අභ්‍යන්තර පාලන ක්‍රමය අධ්‍යයනය කිරීම තුළින් වැරදි හා වංචා වැළැක්වීමට සහ අනාවරණය කර ගැනීමට භාවිතා කරනු ලබන අභ්‍යන්තර සෝදිසියෙහි විධිමත් බව හා ක්‍රමවත් බව පිළිබඳව අඛණ්ඩව ස්වාධීන ඇගයීම පවත්වාගෙන යාම අභ්‍යන්තර විගණන අංශය මඟින් සිදු කරනු ලබයි.

## තොරතුරු තාක්ෂණ අංශය

විශ්‍රාම වැටුප් ගෙවීම් ක්‍රියාවලිය කාර්යක්ෂමව හා නිරවද්‍යව පවත්වාගෙන යාම සඳහා නිරන්තරයෙන් නව තොරතුරු තාක්ෂණ පද්ධති හඳුන්වා දෙමින් විශ්‍රාමික ප්‍රජාව, ප්‍රාදේශීය ලේකම් කාර්යාල සහ රාජ්‍ය ආයතන විශ්‍රාම වැටුප් දෙපාර්තමේන්තුව සමඟ සෘජුව සම්බන්ධීකරණය කිරීම මෙම අංශයෙන් සිදු කෙරේ.

## මාධ්‍ය අංශය



සියළුම පුවත්පත් පිළිබඳව අවධානය යොමු කර විශ්‍රාම වැටුප් විෂයට අදාල තොරතුරු රැස් කිරීම හා කළමනාකරණයේ අවධානයට එම තොරතුරු ඉදිරිපත් කිරීම මාධ්‍ය අංශයේ ප්‍රමුඛ කාර්යභාරය වේ. තවද තොරතුරු තාක්ෂණික සංවර්ධනය සමඟ තොරතුරු සන්නිවේදන කටයුතු නවීන තාක්ෂණික උපක්‍රම ඔස්සේ සිදුකිරීම දෙපාර්තමේන්තු මාධ්‍ය ඒකකය මගින් සිදුවේ. එහිදී නිල වෙබ් අඩවිය, නිල Facebook පිටුව, නිල youtube චැනලය, වෙබ් සඟරාව හා විශ්‍රාම රේඩියෝව යන මාධ්‍යයන් ඔස්සේ තොරතුරු යාවත්කාලීන කිරීම ද බාහිර මාධ්‍ය ආයතන වෙත තොරතුරු ලබාදීම ද මාධ්‍ය ඒකකය මගින් සිදු කෙරේ.

## තැපැල් අංශය

දෙපාර්තමේන්තුවේ ප්‍රධානතම අභ්‍යන්තර සන්නිවේදනය ක්‍රමය ලෙස තැපෑල හඳුන්වා දිය හැකි අතර එම කටයුතු මනාව සම්බන්ධීකරණය කිරීම මෙම අංශයෙන් සිදු කෙරේ. දෙපාර්තමේන්තුව වෙත ලැබෙන හා දෙපාර්තමේන්තුවෙන් පිටතට යැවෙන සියළුම ලිපි/ ලිපිගොනු නිවැරදිව හා කාර්යක්ෂමව අදාල අංශ/ආයතන වෙත යොමු කිරීම මෙම අංශයේ ප්‍රමුඛතම වගකීමයි.

## විශ්‍රාමික සංගම් පරිපාලනය සහ සම්බන්ධීකරණය

විශ්‍රාමික ප්‍රජාව නියෝජනය කරමින් විශ්‍රාමික සංගම් විසින් විශ්‍රාම වැටුප් දෙපාර්තමේන්තුව වෙත යොමු කරනු ලබන විශ්‍රාමික ගැටළු සම්බන්ධයෙන් ක්‍රියා කිරීම, නිසි විසඳුම් ලබාදීම සහ දෙපාර්තමේන්තුව හා විශ්‍රාමිකයින් අතර මනා සම්බන්ධතාවයක් පවත්වා පවත්වා ගැනීම අරමුණු කර ගනිමින් සඳහා එම කටයුතු සම්බන්ධීකරණය සඳහා වෙනම නිලධාරියෙකු අනුයුක්ත කර ඇත.

## ව්‍යාපාරික අංශ සම්බන්ධීකරණය

විශ්‍රාමිකයින් වෙත විශ්‍රාම වැටුපෙන් ඔබ්බට ගොස් ප්‍රතිලාභ ලබාදීම තුලින් ඔවුන් සක්‍රීය වැඩිහිටි ප්‍රජාවක් බවට පත්කිරීම අරමුණු කොට ගෙන විශ්‍රාම වැටුප් දෙපාර්තමේන්තුව විසින් රාජ්‍ය හා පෞද්ගලික ආයතන හා එක්ව විවිධ නව්‍යකරණ ව්‍යාපෘති ක්‍රියාත්මක කරමින් පවතී. ඒ සඳහා දෙපාර්තමේන්තුව හා පෞද්ගලික අංශය අතර මනා සම්බන්ධීකරණයක් පවත්වා ගැනීම මෙමගින් සිදු කෙරේ.

# 2

# ප්‍රගතිය හා ඉදිරි දැක්ම

# විශේෂ ව්‍යාපෘති

## විශ්‍රාමිකයින්ගේ ඇඟිලි සලකුණු ලබා ගැනීම.

- ✓ විශ්‍රාම වැටුප් ගෙවීම් ක්‍රියාවලියේදී විශ්‍රාම වැටුප්ලාභියා ජීවතුන් අතර සිටින බවට තහවුරු කර ගැනීම සඳහා සෑම වසරකම විශ්‍රාම වැටුප් දෙපාර්තමේන්තුව, විශ්‍රාමික ප්‍රජාවගෙන් ලබා ගන්නා ජීවිත සහතිකය නවීන තාක්ෂණික ක්‍රමෝපායන් සමඟ බද්ධ කරමින් ජෛවමිතික ක්‍රමවේදයට ලබා ගැනීම ආරම්භ කරන ලදී. එමගින් විශ්‍රාමික තොරතුරු සඳහන් ආකෘති පත්‍ර පිරවීමේ පැවති සංකීර්ණ ක්‍රමවේදය වෙනුවට ඇඟිලි සලකුණ භාවිතා කරමින් සිය ජීවිත සහතික ලබා දීමේ නව ක්‍රමය හරහා තමන්ට පහසු අවස්ථාවක විශ්‍රාමිකයින්ට පහසුකම් සලසා ඇති තමන් අයත් ප්‍රාදේශීය ලේකම් කාර්යාලයට හෝ මෙම පහසුකම සහිත වෙනත් ඕනෑම ප්‍රාදේශීය ලේකම් කාර්යාලයක් හෝ බැංකු ශාඛාවක් වෙත ගොස් තම ඇඟිලි සලකුණ තබා ජීවිත සහතිකය ලබා දීමේ පහසුකම ලබා දෙන ලදී.



රජ්‍ය පරිපාලන අමාත්‍යාංශ ලේකම්ගේ ප්‍රධානත්වයෙන් ඇඟිලි සලකුණු මගින් වාර්ෂික ජීවිත සහතික ලබා ගැනීම ආරම්භ කිරීම.



විශ්‍රාමිකයකු තම ඇඟිලි සලකුණ තබා ජීවිත සහතිකය ලබා දුන් අවස්ථාවක්

2020 වර්ෂයේදී ප්‍රාදේශීය ලේකම් කාර්යාල 26 ක් හරහා ඇඟිලි සලකුණ මගින් වාර්ෂික ජීවිත සහතිකය ලබා දීමට අවශ්‍ය පහසුකම් විශ්‍රාමිකයින් හට සැපයීම සිදු කරන ලදී. තවද දිවයින පුරා මහජන බැංකු ශාඛා 75ක්, පැන් ඒෂියා බැංකු ශාඛා 84 ක් සහ ජාතික ඉතිරිකිරීමේ බැංකු ශාඛා 10ක් හරහා විශ්‍රාමිකයින් හට ඇඟිලි සලකුණ මගින් වාර්ෂික ජීවිත සහතිකය ලබා ගැනීමට පහසුකම් සපයා ඇත.

## විශ්‍රාමිකයින් සඳහා නිවාඩු දුම්රිය ප්‍රවේශ පත්‍ර නිකුත් කිරීම සරල කිරීම.

- ✓ විශ්‍රාමික රාජ්‍ය නිලධාරීන්ට හිමි නිවාඩු දුම්රිය ප්‍රවේශ පත්‍ර ලබා ගැනීමේ දී මෙතෙක් පැවති ක්‍රමවේදය තවදුරටත් සරල හා පහසු කරමින් සෘජුවම දුම්රිය ස්ථානය වෙත සිය විශ්‍රාමික හැඳුනුම්පත හෝ ජාතික හැඳුනුම්පත ඉදිරිපත් කර නිවාඩු දුම්රිය ප්‍රවේශ පත්‍ර ලබා ගැනීමට ශ්‍රී ලංකා දුම්රිය දෙපාර්තමේන්තුව විශ්‍රාම වැටුප් දෙපාර්තමේන්තුව හා මොබිටෙල් ආයතනය ඒකාබද්ධව කටයුතු සලසා ඇත. එමගින් තත්පර කිහිපයක් තුළ මාර්ගගත ක්‍රමයට ප්‍රවේශපත්‍ර (ආසන වෙන් කර ගැනීම) ලබා ගැනීමේ හැකියාව ලැබේ.



විශ්‍රාමිකයින් සඳහා දුම්රිය ස්ථාන මගින් ප්‍රවේශ පත්‍ර නිකුත් කිරීම ආරම්භ කිරීම

## වැන්දඹු අනත්දරු ලියාපදිංචිය සරල කිරීම.

✓ විශ්‍රාම වැටුප් දෙපාර්තමේන්තුව මගින් කළමනාකරණය කරනු ලබන රාජ්‍ය සේවකයින්ගේ පසු ප්‍රතිලාභීන් සඳහා වන වැන්දඹු/ වැන්දඹු පුරුෂ අනත්දරු විශ්‍රාම වැටුප් ක්‍රමය යටතේ වැන්දඹු අනත්දරු විශ්‍රාම වැටුප් ගෙවීම් සක්‍රීය කිරීමේ ක්‍රියාවලිය තවදුරටත් සරල කරමින් වැන්දඹු අනත්දරු විශ්‍රාම වැටුප සක්‍රීය කිරීමට නව පද්ධතියක් හඳුන්වා දුන් අතර එම නව ක්‍රමවේදය පිළිබඳ අංක 03/2020 විශ්‍රාම වැටුප් චක්‍රලේඛය මගින් සියලුම ප්‍රාදේශීය ලේකම්වරුන් හා සියලුම රජයේ නිලධාරීන් වෙත උපදෙස් නිකුත් කර ඇත.




**වැන්දඹු අනත්දරු විශ්‍රාම වැටුප සක්‍රීය කිරීමේ නව මාර්ගගත දත්ත පද්ධතිය පිළිබඳ ප්‍රාදේශීය ලේකම්වරුන් දැනුවත් කිරීම**

## ආබාධිත දරුවන්ගේ විශ්‍රාම වැටුප් අයිතිය තහවුරු කිරීම.




✓ ආබාධිත දරුවන් වෙත ආබාධිත විශ්‍රාම වැටුප් හිමිකම ලබාදීමේදී මෙතෙක් පැවති ක්‍රමවේදය අනුව ආබාධිත තත්ත්වය තහවුරු කිරීමේ වෛද්‍ය මණ්ඩලයට යොමු කිරීම සිදු වූයේ ආබාධිත දරුවාගේ දෙමාපියන් මිය යෑමෙන් අනතුරුවය. මේ හේතුවෙන් බොහෝ ආබාධිත දරුවන් ආබාධිත විශ්‍රාම වැටුප් ලබා ගැනීමේදී බොහෝ දුෂ්කරතාවන්ට හා ප්‍රමාදයන්ට මුහුණ දෙන ලදී. එම තත්ත්වය වෙනස් කර රාජ්‍ය නිලධාරියෙකුට ආබාධිත දරුවෙකු වේ නම් සේවයේ යෙදී සිටියදීම තම ආයතන ප්‍රධානියා මගින් ඉල්ලීමක් වෛද්‍ය මණ්ඩලයට ඉදිරිපත් කර දරුවාගේ ආබාධිත තත්ත්වය සනාථ කර තැබීමට අවස්ථාව සලසා දීමට නව රෙගුලාසි බලගන්වන ලදී.



- විශ්‍රාම ගන්නා දිනයටම විශ්‍රාම වැටුප් ප්‍රතිලාභ හිමිගැන්වීමේ අරමුණින් රජයේ නිලධාරීන් විශ්‍රාම ගැනීමට ආසන්න වන විට දුරකථන කෙටි පණිවුඩ සේවාව මගින් දැනුවත් කිරීමේ පහසුකම් ආරම්භ කර ඇත. දැනට රාජ්‍ය සේවයේ නියුතු නිලධාරීන් ලක්ෂ හයකට ආසන්න පිරිසක් වැන්දඹු අනත්දරු ලියාපදිංචි කිරීම් පද්ධතිය තුල ලියාපදිංචි ඇති බැවින් එම තොරතුරු භාවිතා කර විශ්‍රාම ගැනීමට අපේක්ෂිත නිලධාරීන් සඳහා විශ්‍රාම ගැනීමේ දිනයට මාස 6කට පෙර විශ්‍රාම වැටුප් ලබා ගැනීමට අත්‍යවශ්‍ය වන පෞද්ගලික ලිපිගොනුව යාවත්කාලීන කර ගනිමින් විශ්‍රාම ගැනීමට සූදානම්වීම සඳහා දැනුවත් කිරීම ආරම්භ කරනු ලැබිණි.

- විශ්‍රාමික තොරතුරු තහවුරු කර ගැනීම සඳහා මැතිවරණ දෙපාර්තමේන්තුවේ දත්ත හුවමාරු කර ගැනීමට එකඟතාවය ලබා ගෙන, ජාලගත සේවා සම්බන්ධතාවයක් තුලින් විශ්‍රාම වැටුප් කළමනාකරණ දත්ත පද්ධතිය හා සම්බන්ධ කර ඇත. එමගින් රාජ්‍ය නිලධාරියෙකු විශ්‍රාම යන අවස්ථාවේදී එම පුද්ගලයාගේ පදිංචිය පිළිබඳ විස්තර තහවුරු කර ගැනීමට අවශ්‍ය පහසුකම් සලසා ගෙන ඇත.



- යුදමය වාතාවරණය පැවති වකවානුවේ ක්‍රියාන්විත ප්‍රදේශවල හා ක්‍රියාන්විත ප්‍රදේශ ලෙස නම් නොකරන ලද ප්‍රදේශවල රාජකාරියේ යෙදී සිටියදී සෘජුවම ත්‍රස්ත ක්‍රියා හේතුවෙන් හෝ ත්‍රස්ත ක්‍රියා මැඩපැවැත්වීම උදෙසා සිදු කරන ලද ක්‍රියා හේතුවෙන් ආබාධිත වූ හා මියගිය ත්‍රිවිධ හමුදා සහ පොලිසියේ සාමාජිකයින් සඳහා ඔවුන්ගේ වයස අවු 55 සම්පූර්ණ වන තෙක් ගෙවන ලද වැටුප් හා දීමනා, මිය ගිය සාමාජිකයාගේ යැපෙන්නන් ජීවත්ව සිටින තෙක් සහ ආබාධිත සාමාජිකයා ජීවත්ව සිටින තෙක් ලබාදීම සම්බන්ධ තොරතුරු ඇතුළත් මාර්ගගත පද්ධතියක් නිර්මාණය කරන ලදී.

- විශ්‍රාම වැටුප් හිමි නමුත් ප්‍රතිලාභ ලබාගැනීම සඳහා පැමිණීමට අපහසු විශ්‍රාමිකයින් හට එවැනි අවස්ථාවකදී භාරකරුවෙකු පත් කර විධිමත් ලෙස විශ්‍රාම වැටුප් ලබා ගැනීම සඳහා වන ක්‍රමවේදය සම්බන්ධයෙන් විශ්‍රාම වැටුප් චක්‍රලේඛ අංක 07/2020 මගින් විධිවිධාන සපයා ඇත.

- විශ්‍රාම වැටුප් අයදුම්පත් හා ආශ්‍රිත ලිපි ලේඛණ සම්පූර්ණයෙන්ම මාර්ගගත (Online) ක්‍රමය ඔස්සේ යොමු කිරීමට හැකිවන සේ විශ්‍රාම වැටුප් කළමනාකරණ පද්ධතිය යාවත්කාලීන කරන ලදී.

- විශ්‍රාම ගනු ලබන නිලධරයන්ගේ ප්‍රතිලාභ ප්‍රමාදයකින් තොරව ලබා දීම තහවුරු කිරීම සඳහා නිලධාරීන්ගේ සම්පූර්ණ සේවා කාලය තුළ වැන්දඹු/ වැන්දඹු පුරුෂ හා අනත්දරු දායක මුදල් අයකිරීම සම්බන්ධයෙන් හා වාර්තා කිරීම සම්බන්ධයෙන් ගත යුතු ක්‍රියාමාර්ග හා ඒ පිළිබඳ විස්තර පෞද්ගලික ලිපි ගොනුවට ඇතුළත් කිරීම පිළිබඳ මාර්ගෝපදේශ ඇතුළත් කරමින් 2020.12.31 දින අංක 03/2020 රාජ්‍ය පරිපාලන චක්‍රලේඛය නිකුත් කර ඇත.



- විශ්‍රාම වැටුප් දෙපාර්තමේන්තුවේ ස්වර්ණ ජයන්තිය හා 2020 ජාතික විශ්‍රාම දින සැමරුමට සමගාමීව විශ්‍රාම වැටුප් ගෙවීමට අදාල වැදගත් තොරතුරු මෙන්ම අනාගතයේ සියලුම රැකියා නියුක්තිකයින් ආවරණය කරමින් සිදුකිරීමට සලකා බැලිය හැකි සමාජ ආරක්ෂණ ක්‍රමවේදයන් ද ඇතුලත් "ශ්‍රී ලංකා විශ්‍රාම" ග්‍රන්ථය එළි දැක්වීම සහ දිනමිණ හා තිනකරන් පුවත්පත්හි පරපුරක අභිමානය නමින් පුවත්පත් අතිරේකයක් නිකුත් කිරීම. එය රාජ්‍ය සේවා, පළාත් සභා සහ පළාත් පාලන අමාත්‍යතුමාගේ ප්‍රදානත්වයෙන් සිදු විය.



ශ්‍රී ලංකා විශ්‍රාම ග්‍රන්ථය එළි දැක්වීම.



පරපුරක අභිමානය නමින් පුවත්පත් අතිරේකයක් නිකුත් කිරීම.

- විශ්‍රාම වැටුප් දෙපාර්තමේන්තුවට වසර 50ක් සපිරීම නිමිත්තෙන් තැපැල් දෙපාර්තමේන්තුව සමඟ සහයෝගීත්වයෙන් ස්වර්ණ ජයන්ති සැමරුම් මුද්දරයක් සහිත මුල්දින කවරයක් නිකුත් කිරීම.




ස්වර්ණ ජයන්ති සැමරුම් මුද්දරය



ස්වර්ණ ජයන්ති සැමරුම් මුද්දරය සහිත මුල්දින කවරය



දෙපාර්තමේන්තුවට වසර 50ක් සපිරීම නිමිත්තෙන් සැමරුම් මුද්දරයක් සහිත මුල්දින කවරයක් නිකුත් කිරීම.

- විශ්‍රාම වැටුප් දෙපාර්තමේන්තුවේ සමාජ ආරක්ෂණ යෝජනාවලිය "සැමට විශ්‍රාම" නමින් ඉදිරිපත් කිරීම.

සෞභාග්‍යයේ දැක්ම ප්‍රතිපත්ති ප්‍රකාශය මගින් ශ්‍රී ලංකාවේ දැනට පවතින විශ්‍රාම වැටුප් ක්‍රම හා සමාජ ආරක්ෂණ ක්‍රම වැඩිදියුණු කිරීම සඳහා ඉතා වැදගත් ප්‍රතිපත්ති යෝජනා ගණනාවක් ඉදිරිපත් කර ඇත. ඒ යටතේ දැනට ක්‍රියාත්මක රාජ්‍ය සේවා විශ්‍රාම වැටුප් ක්‍රමය සුරක්ෂිත කිරීම, රාජ්‍ය හා පෞද්ගලික අංශ දෙකෙහි ම විශ්‍රාම ගැන්වීමේ වයස විද්‍යාත්මක පදනමක් මත තීරණය කිරීම, පෞද්ගලික අංශයේ ශ්‍රමිකයින් විදේශගත ශ්‍රමිකයින් ඇතුළු රටේ සෑම පුරවැසියෙකුම ආවරණය වන පරිදි විශ්‍රාම වැටුප් ක්‍රම හඳුන්වා දීමට යෝජනා කර ඇත.



## 2020 වර්ෂයේ නිකුත් කරන ලද චක්‍රලේඛ

| | නිකුත් කල දිනය | චක්‍රලේඛ අංකය | කාරණය |
|---|---|---|---|
| 1 | 2020.01.08 | 1/2020 | විශ්‍රාමික රජයේ නිලධාරීන් නැවත සේවයේ යෙදවීම හා විශ්‍රාම වැටුප් ප්‍රතිශෝධනය කිරීම |
| 2 | 2020.01.21 | 2/2020 | විශ්‍රාමික ජීවත්වීමේ සහතිකය ඇඟිලි සලකුණු මාර්ගයෙන් තහවුරු කර ගැනීම - නියාමක ව්‍යාපෘතිය |
| 3 | 2020.02.10 | 2/2020 (I) | විශ්‍රාමික ජීවත්වීමේ සහතිකය ඇඟිලි සලකුණු මාර්ගයෙන් තහවුරු කර ගැනීම - නියාමක ව්‍යාපෘතිය |
| 4 | 2020.02.25 | 3/2020 | වැන්දඹු/ වැන්දඹු පුරුෂ/ අනත්දරු/ ආබාධිත අනත්දරු විශ්‍රාම වැටුප් අයදුම්පත් මාර්ගගත ක්‍රමවේදය ඔස්සේ යොමු කිරීම |
| 5 | 2020.04.02 | 4/2020 | කොරෝනා වෛරස් තත්ත්වය හේතුවෙන් නියමිත දිනට විශ්‍රාම ගැන්වීමට නොහැකි වූ හා විශ්‍රාම ගන්වා ඇති නමුදු මාර්ගගත ක්‍රමය (Online) ඔස්සේ අයදුම්පත යොමු කිරීමට නොහැකි වූ එහෙත් විශ්‍රාම වැටුප සඳහා හිමිකම ලබන රජයේ නිලධාරීන්ට/ විශ්‍රාමිකයන්ට සහන සැලසීම |
| 6 | 2020.04.06 | 4/2020 (i) | කොරෝනා වෛරස් තත්ත්වය හේතුවෙන් නියමිත දිනට විශ්‍රාම ගැන්වීමට නොහැකි වූ හා විශ්‍රාම ගන්වා ඇති නමුදු මාර්ගගත ක්‍රමය (Online) ඔස්සේ අයදුම්පත යොමු කිරීමට නොහැකි වූ එහෙත් විශ්‍රාම වැටුප සඳහා හිමිකම ලබන රජයේ නිලධාරීන්ට/ විශ්‍රාමිකයන්ට සහන සැලසීම |
| 7 | 2020.04.20 | 4/2020 (ii) | කොරෝනා වෛරස් තත්ත්වය හේතුවෙන් නියමිත දිනට විශ්‍රාම ගැන්වීමට නොහැකි වූ හා විශ්‍රාම ගන්වා ඇති නමුදු මාර්ගගත ක්‍රමය (Online) ඔස්සේ අයදුම්පත යොමු කිරීමට නොහැකි වූ එහෙත් විශ්‍රාම වැටුප සඳහා හිමිකම ලබන රජයේ නිලධාරීන්ට/ විශ්‍රාමිකයන්ට සහන සැලසීම |
| 8 | 2020.04.29 | 4/2020 (iii) | කොරෝනා වෛරස් තත්ත්වය හේතුවෙන් නියමිත දිනට විශ්‍රාම ගැන්වීමට නොහැකි වූ හා විශ්‍රාම ගන්වා ඇති නමුදු මාර්ගගත ක්‍රමය (Online) ඔස්සේ අයදුම්පත යොමු කිරීමට නොහැකි වූ එහෙත් විශ්‍රාම වැටුප සඳහා හිමිකම ලබන රජයේ නිලධාරීන්ට/ විශ්‍රාමිකයන්ට සහන සැලසීම |
| 9 | 2020.05.22 | 4/2020 (iv) | කොරෝනා වෛරස් තත්ත්වය හේතුවෙන් නියමිත දිනට විශ්‍රාම ගැන්වීමට නොහැකි වූ හා විශ්‍රාම ගන්වා ඇති නමුදු මාර්ගගත ක්‍රමය (Online) ඔස්සේ අයදුම්පත යොමු කිරීමට නොහැකි වූ එහෙත් විශ්‍රාම වැටුප සඳහා හිමිකම ලබන රජයේ නිලධාරීන්ට/ විශ්‍රාමිකයන්ට සහන සැලසීම |
| 10 | 2020.04.20 | 5/2020 | ගෝලීය කොරෝනා වෛරස් තත්ත්වය තුල නිවසේ සිට රාජකාරි කටයුතු ඉටු කිරීමේ වැඩපිළිවෙළක් (WFH) මගින් රජයේ සේවාවන් සැපයීම |
| 11 | 2020.06.09 | 6/2020 | ගෝලීය කොරෝනා වෛරස් තත්ත්වය තුල නිවසේ සිට රාජකාරි කටයුතු ඉටු කිරීමේ වැඩපිළිවෙළක් (WFH) මගින් රජයේ සේවාවන් සැපයීම |

| | | | |
|---|---|---|---|
| 12 | 2020.06.11 | 7/2020 | විශ්‍රාම වැටුප් ලබන අයෙකුට විශ්‍රාම වැටුප් ලබා ගැනීමට පැමිණීම අපහසු වන අවස්ථාවක භාරකරුවෙකු පත් කිරීම පිළිබඳ ගිවිසුම |
| 13 | 2020.06.11 | 8/2020 | විශ්‍රාමික ප්‍රජාවගේ ප්‍රවර්ධනය සඳහා ණය පහසුකම් සැපයීම විධිමත් කිරීම |
| 14 | 2020.09.22 | 2/2020 (ii) | විශ්‍රාමික ජීවත්වීමේ සහතිකය ඇඟිලි සලකුණු මාර්ගයෙන් තහවුරු කර ගැනීම - නියාමක ව්‍යාපෘතිය |
| 15 | 2020.07.30 | 2/2017 (i) | රාජ්‍ය සේවා අර්ථසාධක අරමුදල් ක්‍රමය යටතේ ලියාපදිංචි සහ ලියාපදිංචි සාමාජිකයන්ගේ දායක මුදල් විස්තර යාවත්කාලීන කිරීම අන්තර්ජාලය හරහා සිදු කිරීම |
| 16 | 2020.09.22 | 2/2020 (iii) | විශ්‍රාමික ජීවත්වීමේ සහතිකය ඇඟිලි සලකුණු මාර්ගයෙන් තහවුරු කර ගැනීම - නියාමක ව්‍යාපෘතිය |
| 17 | 2020.11.30 | 3/2015 (iv) | විශ්‍රාම ගනු ලබන දිනටම විශ්‍රාම වැටුප් ප්‍රතිලාභ ලබා දීම (විශ්‍රාම වැටුප් අයදුම්පත් මාර්ගගතව (Online) යොමුකිරීම) |
| 18 | 2020.12.02 | 1/2009 (i) | ආබාධිත අනත්දරු විශ්‍රාම වැටුප් ගෙවීම |
| 19 | 2020.12.05 | 9/2020 | 2021 වර්ෂයේ විශ්‍රාම වැටුප් ගෙවීම |
| 20 | 2020.12.08 | 10/2020 | පරිපූරක උත්සව ණය යෝජනා ක්‍රමය |

## 2020 වර්ෂයේ නිකුත් කර ඇති උපදෙස් ලිපි

| | නිකුත් කල දිනය | උපදෙස් ලිපි අංකය | කාරණය |
|---|---|---|---|
| 01 | 2020.06.17 | 01/2020 | විශ්‍රාම ගන්නා සන්නද්ධ සේවා නිලධාරීන්ගේ සේවා විශ්‍රාම වැටුප් සංශෝධනය කිරීමේ ක්‍රියාවලිය විධිමත් කිරීම |
| 02 | 2020.07.13 | 02/2020 | විශ්‍රාමිකයන්ගේ තොරතුරු පිටතට ලබා නොදීම. |
| 03 | 2020.12.03 | විවැ/දි.ස/ජී.ස/2021 | විශ්‍රාමික පදිංචි සහතිකය 2021. |
| 04 | 2020.11.23 | PEN/ADG/2020/DS | විශ්‍රාම වැටුප් ලිපිගොනු නොමැති විශ්‍රාමිකයන් සඳහා විශ්‍රාම වැටුප් සංශෝධනය. |
| 05 | 2020.12.21 | 12/2020 | 2021 වර්ෂය සඳහා විදේශයන්හි වසර දෙකකට වඩා වාසය කරන ශ්‍රී ලාංකික විශ්‍රාමිකයන්ගේ වාර්ෂික ජීවිත සහතික ලබා දීම. |
| 06 | 2020.12.21 | PEN/POL/1A/special | පරිපූරක උත්සව ණය යෝජනා ක්‍රමය - බැංකු සඳහා උපදෙස් |


## 2020 වර්ෂයේදී ඉටු කරන ලද කාර්යයන් පිළිබඳ වාර්තාව


### නීති අංශය

| ගොණු හා ලිපි වර්ගය | ප්‍රමාණය | නිරීක්ෂණ ලබා දී ඇති ප්‍රමාණය | උපදේශණ සඳහා සහභාගි වූ ප්‍රමාණය | අවසන් කිරීමට ඇති ප්‍රමාණය |
|---|---|---|---|---|
| මානව හිමිකම් පැමිණිලි | 46 | 46 | - | - |
| මානව හිමිකම් සිතාසි | 20 | 20 | 20 | 05 |
| ඔම්බුඩ්ස්මන් පැමිණිලි | 102 | 100 | - | 02 |
| වෙනත් ලිපි | 50 | 50 | - | - |
| ශ්‍රේෂ්ඨාධිකරණ නඩු | 04 | 04 | - | නඩු 03 ක් සඳහා තීන්දු ලැබී නැත |
| අභියාචනාධිකරණ නඩු | 06 | 03 | 03 | තීන්දු ලැබී නැත |
| පළාත්බද මහාධිකරණ නඩු | 02 | 02 | 01 | තීන්දු ලැබී නැත |
| නීතිපති දෙපාර්තමේන්තු උපදෙස් සඳහා ගොනු | 06 | - | - | - |
| ආයතන සමඟ ඇති කරගත් ගිවිසුම් | 05 | - | - | - |
| වෙනත් අංශ වලින් නිරීක්ෂණ සඳහා ලැබෙන ගොනු | 28 | 28 | - | - |
| **එකතුව** | **269** | **253** | **24** | |

ඉහත කාර්යභාරයන්ට අනුකූලව අධිකරණ සහ අනෙකුත් අදාල ආයතන සමඟ උපදේශන සඳහා සහභාගීවීම් හා නිරීක්ෂණ ලබාදී ඇති ප්‍රමාණය 260ක් පමණ වන අතර රාජ්‍ය සහ පෞද්ගලික ආයතන සමඟ ඇතිකරගත් ගිවිසුම් සංඛ්‍යාව 11කි.

# 2020 වර්ෂයේ මාසික විශ්‍රාම වැටුප් ගෙවීම් සාරාංශය




## 2020 වර්ෂයේ දී විශ්‍රාම වැටුප් දෙපාර්තමේන්තුව විසින් සිදු කරනු ලැබූ විශ්‍රාම වැටුප් වෙනස් කිරීම් සහ සකස් කිරීම්

2020 වර්ෂයේ දී

- පුද්ගල තොරතුරු යාවත්කාලීන කිරීම **23,955**
- සංශෝධන නැවත ගණනය කිරීම (14/2019) **749**
- හමුදා දුබලතා දීමනාව **905**
- විශ්‍රාම ගැනීමෙන් පසු වැටුප් වෙනස් කිරීම් **2,983**
- හමුදා දුබලතා 55 සම්පූර්ණ කිරීම **277**
- වෙනත් හිඟ ගෙවීම් හා සංශෝධන **3,146**
- දත්ත සැකසීම් හේතුවෙන් විශ්‍රාම වැටුප් ආරම්භ කිරීම ප්‍රමාද වූ විශ්‍රාම වැටුප් හිඟ ගෙවීම **271**
- දේශපාලන හිංසනය සලකා බලා විශ්‍රාම වැටුප් සංශෝධනය **267**

## 2020 වර්ෂයේ මාසිකව ගෙවීම් කරන ලද සිවිල් සහ හමුදා වැන්දඹු හා අනත්දරු විශ්‍රාම වැටුප් ගණන

| මාසය | සමස්ථ සක්‍රීය විශ්‍රාමිකයින් ගණන | | |
|---|---|---|---|
| | සිවිල් සහ හමුදා | වැන්දඹු හා අනත්දරු | එකතුව |
| ජනවාරි | 456,499 | 183,803 | 640,302 |
| පෙබරවාරි | 457,689 | 183,827 | 641,516 |
| මාර්තු | 459,308 | 184,108 | 643,416 |
| අප්‍රේල් | 461,034 | 184,145 | 645,179 |
| මැයි | 460,851 | 184,052 | 644,903 |
| ජූනි | 460,978 | 183,674 | 644,652 |
| ජූලි | 461,255 | 183,953 | 645,208 |
| අගෝස්තු | 464,715 | 184,472 | 649,187 |
| සැප්තැම්බර් | 466,398 | 184,722 | 651,120 |
| ඔක්තෝබර් | 468,214 | 184,746 | 652,960 |
| නොවැම්බර් | 474,369 | 184,797 | 659,166 |
| දෙසැම්බර් | 475,889 | 185,045 | 660,934 |

## 2020 වර්ෂයේ මාසිකව සක්‍රිය කරන ලද නව විශ්‍රාම වැටුප් ගණන හා ඒ සඳහා වැය වු මුදල

| මාසය | සිවිල් | | වැ.අ.වි.වැ | | හමුදා | |
|---|---|---|---|---|---|---|
| | විශ්‍රාමිකයින් ගණන | ගෙවන ලද මුදල (රු) | විශ්‍රාමිකයින් ගණන | ගෙවන ලද මුදල (රු) | විශ්‍රාමිකයින් ගණන | ගෙවන ලද මුදල (රු) |
| ජනවාරි | 741 | 123,607,248 | 652 | 114,815,872 | 456 | 102,960,149 |
| පෙබරවාරි | 1,456 | 278,582,765 | 781 | 145,532,883 | 998 | 270,442,847 |
| මාර්තු | 1,520 | 299,656,311 | 866 | 181,905,044 | 958 | 242,808,123 |
| අප්‍රේල් | 1,536 | 63,400,389 | 405 | 11,484,135 | 778 | 37,862,158 |
| මැයි | 519 | 99,309,464 | 384 | 58,444,848 | 109 | 37,539,096 |
| ජුනි | 659 | 136,270,138 | 287 | 55,884,845 | 498 | 115,621,097 |
| ජුලි | 851 | 236,600,311 | 839 | 195,502,312 | 657 | 215,206,143 |
| අගෝස්තු | 2,965 | 843,325,138 | 1080 | 212,385,780 | 1585 | 548,120,242 |
| සැප්තැම්බර් | 1,461 | 294,404,053 | 841 | 176,479,702 | 1111 | 266,512,894 |
| ඔක්තෝබර් | 1,924 | 506,934,716 | 648 | 151,113,354 | 869 | 251,051,492 |
| නොවැම්බර් | 5,913 | 738,573,125 | 585 | 96,785,722 | 1506 | 359,759,175 |
| දෙසැම්බර් | 1,704 | 201,165,605 | 750 | 174,669,967 | 832 | 205,888,678 |
| **එකතුව** | **21,249** | **3,821,829,263** | **8,118** | **1,575,004,464** | **10,357** | **2,653,772,092** |

## වාර්ෂික විශ්‍රාම වැටුප් වියදම

| වර්ෂය | වියදම<br>රු.බිලියන |
|---|---|
| 2016 | 164,028,280,464.60 |
| 2017 | 172,709,060,986.55 |
| 2018 | 182,014,784,493.07 |
| 2019 | 202,642,744,941.95 |
| 2020 | 229,080,763,894.39 |

## සක්‍රිය සේවයේ යෙදී සිටියදී ජීවිතක්ෂයට හෝ බෙලහීනතාවයට පත් ත්‍රිවිධ හමුදා හා පොලිස් සේවා සාමාජිකයන්ට වන්දි වැටුප් හා දීමනා ගෙවීම් - 2020

| ආයතනය | 2020 දෙසැම්බර් දක්වා | |
|---|---|---|
| | සංඛ්‍යාව | ගෙවූ මුදල<br>රු.බිලියන |
| යුද්ධ හමුදා | 36,814 | 33.36 |
| නාවික හමුදා | 1,469 | 1.37 |
| ගුවන් හමුදා | 578 | 0.57 |
| පොලිස් | 2,043 | 2.16 |
| **එකතුව** | **40,904** | **37.46** |

## පාරිතෝෂික ගෙවීම් - 2020

| පාරිතෝෂික වර්ගය | ගෙවූ සංඛ්‍යාව | ගෙවූ මුදල (රු.) |
|---|---|---|
| සිවිල්, සන්නද්ධ සේවා හා මධ්‍යගත | 25,520 | 27,408,501,019 |
| හමුදා | 29 | 5,057,963 |
| මරණ | 1103 | 632,808,553 |
| සංශෝධන | 3105 | 156,868,686 |
| වෙනත්* | 1,333 | 803,014,264 |
| **එකතුව** | **31,090** | **29,006,250,484** |

*විශේෂ වන්දි, සේවා පාරිතෝෂික, සේවා පාරිතෝෂික මරණ (17), නැවත සේවයේ පාරිතෝෂික ගෙවීම

## වැන්දඹු අනත්දරු විශ්‍රාම වැටුප් ප්‍රතිලාභ ගෙවීම් -2020

| මාසය | වැන්දඹු විශ්‍රාම වැටුප් | අනත්දරු විශ්‍රාම වැටුප් | ආබාධිත විශ්‍රාම වැටුප් | වෙනත් |
|---|---|---|---|---|
| ජනවාරි | 572 | 32 | 24 | 24 |
| පෙබරවාරි | 722 | 16 | 16 | 27 |
| මාර්තු | 743 | 50 | 35 | 38 |
| අප්‍රේල් | 385 | 12 | 3 | 5 |
| මැයි | 347 | 13 | 17 | 7 |
| ජුනි | 235 | 18 | 5 | 29 |
| ජුලි | 723 | 48 | 17 | 51 |
| අගෝස්තු | 945 | 39 | 34 | 62 |
| සැප්තැම්බර් | 747 | 35 | 32 | 27 |
| ඔක්තෝබර් | 543 | 44 | 35 | 26 |
| නොවැම්බර් | 553 | 18 | 1 | 13 |
| දෙසැම්බර් | 646 | 50 | 22 | 32 |
| **එකතුව** | **7,161** | **375** | **241** | **341** |

## වැන්දඹු හා අනත්දරු ක්‍රමයේ ලියාපදිංචිය

➢ 2020 වර්ෂයේ වැන්දඹු/ වැන්දඹු පුරුෂ හා අනත්දරු සාමාජික ක්‍රමයේ ලියාපදිංචි වීම සඳහා ලැබී ඇති අයදුම්පත්‍ර වලින් අයදුම්පත්‍ර 29513 ක් සඳහා වැන්දඹු/ වැන්දඹු පුරුෂ හා අනත්දරු සාමාජික අංක නිකුත් කර ඇත.

## වැන්දඹු අනත්දරු දායක මුදල් ආපසු ගෙවීම් -2020

| | සිවිල් | හමුදා | පොදු 29 |
|---|---|---|---|
| 2019.12.31 ශේෂය | 197 | 0 | 388 |
| අයදුම්පත් ලැබීම් | 1472 | 983 | 29 |
| අයදුම්පත් ගෙවීම් | 914 | 973 | 31 |
| අයදුම්පත් ආපසු යැවීම් | 468 | 10 | 281 |
| **2020.12.31 ශේෂය** | **287** | **0** | **105** |

## සන්නද්ධ සේවා අංශයෙන් මධ්‍යම දත්ත පද්ධතියට එකතු කල විශ්‍රාම වැටුප් ප්‍රමාණ

| විශ්‍රාම වැටුප් වර්ගය | ගෙවූ සංඛ්‍යාව (යුද්ධ/ගුවන්/නාවික) |
|---|---|
| සේවා විශ්‍රාම වැටුප් ගෙවීම් (10/ 12ට අඩු) | 353 |
| දුබලතා ප්‍රථම ගෙවීම් | 778 |
| හමුදා සංශෝධන | 2101 |
| ප්‍රතිශෝධන | 346 |
| මරණ පාරිතෝෂික | 135 |
| සේවා පාරිතෝෂික | 980 |
| යැපීම් දීමනා | 207 |
| ප්‍රතිශෝධන (10/ 12ට අඩු) | 103 |

## විශ්‍රාම වැටුප් ගෙවූ විදෙස්ගත විශ්‍රාමිකයින්ගේ විස්තර

| මාසය | විශ්‍රාමිකයින් ගණන | ගෙවූ මුදල (රු) |
|---|---|---|
| ජනවාරි | 9780 | 250,090,365 |
| පෙබරවාරි | 9815 | 244,680,271 |
| මාර්තු | 9845 | 302,211,723 |
| අප්‍රේල් | 9855 | 225,587,117 |
| මැයි | 9869 | 309,333,207 |
| ජූනි | 9870 | 256,158,297 |
| ජූලි | 9869 | 305,759,867 |
| අගෝස්තු | 9881 | 261,062,289 |
| සැප්තැම්බර් | 9880 | 442,883,616 |
| ඔක්තෝබර් | 9857 | 308,134,677 |
| නොවැම්බර් | 9872 | 264,001,770 |
| දෙසැම්බර් | 9865 | 264,248,148 |
| **එකතුව** | | **3,434,151,347** |

## රාජ්‍ය සේවා අර්ථසාධක අරමුදලේ ලැබීම් හා ගෙවීම් (8% +12%) - 2020

| මාසය | ලැබීම් රු | ගෙවීම් රු |
|---|---|---|
| ජනවාරි | 77,355,694 | 33,971,631 |
| පෙබරවාරි | 71,472,673 | 23,099,709 |
| මාර්තු | 30,360,619 | 31,988,316 |
| අප්‍රේල් | 7,410,912 | 3,027,355 |
| මැයි | 44,858,950 | 19,336,686 |
| ජූනි | 76,308,381 | 24,767,386 |
| ජූලි | 213,487,273 | 19,421,915 |
| අගෝස්තු | 80,342,063 | 29,346,143 |
| සැප්තැම්බර් | 132,460,293 | 58,190,680 |
| ඔක්තෝබර් | 40,056,422 | 35,506,612 |
| නොවැම්බර් | 13,138,810 | 18,188,702 |
| දෙසැම්බර් | 61,457,155 | 45,170,288 |
| **එකතුව** | **848,709,245** | **342,015,423** |

## සාමාජිකත්ව විශ්ලේෂණය

| මාසය | ඉවත් වූ සාමාජික සංඛ්‍යාව | අලුතින් එකතු වූ සාමාජික සංඛ්‍යාව |
|---|---|---|
| ජනවාරි | 793 | 728 |
| පෙබරවාරි | 450 | 732 |
| මාර්තු | 141 | 1,083 |
| අප්‍රේල් | 84 | 76 |
| මැයි | 111 | 232 |
| ජූනි | 219 | 1,142 |
| ජූලි | 303 | 472 |
| අගෝස්තු | 400 | 773 |
| සැප්තැම්බර් | 452 | 1,084 |
| ඔක්තෝබර් | 129 | 763 |
| නොවැම්බර් | 214 | 581 |
| දෙසැම්බර් | 285 | 460 |
| **එකතුව** | **3,581** | **8,126** |

| | | |
|---|---|---|
| 2019.12.31 දිනට සාමාජික සංඛ්‍යාව | - | 231,339 |
| එකතු කලා – අලුතින් එකතු වූ සාමාජික සංඛ්‍යාව | - | 8126 |
| | | 239,465 |
| අඩු කලා - ඉවත් වූ සාමාජික සංඛ්‍යාව | - | 3,581 |
| **2020.12.31 දිනට සාමාජික සංඛ්‍යාව** | - | **235,884** |

## භෞතික වැඩිදියුණු කිරීම්

දෙපාර්තමේන්තු නිලධාරීන්ගෙන් වඩාත් ඵලදායී සේවාවක් ලබා ගැනීමේ අරමුණින්, රාජකාරි පරිසරය නවීකරණය කිරීම තුළ රාජකාරී කටයුතු සිදු කිරීමට යහපත් වටපිටාවක් ඇති කිරීම සඳහා කාර්යාල පරිශ්‍රය නවීකරණය කරන ලදී.

මේ යටතේ පහත නවීකරණයන් සිදු කරන ලදී,

- වැන්දඹු අනත්දරු විශ්‍රාම වැටුප් අංශයේ හා අභ්‍යන්තර පඩිපෙලෙහි තීන්ත ආලේප කිරීමට කටයුතු කිරීම.
- සිව්වන මහලේ මාසික ගෙවීම් අංශය හා රියදුරු කාමරය වායුසමීකරණය කිරීම.
- භෝජනාගාරය අසල මෝටර් රථ දෙපාර්තමේන්තුව පිහිටි පෙදෙසේ ආවරණය නොවූ කොටස ආවරණය කරමින් වැටක් නිර්මාණය කිරීම.
- දෙපාර්තමේන්තුවේ ආරක්ෂක නිලධාරීන් රාජකාරී කටයුතු සිදු කරන ආරක්ෂක මුර කුටිය අළුත්වැඩියා කිරීම.
- අනුරාධපුර නුවරගම් පළාත, මහනුවර කඩවත්සතර සහ ගඟවටකෝරලය හා යටිනුවර යන ප්‍රාදේශීය ලේකම් කාර්යාලයන්හි විශ්‍රාම වැටුප් අංශ හා ලේඛනාගාර නවීකරණය කිරීම.
- කැළණිය වෙදමුල්ල නිවාඩු නිකේතනයේ දෙමහල් ගොඩනැගිල්ලේ තීන්ත ආලේප කිරීම හා නවීකරණය කිරීම.

## අභියෝග


- කොවිඩ් 19 ගෝලීය කොරෝනා වසංගත තත්ත්වය හේතුවෙන් දිවයින පුරා නිරෝධායන ඇඳිරිනීතිය ක්‍රියාත්මක කිරීම සහ දෙපාර්තමේන්තු පරිශ්‍රය හුදෙකලා ප්‍රදේශයක් බවට නම් කර ඇති කාලවකවානුව තුලදී සෞඛ්‍ය උපදෙස්වලට අනුගත වෙමින් සීමිත නිලධාරීන් පිරිසකගේ සහභාගිත්වයෙන් දෙපාර්තමේන්තුවේ කටයුතු අඛණ්ඩව පවත්වාගෙන යාමට කටයුතු කරන ලදී.
- 2020 වර්ෂයේ පාරිතෝෂික ගෙවීම් කටයුතු සිදු කිරීම සඳහා ප්‍රමාණවත් මූල්‍ය ප්‍රතිපාදන ප්‍රමාණයක් දෙපාර්තමේන්තුව වෙත වෙන්කර නොතිබීම.

## විශ්‍රාම වැටුප් දෙපාර්තමේන්තුවේ ඉදිරි ගමන්මඟ

- සමස්ථ ජනගහනයෙන් 12.5%ක් පමණ වූ වැඩිහිටි ජනගහනය 2050 වන විට 24.8%ක් දක්වා වැඩිවෙතැයි සංඛ්‍යාලේඛන දත්ත මගින් ද වාර්තා වේ. එබැවින් මෙම සියළු කරුණු සලකා රටේ සමස්ථ ජනගහනයම ආවරණය වන පරිදි රජය, ව්‍යවසායකයන් හා වැඩකරන ජනතාව යන කොට්ඨාශ තුනේම දායකත්වයෙන් සමෘද්ධිමත් අනාගතයක් තුළ සුරක්ෂිත වැඩිහිටි ප්‍රජාවක් වෙනුවෙන් ආර්ථික ප්‍රතිලාභ හිමිකරදීමේ අභිලාෂයෙන් සැමට විශ්‍රාම වැටුපක් ලබා දීම සඳහා කාලෝචිත වැඩසටහනක් හඳුන්වා දීමට ශ්‍රී ලංකා රජය වෙනුවෙන් පුරෝගාමී වීම විශ්‍රාම වැටුප් දෙපාර්තමේන්තුව සතු ප්‍රධාන ඉදිරි අභියෝගයකි. ඒ සඳහා "සැමට විශ්‍රාම වැටුප්" යෝජනා මාලාව සඳහා ප්‍රතිපත්තිමය එකඟතාවය ලබා ගැනීම.

- විශ්‍රාම වැටුප් ව්‍යවස්ථා සංග්‍රහය හා වැන්දඹු අනත්දරු ආඥා පනතට, පවතින සියළු සංශෝධන ඇතුලත් කොට නැවත ඒකාබද්ධ කොට ඇත. එම ව්‍යවස්ථා හා නීති රෙගුලාසි වල පවතින දුර්වලතා මගහරවා ගැනීමට හා කලින් කලට සිදුවී ඇති සංශෝධන හේතුවෙන් විශ්‍රාම වැටුප් හිමි ගැන්වීමේ හා ගෙවීම් ක්‍රියාවලියේ සංකීර්ණභාවය මගහරවා ගැනීම උදෙසා අවශ්‍ය වෙනස්කම් හඳුනා ගැනීම හා රජය විසින් වරින් වර ගනු ලැබූ ප්‍රතිපත්තිමය තීරණ මත විශ්‍රාම වැටුප් දෙපාර්තමේන්තුව විසින් නිකුත් කරනු ලැබූ චක්‍රලේඛයන්ගේ පවතින ඇතැම් දුර්වලතා මගහරවා එම චක්‍රලේඛ යාවත්කාලීන කිරීමේ යෝජනා ඉදිරිපත් කිරීමට අවධානය යොමු කර ඇත.

- 2021 වසර සඳහා ජීවිත සහතික ලබා ගැනීමේදී, තැපැල් මාර්ගයෙන් වෙනුවට විද්‍යුත් තාක්ෂණය හරහා ලබා ගැනීමට කටයුතු කිරීම.



**ඒ. ජගත් ඩී. ඩයස්**
විශ්‍රාම වැටුප් අධ්‍යක්ෂ ජනරාල්

# 3

# 2020.12.31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වන සමස්ථ මූල්‍ය කාර්ය සාධනය

# 3.1. මූල්‍ය කාර්ය සාධන ප්‍රකාශය

ජීපීඒ-එෆ්

2020.12.31 දිනෙන් අවසන් වර්ෂය සඳහා
මූල්‍ය කාර්යසාධන ප්‍රකාශය

රු.

| අයවැය 2020 | | සටහන | සැබෑ 2020 | සැබෑ 2019 | |
|---|---|---|---|---|---|
| - | **ආදායම් ලැබීම්** | | | - | |
| - | ආදායම් බදු | 1 | - | - | |
| - | දේශීය භාණ්ඩ හා සේවා මත බදු | 2 | - | - | ජීපීඒ-1 |
| - | ජාත්‍යන්තර වෙළඳාම මත බදු | 3 | - | - | |
| | බදු නොවන ආදායම් හා වෙනත් | 4 | 32,417,052,244 | 28,984,852,661 | |
| | **මුළු ආදායම් ලැබීම් (අ)** | | 32,417,052,244 | 28,984,852,661 | |
| | **ආදායම් නොවන ලැබීම්** | | | | |
| | භාණ්ඩාගාර අග්‍රිම | | 252,227,945,841 | 224,191,545,265 | ජීපීඒ-3 |
| | භාණ්ඩාගාරයට ආපසු යැවීම් | | - | - | |
| | භාණ්ඩාගාර අග්‍රිම (ශුද්ධ) | | 252,227,945,841 | 224,191,545,265 | |
| | තැන්පතු **(වර්ෂය තුළ බැරකිරීම්)** | | 29,377,905 | 8,798,384 | ජීපීඒ-4 |
| | අත්තිකාරම් ගිණුම් | | 38,327,396 | 52,205,855 | ජීපීඒ-5 |
| | වෙනත් ලැබීම් ( 8098 + 8186 ) | | 64,096,039,447 | 43,437,572,432 | |
| | **මුළු ආදායම් නොවන ලැබීම් (ආ)** | | **316,391,690,589** | 267,690,121,936 | |
| | **මුළු ආදායම් ලැබීම් සහ ආදායම් නොවන ලැබීම් ඇ = (අ)+(ආ)** | | **348,808,742,833** | 296,674,974,597 | |
| | **අඩුකළා : වියදම්** | | | | |
| | **පුනරාවර්තන වියදම්** | | | | |
| 582,650,000.00 | වැටුප්, වේතන සහ අනෙකුත් සේවක ප්‍රතිලාභ | 5 | 577,026,866 | 516,109,865 | |
| 64,550,000.00 | අනෙකුත් භාණ්ඩ හා සේවා | 6 | 60,630,877 | 72,889,754 | ජීපීඒ-2(ii) |
| 301,207,360,000.00 | සහනාධාර, ප්‍රදාන සහ මාරුකිරීම් | 7 | 295,303,216,226 | 272,363,007,932 | |
| - | පොළී ගෙවීම් | 8 | | | |
| - | වෙනත් පුනරාවර්තන වියදම් | 9 | | 60,780.00 | |
| 301,854,560,000.00 | **මුළු පුනරාවර්තන වියදම් (ඈ)** | | **295,940,873,969** | 272,952,068,331 | |
| | **මූලධන වියදම්** | | | | |
| 11,100,000.00 | මූලධන වත්කම් පුනරුත්ථාපනය හා වැඩිදියුණු කිරීම | 10 | 8,276,222 | 18,058,221 | |
| 5,000,000.00 | මූලධන වත්කම් අත්පත් කර ගැනීම් | 11 | 3,562,293 | 9,084,010 | |
| - | ප්‍රාග්ධන මාරුකිරීම් | 12 | - | - | ජීපීඒ-2(ii) |
| - | මූල්‍ය වත්කම් අත්පත් කර ගැනීම | 13 | - | - | |
| 1,000,000.00 | හැකියා වර්ධනය | 14 | 467,478 | 669,170 | |
| 8,100,000.00 | වෙනත් මූලධන වියදම් | 15 | 3,617,212 | 30,816,675 | |
| 25,200,000.00 | **මුළු මූලධන වියදම් (ඉ)** | | **15,923,205** | 58,628,076 | |
| | **ප්‍රධාන ලෙජර් වියදම් (ඊ)** | | **63,145,242,254** | 43,326,974,873 | |
| | **තැන්පතු ගෙවීම්** | | 6,367,853 | 8,621,606 | ජීපීඒ-4 |
| | **අත්තිකාරම් ගෙවීම්** | | 45,714,845 | 62,655,715 | ජීපීඒ-5 |
| | **වෙනත් ගෙවීම්** | | 63,093,159,556 | 43,255,697,552 | |
| | **මුළු වියදම් C = (ඈ+ඉ+ඊ)** | | **359,102,039,428** | **316,337,671,280** | |
| | **2020 දෙසැම්බර් 31 ට අග්‍රිම ශේෂය** උ = (ඇ-C) | | **(10,293,296,595)** | **(19,662,696,683)** | |

## 3.2. මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශය

ඒසීඒ-පී

**2020 දෙසැම්බර් 31 දිනට**
**මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශය**

| | සටහන | සත්‍ය 2020 රු. | 2019 රු. |
|---|---|---|---|
| <u>මූල්‍ය නොවන වත්කම්</u> | | | |
| දේපළ, පිරියත හා උපකරණ | ඒසීඒ-6 | 2,010,864,008 | 2,022,113,280 |
| <u>මූල්‍ය වත්කම්</u> | | | |
| අත්තිකාරම් ගිණුම් | ඒසීඒ-5 | 168,558,188 | 161,170,739 |
| මුදල් හා මුදල් සමාන දෑ | ඒසීඒ-3 | 0 | - |
| **මුළු වත්කම්** | | **2,179,422,196** | **2,183,284,019** |
| <u>ශුද්ධ වත්කම් / ස්කන්ධය</u> | | | |
| ශුද්ධ වත්කම් | | 137,014,255 | 152,636,858 |
| දේපළ පිරියත හා උපකරණ සංචිතය | | 2,010,864,008 | 2,022,113,280 |
| | | | - |
| <u>ජංගම වගකීම්</u> | | | |
| තැන්පතු ගිණුම් | ඒසීඒ-4 | 31,543,933 | 8,533,881 |
| අග්‍රිම ශේෂය | ඒසීඒ-3 | 0 | - |
| **මුළු වගකීම** | | **2,179,422,196** | **2,183,284,019** |

පිටු අංක 01 සිට 27 දක්වා ඒසීඒ 1 සිට ඒසීඒ 6 දක්වා වූ ආකෘති පත්‍රවලින් ඉදිරිපත් කෙරෙන ගිණුම් තොරතුරු සහ සටහන් ද පිටු අංක 28 සිට 47 දක්වා ඇතුළත් ගිණුම් සටහන් විස්තර ද මෙම අවසන් ගිණුමෙහිම අන්තර්ගත කොටස් වේ. මෙම මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම පොදුවේ පිළිගත් ගිණුම් මූලධර්මවලට අනුකූලව සිදුකර ඇති අතර මෙහිදී මූල්‍ය ප්‍රකාශයන්හි සටහන් මඟින් හෙළිදරව් කර ඇති පරිදි වඩාත් සුදුසු ගිණුම්කරණ ප්‍රතිපත්ති භාවිතා කර ඇත. ඉහත අවසන් ගිණුමෙහි සඳහන් සංඛ්‍යා, ඒවා ~~අදාළ ගිණුම්~~ සටහන් හා අනෙකුත් ගිණුම් තොරතුරු භාණ්ඩාගාර ගිණුම් පොත් සමඟ සැසඳීම් කර ඇති බවටත් ඒවා එම සංඛ්‍යා සමඟ එකඟ වන බවටත් මෙයින් සහතික කරමු.

| | | |
|---|---|---|
| ප්‍රධාන ගිණුම්දීමේ නිලධාරි | ගණන්දීමේ නිලධාරි | ප්‍රධාන ගණකාධිකාරී |
| නම : | නම : | නම : |
| තනතුර : | තනතුර : | |
| දිනය : 24/02/2021 | දිනය : 24/02/2021 | දිනය : 22/02/2021 |
| ජේ.ජේ. රත්නසිරි<br>ලේකම්<br>රාජ්‍ය සේවා, පළාත් සභා හා පළාත් පාලන අමාත්‍යාංශය<br>සිද්ධාන්ත චතුරශ්‍රය<br>කොළඹ 07 | ඒ. ජගත් ඩී. ඩයස්<br>අධ්‍යක්ෂ ජනරාල්<br>විශ්‍රාම වැටුප් දෙපාර්තමේන්තුව<br>කොළඹ 10. | A.D.T.N. ABEYSINGHE<br>Chief Accountant<br>Department of Pensions<br>Maligawatta,<br>Colombo 10. |

2

# 3.3. මුදල් ප්‍රවාහ පිළිබඳ ප්‍රකාශය

ඒසීඒ-සී

**2020.12.31 දිනෙන් අවසන් වර්ෂය සඳහා**

**මුදල් ප්‍රවාහ ප්‍රකාශය**

| | සත්‍ය | |
|---|---|---|
| | **2020** | **2019** |
| | රු. | රු. |
| **මෙහෙයුම් ක්‍රියාකාරකම්වලින් ජනිත වූ මුදල් ප්‍රවාහයන්** | | |
| මුළු බදු ලැබීම් | - | |
| ගාස්තු, අධිභාර, දඩමුදල් සහ බලපත්‍ර | | |
| ලාභ | - | |
| ආදායම් නොවන ලැබීම් | 11,208,558,725 | 10,528,144,946 |
| වෙනත් ශීර්ෂ වෙනුවෙන් එකතු කරන ලද ආදායම් | 64,877,984,185 | 44,020,374,397 |
| අග්‍රිම ලැබීම් | 252,227,945,841 | 224,191,545,265 |
| **මෙහෙයුම් ක්‍රියාකාරකම්වලින් ජනිත වූ මුදල් ප්‍රවාහය (අ)** | **328,314,488,751** | **278,740,064,608** |
| **අඩුකළා : මුදල් වැය කිරීම්** | | |
| පුද්ගල පඩිනඩි හා මෙහෙයුම් වියදම් | 632,214,140 | 548,991,644 |
| සහනාධාර සහ මාරුකිරීම් | 253,904,522,847 | 234,875,558,306 |
| වෙනත් වැය ශීර්ෂ වෙනුවෙන් දරන ලද වියදම් | 73,777,979,231 | 43,232,156,011 |
| මූල්‍ය පිරිවැය - භාණ්ඩාගාරයට පියවන ලද අග්‍රිම | 1,192 | 203 |
| **මෙහෙයුම් ක්‍රියාකාරකම් සඳහා වැය කරන ලද මුදල් ප්‍රවාහය (ආ)** | **328,314,717,410** | **278,656,706,164** |
| **මෙහෙයුම් ක්‍රියාකාරකම්වලින් ජනිත වූ ශුද්ධ මුදල් ප්‍රවාහය (ඇ) =(අ)-(ආ)** | **(228,659)** | **83,358,444** |
| **ආයෝජන ක්‍රියාකාරකම්වලින් ජනිත වූ මුදල් ප්‍රවාහයන්** | | |
| පොලී | | |
| ලාභාංශ | | |
| හිමිකම් ඉවත්වීමේ ප්‍රතිපාදන හා භෞතික වත්කම් විකිණීම | | |
| උපණය අයකර ගැනීම් | | |
| අත්තිකාරම් අයකර ගැනීම් | 36,478,300 | 4,337,373 |
| **ආයෝජන ක්‍රියාකාරකම්වලින් ජනිත වූ මුදල් ප්‍රවාහය (ඈ)** | **36,478,300** | **4,337,373** |
| **අඩුකළා : මුදල් වැය කිරීම්** | | |
| භෞතික වත්කම් ඉදිකිරීම හෝ මිලදී ගැනීම හා වෙනත් ආයෝජන අත්කර ගැනීම | 14,432,269 | 37,469,355 |
| අත්තිකාරම් ගෙවීම් | 44,827,424 | 50,974,581 |
| **ආයෝජන ක්‍රියාකාරකම් සඳහා වැය කරන ලද මුළු මුදල් ප්‍රවාහය (ඉ)** | **59,259,693** | **88,443,936** |
| **ආයෝජන ක්‍රියාකාරකම්වලින් ජනිත වූ ශුද්ධ මුදල් ප්‍රවාහය ( ඊ)=(ඈ)-(ඉ)** | **(22,781,393)** | **(84,106,563)** |
| **මෙහෙයුම් හා ආයෝජන ක්‍රියාකාරකම්වලින් ජනිත වූ ශුද්ධ මුදල් ප්‍රවාහය (උ)=( ඇ) + (ඊ)** | **(23,010,052)** | **(748,119)** |
| **මූල්‍ය ක්‍රියාකාරකම්වලින් ජනිත වූ මුදල් ප්‍රවාහයන්** | | |
| දේශීය ණය ගැනීම් | | |
| විදේශීය ණය ගැනීම් | | |
| ප්‍රදානයන් ලැබීම් | | |
| තැන්පතු ලැබීම් | 29,377,905 | 6,894,473 |
| **මූල්‍ය ක්‍රියාකාරකම්වලින් ජනිත වූ මුළු මුදල් ප්‍රවාහය (ඌ)** | **29,377,905** | **6,894,473** |
| **අඩුකළා : මුදල් වැය කිරීම්** | | |
| දේශීය ණය ආපසු ගෙවීම් | | |
| විදේශීය ණය ආපසු ගෙවීම | | |
| තැන්පතු ගෙවීම් | 6,367,853 | 6,146,354 |
| තැන්පත් ගිණුම් හා අනෙකුත් වගකීම්වල වෙනස්වීම් | | |
| **මූල්‍ය ක්‍රියාකාරකම් සඳහා වැය කරන ලද මුළු මුදල් ප්‍රවාහය (එ)** | **6,367,853** | **6,146,354** |
| **මූල්‍ය ක්‍රියාකාරකම්වලින් ජනිත වූ මුදල් ප්‍රවාහය (ඒ)=(ඌ)-(එ)** | **23,010,052** | **748,119** |
| මුදල්වල ශුද්ධ වෙනස්වීම (ඔ) = (උ) -(ඒ) | (0) | - |
| **ජනවාරි 01 දිනට ආරම්භක මුදල් ශේෂය** | - | |
| **දෙසැම්බර් 31 දිනට අවසාන මුදල් ශේෂය** | - | |

# 3.4. මූල්‍ය ප්‍රකාශ සටහන්

**මූල්‍ය ප්‍රකාශන සඳහා සටහන්**

වාර්තා කිරීමේ පදනම

1) වාර්තාකරණ කාලපරිච්ඡේදය

2020 ජනවාරි 01 සිට දෙසැම්බර් 31 දක්වා වූ කාලපරිච්ඡේදය මෙම මූල්‍ය ප්‍රකාශයන්ට අදාළ වාර්තාකරණ කාලපරිච්ඡේදය වේ.

2) මිනුම්කරණ පදනම

මූල්‍ය ප්‍රකාශන ඓතිහාසික පිරිවැය මත පිළියෙල කර ඇති අතර සමහර වත්කම්වල ඓතිහාසික පිරිවැය නැවත තක්සේරු කරන ලද වටිනාකමට වැඩිදියුණු කර ඇත. අන්‍යාකාරයෙන් දක්වා නොමැති විට ගිණුම් පිළියෙල කිරීම වැඩිදියුණු කළ මුදල් පදනම මත සිදුකරයි.

මූල්‍ය ප්‍රකාශ ශ්‍රී ලංකා රුපියල්වලින් ආසන්නතම රුපියලට ඉදිරිපත් කර ඇත.

3) ආදායම් හඳුනාගැනීම

හුවමාරු හා හුවමාරු නොවන ආදායම් ඒවායේ බද්ද වන කාලසීමාව නොසළකා, ගිණුම් කාලසීමාව තුළ මුදල් ලැබීම් අනුව හඳුනාගනු ලැබේ.

4) දේපළ, පිරියත හා උපකරණ හඳුනාගැනීම හා මැනීම

වත්කමට අදාළ අනාගත ආර්ථික ප්‍රතිලාභ ආයතනයට ලැබෙන බවට තහවුරුවක් ඇති විට හා එම වත්කම් විශ්වාසනීයව මැනිය හැකි නම් එම වත්කම් දේපළ, පිරියත හා උපකරණ ලෙස හඳුනාගනු ලැබේ.

දේපළ, පිරියත හා උපකරණ පිරිවැයට හඳුනාගන්නා අතර පිරිවැය ආකෘතිය අදාළ නොවන අවස්ථාවලදී නැවත තක්සේරු කරන ලද අගය යොදාගනී.

5) දේපළ, පිරියත හා උපකරණ සංචිතය

මෙම සංචිත ගිණුම් දේපළ, පිරියත හා උපකරණවල අනුරූප ගිණුම වේ.

6) මුදල් හා මුදල් සමාන දෑ

2020 දෙසැම්බර් 31 දිනට අතැති දේශීය ව්‍යවහාර මුදල් නෝට්ටු සහ කාසිවලින් මුදල් හා මුදල් සමාන දෑ සමන්විත වේ.

## 3.5. ආදායම් එකතු කිරීමේ කාර්ය සාධනය

රු. , 000

| ආදායම් කේතය | ආදායම් කේතයේ විස්තරය | ආදායම් ඇස්තමේන්තුව | | එකතු කරන ලද ආදායම | |
|---|---|---|---|---|---|
| | | මුල් ඇස්තමේන්තුව | අවසන් ඇස්තමේන්තුව | ප්‍රමාණය (රු) | අවසාන ආදායම් ඇස්තමේන්තුවේ % ලෙස |
| | **සමාජ සංරක්ෂණ දායක මුදල්** | | | | |
| 2004.1 | මධ්‍යම රජය | 19,000,000 | 21,000,000 | 21,394,268 | 101.87% |
| 2004.2 | පළාත් සභා | 11,700,000 | 12,000,000 | 11,022,784 | 91.86% |
| 8186 | ගුරු වැන්දඹු අනත්දරු විශ්‍රාම වැටුප් අරමුදල | 104,000 | 104,000 | 263,356 | 253% |
| 2002.01.01 | කුලී ආදායම් | 36,832 | 35,708 | 16,266 | 54.45% |
| | **පළාත් පාලන අරමුදල්** | | | | |
| - | පලාත් පාලන සේවා වැන්දඹු පුරුෂ අනත්දරු විශ්‍රාම වැටුප් අරමුදල | - | - | 4 | - |
| - | වැන්දඹු හා අනත්දරු විශ්‍රාම වැටුප් අරමුදල | - | - | 145 | - |
| - | පළාත් පාලන සේවා විශ්‍රාම වැටුප් අරමුදල | - | - | 75,241 | - |

## 3.6. වෙන් කරන ලද ප්‍රතිපාදන උපයෝගී කර ගැනීමේ කාර්ය සාධනය

රු. , 000

| ප්‍රතිපාදන වර්ගය | වෙන් කරන ලද ප්‍රතිපාදන | | සත්‍ය වියදම | උපයෝගී කරනු ලැබූ ප්‍රතිපාදන, අවසන් කරන ලද අවසාන ප්‍රතිපාදන ප්‍රමාණයේ ප්‍රතිශතයක් ලෙස |
|---|---|---|---|---|
| | මුල් ප්‍රතිපාදන | අවසාන ප්‍රතිපාදන | | |
| පුනරාවර්තන | 301,857,860 | 301,857,860 | 295,940,873 | 98% |
| ප්‍රාග්ධන | 25,200 | 25,200 | 15,923 | 63% |

## 3.7. මු.රෙ.208 ප්‍රකාරව, වෙනත් අමාත්‍යාංශ/ දෙපාර්තමේන්තු වල නියෝජිතයෙකු ලෙස මෙම දෙපාර්තමේන්තුවට/ දිස්ත්‍රික් ලේකම් කාර්යාලයට/ පළාත් සභාවට ප්‍රදානය කරන ලද ප්‍රතිපාදන

රු. ,000

| අනු අංකය | ප්‍රතිපාදන ලද අමාත්‍යාංශය/ දෙපාර්තමේන්තුව | ප්‍රතිපාදනයේ අරමුණ | ප්‍රතිපාදන | | සත්‍ය වියදම | උපයෝගී කර ගන්නා ලද ප්‍රතිපාදන, ලබා දුන් අවසාන ප්‍රතිපාදන වල % ලෙස |
|---|---|---|---|---|---|---|
| | | | මුල් ප්‍රතිපාදන | අවසාන ප්‍රතිපාදන | | |
| 01 | මැතිවරණ කොමිෂන් සභාව (20) | මැතිවරණ දීමනා ගෙවීම | 1080 | 1080 | 1080 | 100% |
| 02 | භාණ්ඩාගාර මෙහෙයුම් දෙපාර්තමේන්තුව (249) | පාරිතෝෂික ණය වාරික හා පොළිය ගෙවීම | 10,686,633 | 10,686,633 | 10,686,633 | 100% |

## 3.8. මූල්‍ය නොවන වත්කම් වාර්තා කිරීමේ කාර්ය සාධනය

රු. ,000

| වත්කම් කේතය | කේත විස්තරය | 2020.12.31 දිනට භාණ්ඩ සමීක්ෂණ වාර්තාවට අනුව ශේෂය | 2020.12.31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශය අනුව ශේෂය | ඉදිරියේදී ගිණුම්කරණයට නියමිත | ප්‍රගතිය % ලෙස වාර්තා කිරීම |
|---|---|---|---|---|---|
| 9151 | ගොඩනැගිලි හා ද්‍රව්‍යයන් | 581,259 | 581,259 | - | 100% |
| 9152 | යන්ත්‍රෝපකරණ | 228,197 | 228,197 | - | 100% |
| 9153 | ඉඩම් | 1,198,405 | 1,198,405 | - | 100% |
| 9154 | අස්පෘශ්‍ය වත්කම් | - | - | - | - |
| 9155 | ජීව විද්‍යාත්මක වත්කම් | - | - | - | - |
| 9160 | කෙරීගෙන යන වැඩ | - | - | - | - |
| 9180 | බදු දෙන ලද වත්කම් | - | - | - | - |

## 3.9. විගණකාධිපතිවරයාගේ වාර්තාව

# ජාතික විගණන කාර්යාලය
## தேசிய கணக்காய்வு அலுவலகம்
## NATIONAL AUDIT OFFICE

මගේ අංකය / எனது இல. / My No. } එල්ටීවීබ/ඩී/ඩීඑම්/02//20/50(1) ඔබේ අංකය / உமது இல. / Your No. } දිනය / திகதி / Date } 2021 ජූලි 30 දින

03 AUG 2021

අධ්‍යක්ෂ ජනරාල්

විශ්‍රාම වැටුප් දෙපාර්තමේන්තුව

**විශ්‍රාම වැටුප් දෙපාර්තමේන්තුවේ 2020 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන පිළිබඳව 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 11(1) වගන්තිය ප්‍රකාරව විගණකාධිපති සම්පිණ්ඩන වාර්තාව.**

---

1. මූල්‍ය ප්‍රකාශන

1.1. මතය

විශ්‍රාම වැටුප් දෙපාර්තමේන්තුවේ 2020 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්වය ප්‍රකාශය, එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය කාර්යසාධන ප්‍රකාශය හා මුදල් ප්‍රවාහ ප්‍රකාශවලින් සමන්විත 2020 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ විධිවිධාන සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 11(1) වගන්තිය ප්‍රකාරව විශ්‍රාම වැටුප් දෙපාර්තමේන්තුව වෙත ඉදිරිපත් කරනු ලබන මෙම මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ සඳහන් වේ. ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(6) ව්‍යවස්ථාව සමඟ සංයෝජිතව කියවිය යුතු 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 10 වගන්තිය ප්‍රකාරව ඉදිරිපත් කළ යුතු විගණකාධිපති වාර්තාව යථා කාලයේදී පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කරනු ලැබේ.

පිටුව 1 | 16

අංක 306/72, පොල්දූව පාර, බත්තරමුල්ල, ශ්‍රී ලංකාව இல. 306/72, பொல்துவ வீதி, பத்தரமுல்லை, இலங்கை No. 306/72, Polduwa Road, Battaramulla, Sri Lanka
+94 11 2 88 70 28 - 34 +94 11 2 88 72 23 ag@auditorgeneral.gov.lk www.naosl.gov.lk

විශ්‍රාම වැටුප් දෙපාර්තමේන්තුවේ මූල්‍ය ප්‍රකාශනවලින් 2020 දෙසැම්බර් 31 දිනට විශ්‍රාම වැටුප් දෙපාර්තමේන්තුවේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය කාර්යසාධනය හා මුදල් ප්‍රවාහ ප්‍රකාශය පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

## 1.2. මතය සඳහා පදනම

---

ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර) අනුකූලව මා විගණනය සිදු කරන ලදී. මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් මාගේ වගකීම, විගණකගේ වගකීම යන වගන්තියේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබා ගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

## 1.3. මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් ගණන්දීමේ නිලධාරීගේ වගකීම

---

පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව හා 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 38 වගන්තියේ සඳහන් විධිවිධානවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කෙරෙන පරිදි මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම හා වංචා සහ වැරදි හේතුවෙන් ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකි වනු පිණිස අවශ්‍යවන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම ගණන්දීමේ නිලධාරීගේ වගකීම වේ.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16(1) වගන්තිය ප්‍රකාරව දෙපාර්තමේන්තුව විසින් වාර්ෂික හා කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වා ගෙන යා යුතුය.

ජාතික විගණන පනතේ 38(1)(ඇ) උප වගන්තිය ප්‍රකාරව දෙපාර්තමේන්තුවේ මූල්‍ය පාලනය සඳහා සඵලදායී අභ්‍යන්තර පාලන පද්ධතියක් සකස් කර පවත්වා ගෙන යනු ලබන බවට ගණන්දීමේ නිලධාරී සහතික විය යුතු අතර එම පද්ධතියේ සඵලදායීත්වය පිළිබඳව කලින් කල සමාලෝචනයක් සිදු කර ඒ අනුව පද්ධතිය ඵලදායී ලෙස කරගෙන යාමට අවශ්‍ය වෙනස්කම් සිදු කරනු ලැබිය යුතුය.

පිටුව 2 | 16

## 1.4. මූල්‍ය ප්‍රකාශන විගණනය පිළිබඳ විගණකගේ වගකීම

------------------------------------------------------------

සමස්ථයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා හා වැරදි හේතුවෙන් ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණන වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සැම විටම ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන් අනාවරණය කර ගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස.බලපෑම නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇති විය හැකි අතර, එහි ප්‍රමාණාත්මක භාවය මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කර ගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි වන බලපෑම මත රඳා පවතී.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනයේ කොටසක් ලෙස මා විසින් විගණනයේදී වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ක්‍රියා කරන ලදී. මා විසින් තවදුරටත්,

- ප්‍රකාශ කරන ලද විගණන මතයට පදනමක් සපයා ගැනීමේදී වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන් ඇතිවීමේ අවදානම් හඳුනාගැනීම හා තක්සේරු කිරීම සඳහා අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කර ක්‍රියාත්මක කරන ලදී. වරදවා දැක්වීම් හේතුවෙන් සිදුවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නා වූ බලපෑම ප්‍රබල වන්නේ ඒවා දූස්සන්ධානයෙන්, ව්‍යාජ ලේඛන සැකසීමෙන්, චේතනාන්විත මඟහැරීමෙන්, වරදවා දැක්වීමෙන් හෝ අභ්‍යන්තර පාලනයන් මඟ හැරීමෙන් වැනි හේතු නිසා වන බැවිනි.
- අභ්‍යන්තර පාලනයේ සඵලදායීත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමේ අදහසින් නොවුවද, අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස අභ්‍යන්තර පාලනය පිළිබඳව අවබෝධයක් ලබා ගන්නා ලදී. .
- හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය සහ අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණ අයුරින් මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත් බව අගයන ලදී.
- මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය හා අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත් වී ඇති බව සහ හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල සමස්ථ ඉදිරිපත් කිරීම අගයන ලදී.

මාගේ විගණනය තුළදී හඳුනාගත් වැදගත් විගණන සොයාගැනීම්, ප්‍රධාන අභ්‍යන්තර පාලන දුර්වලතා හා අනෙකුත් කරුණු පිළිබඳව ගණන්දීමේ නිලධාරී දැනුවත් කරමි.

පිටුව 3 | 16

## 1.5. වෙනත් නෛතික අවශ්‍යතා පිළිබඳ වාර්තාව

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 6(1)(ඇ) වගන්තිය ප්‍රකාරව පහත සඳහන් කරුණු මා ප්‍රකාශ කරමි.

(අ) මූල්‍ය ප්‍රකාශන ඉකුත් වර්ෂය සමඟ අනුරූප වන බවට ,

(ආ) ඉකුත් වර්ෂයට අදාළ මූල්‍ය ප්‍රකාශන පිළිබඳ මා විසින් කර තිබුණු මෙම වාර්තාවේ 2.1(අ),(ආ), (ඇ), (ඉ), 2.3, 2.5 ඡේදවල නිර්දේශ ක්‍රියාත්මක කර නොතිබුණි.

## 1.6. මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම

### 1.6.1. මූල්‍ය කාර්යසාධන ප්‍රකාශය

#### 1.6.1.1. ආදායම් නොවන ලැබීම්

සමාලෝචිත වර්ෂය තුළදී, වෙනත් ආයතන වෙනුවෙන් ආදායම් සංකේත 04 ක් යටතේ දෙපාර්තමේන්තුව විසින් රැස්කරන ලද, එකතුව රු.1,024,621,786 ක් වූ ආදායම්, මූල්‍ය කාර්යසාධන ප්‍රකාශයේ ආදායම් නොවන ලැබීම් යටතේ වෙනත් ලැබීම් ලෙස දක්වා නොතිබීම හේතුවෙන් මූල්‍ය කාර්යසාධන ප්‍රකාශයේ මුළු ලැබීම් වටිනාකම එම ප්‍රමාණයෙන් අඩුවෙන් දක්වා තිබුණි.

#### 1.6.1.2. පුනරාවර්තන වියදම්

වර්ෂය සඳහා වූ දේශීය හා විදේශීය ගමන් වියදම් රු. 2,397,956 ක් මූල්‍ය කාර්යසාධන ප්‍රකාශයේ අනෙකුත් භාණ්ඩ හා සේවා වියදම යටතේ දැක්විය යුතු වුවත් ,එම වියදම වැටුප්, වේතන හා අනෙකුත් සේවක ප්‍රතිලාභ වියදම් යටතේ දැක්වීම හේතුවෙන් එම වටිනාකමින් වැටුප්, වේතන හා අනෙකුත් සේවක ප්‍රතිලාභ වියදම වැඩියෙන් ද, අනෙකුත් භාණ්ඩ හා සේවා වියදම් අඩුවෙන්ද නිරූපණය කර තිබුණි.

පිටුව 4 | 16

1.6.2. මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශය

මූල්‍ය නොවන වත්කම්

සමාලෝචිත වර්ෂය අවසානයට, දෙපාර්තමේන්තුවේ ස්ථාවර වත්කම් අයිතම 2 ක සිගාස් වැඩසටහන අනුව වටිනාකම රු.59,767,636 ක්වූ අතර මූල්‍ය ප්‍රකාශ අනුව එම වටිනාකම රු.74,977,453 ක් ද වූයෙන් මූල්‍ය ප්‍රකාශය අනුව වටිනාකම රු.15,209,817 ක් වැඩියෙන් දක්වා තිබුණි. තවද, ස්ථාවර වත්කම් අයිතම 4 ක සිගාස් වැඩසටහන අනුව වටිනාකම රු.125,931,241 ක් වූ අතර මූල්‍ය ප්‍රකාශනය අනුව වටිනාකම රු.102,556,055 ක් වූයෙන් මූල්‍ය ප්‍රකාශනය අනුව වටිනාකම රු.23,375,186 ක් අඩුවෙන් ද දක්වා තිබුණි. මෙ හේතුවෙන් මූල්‍ය ප්‍රකාශන හා සිගාස් වැඩසටහන අතර ස්ථාවර වත්කම්වල රු.8,165,369 ක ශුද්ධ වෙනසක් නිරීක්ෂණය විය..

1.6.3. ලේඛන හා පොත්පත් පවත්වා නොතිබීම

දෙපාර්තමේන්තුව විසින් මුදල් රෙගුලාසි 891(1) ප්‍රකාරව ඇප තැබිය යුතු නිලධාරීන් හා සේවකයන්ගේ තොරතුරු ඇතුළත් ඇප ලේඛනයක් පිළියෙල කර නොතිබුණි.

2. මූල්‍ය සමාලෝචනය

2.1. ආදායම් කළමනාකරණය

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

ආදායම් සංකේත අංකය 20:04:01:00 (මධ්‍යම රජය)

(අ) සමාලෝචිත වර්ෂය තුලදී රු.13,563,414 ක් වූ ආපසු ගෙවන ලද ආදායම් තහවුරු කර ගැනීම සඳහා 2001 ජනවාරි 15 දිනැති අංක 1/2001 දරන විශ්‍රාම වැටුප් චක්‍රලේඛයේ 1(අ) වගන්තිය ප්‍රකාරව 2021 ජූනි මාසය දක්වාම අදාල ආයතනවලින් හර නිවේදන ලබා ගෙන නොතිබුණි.

(ආ) 2015 ජූලි 20 දිනැති අංක 01/2015 දරන රාජ්‍ය මූල්‍ය ප්‍රතිපත්ති චක්‍රලේඛයේ 07 ඡේදය ප්‍රකාරව ආදායම් ගණන්දීමේ නිලධාරීන්ට අයත් ආදායම් සංකේත සඳහා අදාල මාසික වාර්තා එළඹෙන මාසයේ 10 දිනට පෙර රාජ්‍ය මූල්‍ය ප්‍රතිපත්ති අධ්‍යක්ෂ ජනරාල් වෙත ඉදිරිපත් කල යුතු වුවත් මාස 07 ක් සඳහා වූ එම මාසික කාර්යසාධන වාර්තා දින 41 ත් 107 ත් අතර ප්‍රමාද කාල පරාසයක් සහිතව ඉදිරිපත් කර තිබුණි. විශ්‍රාම වැටුප් අධ්‍යක්ෂ ජනරාල්වරයා විසින් කෙටුම්පත්

පිටුව 5 | 16

සම්පිණ්ඩන වාර්තාවට ලබාදුන් පිළිතුර අනුව ගෝලීය COVID 19 වසංගතය හේතුවෙන් 2020 වර්ෂය තුළ අඛණ්ඩව රාජකාරී සිදු කිරීමට නොහැකි වීම මෙම ප්‍රමාදය සඳහා හේතු වී තිබුණි.

(ඈ) වැන්දඹු/වැන්දඹු පුරුෂ හා අනත්දරු විශ්‍රාම වැටුප් සඳහා දායක මුදල් ලැබීම් ( පළාත් සභා) සමාලෝචිත වර්ෂය තුලදී ආදායම් ඇස්තමේන්තුව රු. 12,000,000,000 ක් වූ අතර රැස් කරන ලද ශුද්ධ ආදායම රු. 11,022,784,468 ක් වූ අතර රැස් කරන ලද ශුද්ධ ආදායමේ අඩුවීම ආදායම් ඇස්තමේන්තුවෙන් සියයට 8 ක් හෙවත් රු. 977,215,532 ක් වී තිබුණි.

(ඇ) ආදායම් සංකේත අංක 20:04:02:00 සඳහා පළාත් සභාවලින් වැන්දඹු/වැන්දඹු පුරුෂ හා අනත්දරු විශ්‍රාම වැටුප් දායක මුදල් ලැබීම් හා හිඟ දායක මුදල්, ආයතන අනුව මෙන්ම දායකයන් අනුව, නිශ්චිතව හඳුනාගත හැකි වන පරිදි දත්ත පද්ධතියක් සකස් කර නොතිබුණි. පළාත් පාලන ආයතන විසින් හිඟ ආදායම් ලෙස වාර්තාකර තිබූ වටිනාකම මූල්‍ය ප්‍රකාශවල හිඟ ආදායම් ලෙස ගිණුම් ගත කර තිබුණි. ඒ අනුව සමාලෝචිත වර්ෂය අවසානයට රු 823,984,589 ක් වූ හිඟ ආදායමෙහි නිවැරදිතාවය තහවුරු කර ගැනීමට නොහැකි විය. තවද සමාලෝචිත වර්ෂය තුළදී රැස් කරන ලද රු.11,021,652,894 ක් වූ දායක ලැබීම්, දායක ගිණුම් අනුව වෙන් කර හඳුනාගත නොහැකි විය. ඒ අනුව වැන්දඹු/වැන්දඹු පුරුෂ විශ්‍රාම වැටුප් ගෙවීමේදී හා දායක මුදල් ආපසු ගෙවීමේදී දායක මුදල් ඒ ඒ පුද්ගලයාගෙන් අඛණ්ඩව ලැබුණේද යන්න දෙපාර්තමේන්තුව තුළින් සනාථ කර ගැනීමට නොහැකි වී තිබුණි. එසේම හිඟ ආදායම් අප්‍රමාදව අය කර ගැනීමටත්, ඒ සඳහා අවශ්‍ය විධිවිධාන සකස් කිරීමටත් විශ්‍රාම වැටුප් දෙපාර්තමේන්තුවට නොහැකි වී තිබුණි.

(ඉ) 2001 ජනවාරි 15 දිනැති අංක 1/2001 දරන විශ්‍රාම වැටුප් අධ්‍යක්ෂ ජනරාල්ගේ චක්‍රලේඛයේ 2.2 වගන්තිය ප්‍රකාරව පළාත් සභා විසින් සියළුම කාර්යාලවල දායක මුදල් වෙනුවෙන් එක් චෙක්පතක් නිකුත් කරන විට සෑම මාසයකම අයකිරීම් ඊළග මාසයේ 15 දිනට පෙර ගෙන්වා ගැනීමට කටයුතු කල යුතු වුවත් සමාලෝචිත වර්ෂයේදී පළාත් සභා 5 ක් විසින් අවස්ථා 29 ක දී දින 15 සිට දින 96 දක්වා කාල ප්‍රමාදයක් සහිතව එවා තිබූ අතර දකුණු පළාත් සභාව හා ඌව පළාත් සභාව විසින් එක් එක් මාසයන් සඳහා අදාළ දායක මුදල් එවීමේ දී, එකවර එවීමකින් තොරව කොටස් වශයෙන් එවීම නිසා නියමිත දිනට වඩා දින 16 ක් 132 ක් අතර කාල ප්‍රමාදයක් සහිතව එවා තිබූ අවස්ථා 20 ක් ද නිරීක්ෂණය විය.

පිටුව 6 | 16

<u>ගොඩනැගිලි කුලී</u>

(ඇ) ජාතික නිවාස සංවර්ධන අධිකාරිය, නාගරික සංවර්ධන අධිකාරිය සහ මධ්‍යම පරිසර අධිකාරිය යන් ආයතනවලින් 2009 වර්ෂයේ සිට 2015 දෙසැම්බර්.31 දක්වා කාලයට අදාලව අයවිය යුතු හිඟ ගොඩනැගිලි කුලිය රු.24,605,333 ක් විය. මෙම කුලී ගෙවීම සඳහා අදාළ කුලී ගිවිසුම් හෝ මාසිකව නිකුත් කරන ලද ඉන්වොයිස් හෝ වෙනත් ලියවිලි පිටපත් ඉදිරිපත් කරන ලෙස ඉහත ආයතන විසින් විශ්‍රාම වැටුප් දෙපාර්තමේන්තුව වෙත ඉල්ලීම් කර තිබුනද එබදු ලියවිලි ඉදිරිපත් කිරීමට දෙපාර්තමේන්තුව අපොහසත් වී තිබුණි.

(ආ) 2020 ජූනි 31 දිනට, පරිශ්‍රයේ කුලී පදනම මත පවත්වාගෙන යන ආයතන 07 ක් විසින් ගෙවිය යුතු හිඟ කුලී ආදායමේ එකතුව රු.2,036,600 ක් වූ අතර කාල විශ්ලේෂණය අනුව හිඟ කාල පරිච්ඡේදය වසරකට වඩා වැඩි වටිනාකම රු.299,000 ක් විය.

## 2.2. බැරකම් හා බැදීම්වලට එළඹීම

---

**ප්‍රතිපාදන ඉක්ම වූ බැරකම**

---

අංක 253-1-2-4 දරන විශ්‍රාමිකයින් සඳහා වූ පාරිතෝෂික ගෙවීම් වැය විෂයය යටතේ සමාලෝචිත වර්ෂය අවසානයට ඉතිරි ප්‍රතිපාදනය රු.5,349,310,643 ක් වුවද, එම වැය විෂයය යටතේ බැරකම් ප්‍රකාශය අනුව බැරකම රු.5,392,442185 ක් වූ බැවින් ප්‍රතිපාදන ඉක්ම වූ බැරකම රු. 43,131,542 ක් වී තිබුණි.

## 2.3. ගණන්දීමේ නිලධාරී විසින් සිදු කළ යුතු සහතිකවීම

---

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 38 වන වගන්තියේ විධිවිධාන අනුව ගණන්දීමේ නිලධාරී විසින් පහත සඳහන් කරුණු සම්බන්ධයෙන් සහතික වීම කළ යුතුව තිබුණත්, ඒ අනුව කටයුතු කර නොතිබුණි.

(අ) දෙපාර්තමේන්තුව මූල්‍ය පාලනය සඳහා සඵලදායි අභ්‍යන්තර පාලන පද්ධතියක් සකස් කර පවත්වා ගෙන යනු ලබන බවට ගණන්දීමේ නිලධාරී සහතික විය යුතු අතර එම පද්ධතියේ සඵලදායිතාවය පිළිබඳව කලින් කල සමාලෝචනය සිදු කර ඒ අනුව පද්ධති ඵලදායි ලෙස කර ගෙන යැමට අවශ්‍ය වෙනස්කම් සිදු කරනු ලැබිය යුතු බවත්, එම සමාලෝචනයන් ලිඛිතව සිදු කර එහි පිටපතක් විගණකාධිපති වෙත ඉදිරිපත් කළ යුතුව තිබුණත්, එවැනි සමාලෝචනයන් සිදු කළ බවට ප්‍රකාශ විගණනයට ඉදිරිපත් කර නොතිබුණි.

පිටුව 7 | 16

(ආ) විගණකාධිපතිවරයාට අවශ්‍ය වන පරිදි නිශ්චිත කාලසීමාවන් තුළ සියළුම විගණන විමසුම්වලට පිළිතුරු සැපයීම සිදු වන බවට ගණන්දීමේ නිලධාරී විසින් සහතික විය යුතු වුවත්, 2020 මුදල් වර්ෂයට අදාලව නිකුත් කරන ලද විගණන විමසුම් 17 කට පිළිතුරු ලබා දී නොතිබුණු අතර එම විගණන විමසුම් වලට අදාළ පැහැදිලි කිරීම සඳහා ඉදිරිපත් කරන ලද වටිනාකම රු 45,980,603 ක් වී තිබුණි.

## 2.4. නීති, රීති හා රෙගුලාසිවලට අනුකූල නොවීම

නිරීක්ෂණය

| නීති,රීති හා රෙගුලාසි වලට යොමුව | වටිනාකම රු. | අනුකූල නොවීම |
|---|---|---|
| විශ්‍රාම වැටුප් චක්‍රලේඛ<br>(i) 2015 සැප්තැම්බර් 14 හා 2011 නොවැම්බර් 04 දිනැති අංක 09/2015 දිනැති 08/2011 දරන විශ්‍රාම වැටුප් චක්‍රලේඛ | | වර්තමාන ලිපිනයන් පිළිබඳ තොරතුරු නොමැති වීම , බාල වයස්කරුවා වෙත කිහිප වරක් ලිපි මඟින් දන්වා සිටිය ද පාස්පොත භාර ගැනීමට පැමිණ නොමැති වීම යන කරුණු මත තිඹිරිගස්යාය, ශ්‍රී ජයවර්ධනපුර කෝට්ටේ හා යටිනුවර ප්‍රාදේශීය ලේකම් කාර්යාල 03 ක බාල වයස්කරුවන් 22 ක ගේ වයස අවුරුදු 18 සම්පූර්ණ වී තිබියදීත් පාස්පොත් අදාල පුද්ගලයන් වෙත භාර දී නොතිබුණු අතර එයින් පාස් පොත් 20 ක යාවත්කාලීන කරන ලද දිනයන්ට අදාලව එකතු වටිනාකම රු.2,145,720 ක් වී තිබුණි. |
| (ii) 2013 දෙසැම්බර් 03 දිනැති හා අංක 6/2013 දරන විශ්‍රාම වැටුප් චක්‍රලේඛ හා 2011 ජුනි 14 දිනැති විශ්‍රාම වැටුප් චක්‍රලේඛ ලිපි අංක 02 | | නොගෙවූ විශ්‍රාම වැටුප් නියමිත මාසයට පසු මාසයේ විශ්‍රාම වැටුප් දෙපාර්තමේන්තුව වෙත එවිය යුතු වුවත් එසේ නොකර තිඹිරිගස්යාය හා හාරිස්පත්තුව ප්‍රාදේශීය ලේකම් කාර්යාලවල විශ්‍රාම වැටුප් අංශ විසින් රු.1,848,838 ක මුදලක් මාස 07 සිට මාස 14 දක්වා කාලයක් අදාල ප්‍රාදේශීය ලේකම් කාර්යාලවල පොදු තැන්පත් ගිණුමේ රඳවා ගෙන තිබුණි. |

පිටුව 8 | 16

2.5. අත්තිකාරම් නිකුත් කිරීම හා පියවීම

පහත සඳහන් නිරීක්ෂණයන් කෙරේ

(අ) විගණනයට ඉදිරිපත් කල රජයේ නිලධාරීන්ගේ අත්තිකාරම් ගිණුමේ සැසඳුම් ප්‍රකාශය අනුව එදිනට වැඩ තහනම් කර ඇති, සේවය අතහැර ගොස් ඇති හා ස්ථාන මාරු වී ගිය නිලධාරීන් 12 දෙනෙකුගෙන් අයකර ගත යුතු වර්ෂ 5ට වැඩි කාලයක් හිඟ හිට පැවතින ශේෂය රු. 718,350 ක් වී තිබුණු අතර මෙම ශේෂ විගණන දිනය දක්වා නිරවුල් කරගෙන නොතිබුණි.

(ආ) 2020 දෙසැම්බර් 31 දිනට දෙපාර්තමේන්තු පොත් අනුව රජයේ නිලධාරීන්ගේ අත්තිකාරම් ගිණුමේ කේවල ශේෂ වර්ගීකරණ සාරාංශයේ එකතුව රු.168,586,842 ක්ද, පාලන ගිණුම අනුව එම ශේෂය රු.168,558,187 ක් වූයෙන් එම ශේෂයන් අතර රු. 298,655 ක වෙනසක් නිරීක්ෂණය විය. කෙසේ වුවද දෙපාර්තමේන්තුව විසින් මු.රෙ 427/1 ප්‍රකාරව දෙපාර්තමේන්තු පොත්, භාණ්ඩාගාර පරිගණක මුද්‍රිත සමඟ සැසඳුම්කර වෙනසක් නොමැති බව, සහතික කර තිබුණද , මේ අනුව එය නිවැරදි නොවන බව නිරීක්ෂණය විය.

3. මෙහෙයුම් සමාලෝචනය

3.1. කාර්යසාධනය

3.1.1. සැලසුම් කිරීම

වැන්දඹු අනත්දරු විශ්‍රාම වැටුප් ලාභීන්ට ප්‍රමාදයකින් තොරව විශ්‍රාම වැටුප් ලබාදීමට අමතරව අර්ධ රාජ්‍ය බැංකු සහ පෞද්ගලික අංශය සඳහා සේවක අර්ථ සාධක අරමුදලට අමතරව දායක විශ්‍රාම වැටුපක් හඳුන්වා දීම කල යුතු බවට 2020 අයවැය ඇස්තමේන්තුවේ දැක්වෙන සුවිශේෂ ප්‍රමුඛතා අනුව හඳුනාගෙන තිබුනද ක්‍රියාකාරී සැලැස්මෙහි එම ක්‍රියාකාරකම් ඇතුලත් කර නොතිබුණි. කෙටුම්පත් වාර්තාව සඳහා අධ්‍යක්ෂ ජනරාල්වරයා විසින් ලබාදුන් පිළිතුර අනුව දායකත්ව විශ්‍රාම වැටුප් ක්‍රමයක් හඳුන්වාදීම සඳහා සෘජුපෙළඹවීමක්, මඟපෙන්වීමක් හෝ නියෝගයක් මෙතෙක් විශ්‍රාම දෙපාර්තමේන්තුවට මෙතෙක් ලබා දී නොමැත.

පිටුව 9 | 16

### 3.1.2. වාර්ෂික කාර්යසාධන වාර්තාව

2020 අගෝස්තු 28 දිනැති අංක 2/2020 දරන රාජ්‍ය මුදල් චක්‍රලේඛයේ 10.2 ඡේදය ප්‍රකාරව රාජ්‍ය මුදල් දෙපාර්තමේන්තුව විසින් නිකුත් කළ මාර්ගෝපදේශ අංක 14 හි සඳහන් ආකෘතිය ප්‍රකාරව වාර්ෂික කාර්යසාධන වාර්තාව පිළියෙල කළ යුතුව තිබුණි. කෙසේවුවද, මූල්‍ය ප්‍රකාශන සමඟ ඉදිරිපත් කර තිබූ වාර්ෂික කාර්යසාධන වාර්තාව සහ රජයේ විගණන අංශය විසින් එක් එක් අංශයවලින් ස්වාධීනව ලබාගත් තොරතුරු සැසඳීමේදී පහත වෙනස්කම් නිරීක්ෂණය විය.

| අනු අංකය | විස්තරය | කාර්යසාධන වාර්තාව අනුව ශේෂය | අදාල අංශය විසින් ඉදිරිපත් කරන ලද තොරතුරු අනුව ශේෂය | වෙනස |
|---|---|---|---|---|
| | | රු. | රු. | රු. |
| 01 | රාජ්‍ය සේවා අර්ථසාධක අරමුදල සඳහා දෙසැම්බර් මස ලැබීම් | 61,399,468 | 61,457,155 | 57,687 |
| 02 | රාජ්‍ය සේවා අර්ථසාධක අරමුදලට අදාලව අප්‍රේල්, මැයි මාසවල ගෙවීම් | 38,364,041 | 22,364,041 | 16,000,000 |
| 03 | පොලී ආදායම | 30,360,072,498 | 31,562,748,355 | 1,202,675,857 |
| 04 | සිවිල් හා සංනද්ධ සේවා පාරිතෝෂික ගෙවීම් (i) සංඛ්‍යාව | 24,149 | 24,524 | 375 |
| | (ii) වටිනාකම | 26,237,294,814 | 26,808,301,923 | 571,007,109 |

## 3.2. ප්‍රසම්පාදනයන්

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

### 3.2.1. ඉදිකිරීම් කොන්ත්‍රාත් පරීක්ෂාව

( අ ) මුදල් රෙගුලාසි 701 (i) ප්‍රකාරව කොන්ත්‍රාත්තුව යන්නට නිම කිරීමේ කාලය හා ප්‍රමාද වෙනුවෙන් ප්‍රමාණ කල අලාභ වැනි කරුණු ඇතුළත්ව තිබිය යුතු බව දක්වා ඇති නමුත් ගිවිසුම්ගත පිරිවැය රු.5,909,881 ක් වූ ඉදිකිරීම් කොන්ත්‍රාත් 03 ක් පිළිබඳ නියැදි පරීක්ෂාවේදී එම කොන්ත්‍රාත් ගිවිසුම්වල මෙම වගන්ති ඇතුලත් කර නොතිබුණු බව නිරීක්ෂණය විය.

තවද, ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 8.12.2 ඡේදය පරිදි පිරිවිතර සහ එකඟ වී ඇති වෙනත් නියම සහ කොන්දේසිවලට අනුකූල බවට සහතික කරමින් වැඩ අවසන් කිරීමේ සහතිකයක් ඉංජිනේරුවරයා/ උපදේශකවරයා විසින් නිකුත් කළ යුතු බව දක්වා තිබුණත් මෙම කොන්ත්‍රාත්තු සම්බන්ධයෙන් එබදු සහතික නිකුත් කර නොතිබුණි.

(ආ) ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 2.14.1 සඳහා වූ ව්‍යතිරේක (Supplementary) 35 හි 2 ඡේදය ප්‍රකාරව ඉදිකිරීමේ කොන්ත්‍රාත් සඳහා මිලගණන් කැඳවීම ලියාපදිංචි කොන්ත්‍රාත්කරුවන්ගෙන් සිදුකළ යුතු නමුත් දෙපාර්තමේන්තුව විසින් කැළණිය වෙදමුල්ල නිවාඩු නිකේතනයේ නවීකරණය හා නඩත්තු කටයුතු සඳහා කොන්ත්‍රාත්කරුවකු තෝරා ගැනීමේදී, දුරකථන නාමාවලියේ ඇති කහ පැහැති හා දේදුණු පැහැති පිටුවල සඳහන් ආයතනවලින් තෝරා ගත් කොන්ත්‍රාත්කරුවන්ගෙන් මිල ගණන් 3 ක් කැඳවා කොන්ත්‍රාත්කරුවකු තෝරාගෙන තිබීම, මිල ගණන් කැඳවීමේදී සම්මත මිල කැඳවීමේ ලේඛන භාවිතා කර නොතිබීම, කාර්යසාධන සුරක්ෂිතයක් ඉදිරිපත් කර නොතිබීම, කොන්ත්‍රාත් ගිවිසුම සම්මත මිල කැඳවීමේ ලේඛන අනුව ඉදිරිපත් කර නොතිබීම යන අඩු පාඩු නිරීක්ෂණය විය.

### 3.3.1 මූල්‍ය අක්‍රමිකතා ස්වරූපයේ ගනුදෙනු

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ

(අ) ප්‍රාදේශීය ලේකම් කාර්යාල අකර විශ්‍රාමික ලිපිගොනුව මාරුකර තිබුණද දත්ත පද්ධතිය යාවත්කාලීන නොකිරීම හේතුවෙන් ගඟවට කෝරලය ප්‍රාදේශීය ලේකම් කාර්යාලයට අයත්

විශ්‍රාමිකයකු සඳහා 2004 අගෝස්තු සිට 2019 දෙසැම්බර් දක්වා විශ්‍රාම වැටුප් අංක 01-603037 සහ 01-1603037 යටතේ විශ්‍රාම වැටුප් දෙකක් සාවද්‍ය ලෙස ගෙවා තිබුණි. මූ.රෙ 104 පරීක්ෂණය මගින් 2008 ජනවාරි සිට 2019 දෙසැම්බර් දක්වා වැඩිපුර ගෙවන ලද මුදල රු. 2,169,551 ලෙස තක්සේරු කර තිබුණ නමුත් 2008 වර්ෂයට පෙර වූ මාස 41 ක කාලයක් සඳහා වැඩිපුර ගෙවන ලද විශ්‍රාම වැටුප් වටිනාකම ගණනය කර නොතිබුණි . මෙම විශ්‍රාමිකයා 2021 මාර්තු 02 දින මිය ගොස් තිබූ අතර විශ්‍රාම වැටුප නතර කල දින සිට මියගිය දිනය දක්වා ඔහුගෙන් අයකරගත් මුදල් අඩු කල පසුව තවදුරටත් රු.1,839,320 කට අධික හිඟ මුදල අයකර ගැනීමට පැවතුණි.

(ආ) 2011 මැයි 16 දිනැති විශ්‍රාම වැටුප් චක්‍රලේඛ 04/2011, 2012 දෙසැම්බර් 20 දිනැති විශ්‍රාම වැටුප් චක්‍රලේඛ අංක 05/2012 සහ 2014 නොවැම්බර් 03 දිනැති විශ්‍රාම වැටුප් චක්‍රලේඛ අංක 13/2014 යන චක්‍රලේඛ අනුව විශ්‍රාම වැටුප් කිහිපයක් ඒකාබද්ධව ලබාගන්නා විට ඒකාබද්ධ වැටුපට පමණක් අන්තර් දීමනාව ගෙවිය යුතුය. නියැදි විගණන පරීක්ෂණවලදී අනාවරනය කරගත් කරුණු අනුව ඊට පටහැනිව කටානා ප්‍රාදේශීය ලේකම් කාර්යාලයෙහි විශ්‍රාමිකයින් 03 දෙනෙකු සඳහා අන්තර් දීමනාව ලෙස වැඩිපුර ගෙවා තිබුණු වටිනාකමෙන් 2021 ජූනි 30 දිනට රු 867,317 ක් හිඟව තිබූ අතර වාරියපොල ප්‍රාදේශීය ලේකම් කාර්යාලය විසින් විශ්‍රාමිකයන් 03 දෙනෙකු වෙත වැඩිපුර ගෙවන ලද රු. 623,750 ක් වූ අන්තර් දීමනාව 2021 ජූනි මස වන තෙක් අය කර නොතිබුණි.

(ඇ) නියැදි විගණන පරීක්ෂණවලදී අනාවරනය කරගත් කරුණු අනුව මියයාම් ප්‍රමාද වී දැනුම්දීම මත විශ්‍රාම වැටුප් වැඩිපුර ගෙවීම් සිදු වී ඇත්ද යන්න පරීක්ෂා නොකිරීම හේතුවෙන් තිබ්බිරිගස්යාය ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ එක් විශ්‍රාමිකයකු සඳහා රු .352,030 ක විශ්‍රාම වැටුප් වැඩිපුර ගෙවා තිබුණ අතර විගණන දිනය වන විටත් එම වැඩිපුර ගෙවීම් අයකර ගැනීමට කටයුතු කර නොතිබුණි.

(ඈ ) විශ්‍රාමිකයා මිය ගිය බව දැනුම් දීම ප්‍රමාදවීම හේතුවෙන් විශ්‍රාම වැටුප් වැඩිපුර ගෙවා තිබූ නමුත් ඒ ටී එම (ATM) කාඩ්පත මගින් සහ බැංකු ගිණුම බද්ධ ගිණුම් වීම නිසා වෙනත් පුද්ගලයින් විසින් අයතා ලෙස එම මුදල් ලබා ගැනීම වැනි අවස්ථාවල බැංකු ගිණුමේ මුදල් නොමැති වීම නිසා වැඩිපුර ගෙවූ විශ්‍රාම වැටුප් අයකර ගැනීමට නොහැකි වී තිබුණි. තිබ්බිරිගස්යාය ප්‍රාදේශීය ලේකම් කාර්යාලයට අදාලව අවස්ථා 16 කදී වටිනාකම රු. 1,125,600 හා ශ්‍රී ජයවර්ධනපුර කෝට්ටේ ප්‍රාදේශීය ලේකම් කාර්යාලයට අදාලව අවස්ථා 13 කදී වටිනාකම රු 1,779,112 ක්

ලෙස එකතුව රු. 2,904,712 ක් 2020 දෙසැම්බර් 31 දිනට මෙසේ අයථා පරිදි මුදල් ලබාගත් පුද්ගලයන්ගෙන් අයකර ගැනීමට පැවති බව නියැදි විගණන පරීක්ෂාවලදී අනාවරණය විය

(ඉ) විශ්‍රාමිකයා මිය ගිය පසු දැනුම් දීම ප්‍රමාදවීම හේතුවෙන් විශ්‍රාම වැටුප්/වැන්දඹු විශ්‍රාම වැටුප් වැඩිපුර ගෙවා ඇති අවස්ථාවලදී ගිණුමේ මුදල් පවතීනම් නැවත එවන ලෙස අදාල බැංකුව වෙත දන්වා යවා තිබුණත් බැංකුව විසින් පිළිතුරු එවා නොතිබුණු අවස්ථාවල මුදල අය කර ගැනීමට ඉදිරි පියවර ගත යුතු වේ. කෙසේවුවද නියදි පරීක්ෂණවලදී නිරීක්ෂණය වූ පරිදි, තිඹිරිගස්යාය සහ ශ්‍රී ජයවර්ධනපුර කෝට්ටේ ලේකම් කාර්යාලවල අවස්ථා 94 ක දී වැඩිපුර ගෙවා තිබූ නමුත් අයකර ගැනීමට ක්‍රියාමාර්ග ගෙන නොතිබූ හිඟ මුදල රු. 8,643,512 ක් වී තිබුණි. මෙයින් ශ්‍රී ජයවර්ධනපුර කෝට්ටේ ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ වැඩි පුර ගෙවීම් සිදුවී ගත ව තිබූ කාලය වසර 1 ත් 4 ත් දක්වා වී තිබුණි.

(ඊ) ජීවිත සහතික ඉදිරිපත් නොකිරීම නිසා 2018 ජූලි සහ 2019 ජූනි මාසවල විශ්‍රාම වැටුප් දෙපාර්තමේන්තුව විසින් විශ්‍රාම වැටුප් නතර කරන ලද විශ්‍රාමිකයින් පිළිබඳ කරන ලද නියැදි පරීක්ෂාවේදී තිඹිරිගස්යාය ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ විශ්‍රාමිකයින් 10 දෙනෙකු සහ කඩුවෙල ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ විශ්‍රාමිකයින් තිදෙනෙකු මිය යාම හේතුවෙන් ජීවිත සහතික ඉදිරිපත් කර නොතිබුණු අතර විශ්‍රාමිකයාගේ මියයාම, ග්‍රාම නිලධාරී හෝ පවුල්වල ඥාතීන් විසින් වැටුප් අංශය වෙත දැනුම් නොදීම හේතුකොට ගෙන මියගිය දින සිට ප්‍රධාන කාර්යාලය මගින් විශ්‍රාම වැටුප් නතර කරන තෙක් එකතු වටිනාකම රු.5,050,228 ක මුදලක් වැඩිපුර ගෙවා තිබුණි . එසේ වැඩිපුර ගෙවූ මුදල් හඳුනාගෙන මුදල් රෙගුලාසි 103,104 ප්‍රකාරව කටයුතුකර නැවත අය කරගැනීමට ප්‍රාදේශීය ලේකම් කාර්යාලය විසින් කටයුතු කර නොතිබුණි.

(උ ) යටිනුවර ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ අංක 0-40-3031/0-06-3031 දරන විශ්‍රාමිකයාගේ 2015 නොවැම්බර් 01 සිට 2020 මාර්තු 31 දක්වා වැඩිපුර ගෙවන ලද අන්තර් දීමනාව රු.75,250 ක් වූ අතර ~~2021~~ ජූනි මස සිට රු. 1,500 බැගින් අය කිරීමට දත්ත පද්ධතියට ඇතුළත් කර ඇති අතර තවදුරටත් අයකරගතයුතු මුදල රු. 73,750 වී තිබුණි

3.3.2 පාඩු හා හානි

---------------
පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) මූල්‍ය ප්‍රකාශනවල සටහන් අංක එක අනුව සමාලෝචිත වර්ෂය අවසානය වන විට වැඩිපුර ගෙවන ලද විශ්‍රාම වැටුප්වලින් තවදුරටත් අයකර ගත යුතු මුදල රු.මිලියන 521 ක් වී තිබුණි.

පිටුව 13 | 16

මෙම ශේෂය, වර්ෂ 10 කට වඩා වැඩි කාලයක සිට පැවත එන රු.මිලියන 4.8 කින් ද, වර්ෂ 5 - 10 දක්වා කාල පරාසයක සිට පැවත එන රු.මිලියන 66 කින්ද, වර්ෂ 5 ක අඩු කාලයක් තුල අයකරගත යුතු රු. මිලියන 450 කින් ද සමන්විත විය.

(ආ) විශ්‍රාම වැටුප් දෙපාර්තමේන්තුවෙන් කරනු ලබන අයකිරීම්වල ප්‍රාදේශීය ලේකම් කාර්යාල 04 ක දෙපාර්තමේන්තු පොත් අනුව ශේෂය රු.1,998,087 ක් සහ පාඩු හා හානි ලේඛනය අනුව ශේෂය රු.1,826,567 ක් වූයෙන් පාඩු හා හානි ලේඛනය අනුව ශේෂය රු. 171,547 ක් අඩුවෙන්ද ,ප්‍රාදේශීය ලේකම් කාර්යාල 02 ක දෙපාර්තමේන්තු පොත් අනුව ශේෂය 1,741,957 ක් සහ පාඩු හා හානි ලේඛනය අනුව ශේෂය1,908,799 ක් වූයෙන් පාඩු හා හානි ලේඛනය අනුව ශේෂය රු. 166,842 කින් වැඩියෙන්ද දක්වා තිබුණි.

(ඇ) ගඟවට කෝරළේ ප්‍රාදේශීය ලේකම් කාර්යාලය මගින් මියගිය විශ්‍රාමිකයකු වෙනුවෙන් ගෙවා තිබූ රු. 93,600 ක් වූ වැඩිපුර ගෙවීම වලින් 2021 ජූලි 01 දිනට රු. 72,600 ක් තවදුරටත් අයකර ගත යුතුව පැවතුණි.

## 3.4 කළමනාකරණ දුර්වලතා

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) ගණේවත්ත ප්‍රාදේශීය ලේකම් කාර්යාලය විසින් අංක 4 – 50111 දරණ විශ්‍රාමිකයාගේ රු.6,855 ක් වූ මාසික යැපුම් දීමනාව රු.20,860 ක් බැගින් 2015 ජූලි 01 සිට 2020 අගෝස්තු 10 දක්වා කාලය තුල ගෙවීම හේතුවෙන් රු .687,790 ක් ලෙස වැඩිපුර ගෙවා තිබුණි. විශ්‍රාම වැටුප නවතා තිබූ කාලයට අදාල විශ්‍රාම වැටුප වන රු.128.553 ක මුදල හිලව් වූ පසු තවදුරටත් අයකළ යුතු මුදල රු. 559,236 ක් සම්බන්ධයෙන් මු.රෙ.104 පරීක්ෂණයක් පවත්වන ලෙස ප්‍රාදේශීය ලේකම් වෙත දැන්වීමට කටයුතු කර ඇතත් වැඩිපුර ගෙවූ මුදල අයකරගෙන නොතිබුණි.

( ආ ) විශ්‍රාම වැටුප් අංක 21-800003 යටතේ වැන්දඹු පුරුෂ විශ්‍රාම වැටුපක් ලබන විශ්‍රාමිකයා 2009-12-16 දින නැවත විවාහයක් සිදු කලද එය දැනුම් නොදීම හේතු කොටගෙන ඔහුට හිමිකම් ඇති වැන්දඹු පුරුෂ වැටුප ඔහුගේ දරුවාට අවු 18 සපිරෙන තෙක් දරුවාගේ බැංකු ගිණුමට කොටසක් හා ඉතිරිය භාරකරුට හිමි වන සේ සකස් කල යුතු වුවත් එසේ සිදු නොකර 2009 දෙසැම්බර් 16 දින සිට දරුවාට වයස අවුරුදු 26 සම්පූර්ණ වන 2019 පෙබරවාරි 24 දින දක්වාම දළ වශයෙන් ගෙවනු ලැබූ රු. 1,737,978 ක සම්පූර්ණ මුදල භාරකරු වෙතම ගෙවා තිබුණි.

(ඇ) කාර්යාල පරිශ්‍රයේ වර්ග අඩි 2868 ක් වූ බිම් ප්‍රමාණයක් කාර්යාල 5 කට කුලී පදනම මත ලබා දී තිබුණද කුලී ගිවිසුම්වලට එළඹ නොතිබුණි.

(ඈ) පරිශ්‍රයේ කුලී පදනම මත පවත්වාගෙන යන ආයතන 4 ක කුලී ගිවිසුම් කාලය අවසන් වී තිබුණද, 2020 දෙසැම්බර් 31 දින වන විටද එම ගිවිසුම් අලුත් කර ගැනීමට කටයුතු කර නොතිබුණි.

(ඉ) සෑම විශ්‍රාමිකයකු සඳහාම විශ්‍රාම වැටුප් ගොනුවක් පවත්වාගෙන යායුතු වුවද නියැදි පරීක්ෂාවලදී හෙළිදරව් වූ පරිදි තිබ්බටුගස්යාය ප්‍රාදේශිය ලේකම් කාර්යාලයෙහි විශ්‍රාමිකයින් 369 දෙනෙකුගේ විශ්‍රාම වැටුප් ලිපි ගොනු අස්ථානගත වී පැවතුණි.

(ඊ) විශ්‍රාම වැටුප් දත්ත පද්ධතියේ 2020 සැප්තැම්බර් මාසයේ ගෙවීම් දත්ත පද්ධතිය පරීක්ෂාවේදී හෙළිදරව් කරගත් පරිදි 'රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ අංක 6/2006 ට අනුව විශ්‍රාම වැටුප් සංශෝධනය නොකල ලිපිගොනු 3906 ක් විය. තවද, 2017 ජනවාරි 01 දිනට පෙර විශ්‍රාම ගනු ලැබූ සියලුම රාජ්‍ය නිලධාරින්ගේ විශ්‍රාම වැටුප්, රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ අංක 03/2016 සහ 14/2019 අනුව ගැලපීම, 2019 ජූනි 11 දිනැති අංක 01/2019 විශ්‍රාම වැටුප් චක්‍රලේඛය මගින් 2019 ජූලි 01 දින සිට සිදු කල යුතුව තිබුණද ජාතික හැඳුනුම්පත් අංක නොමැති වීම, යුද්ධය හා වෙනත් හේතු නිසා ලිපිගොනු අස්ථානගත වීම, වැටුප් සම්බන්ධ ගැටළු වැනි හේතු නිසා 2021 ජනවාරි 13 දින වන විට විශ්‍රාම වැටුප් සංශෝධනය නොකල ලිපිගොනු සංඛ්‍යාව 39,373 ක් වී තිබුණි.

## 3.5 මෙහෙයුම් අකාර්යක්ෂමතා

---

වැන්දඹු/වැන්දඹු පුරුෂ හා අනත්දරු විශ්‍රාම වැටුප් සඳහා දායක වී තිබෙන නිලධාරින් සම්බන්ධ දත්ත පද්ධතියක් පවත්වා ගැනීමට විශ්‍රාම වැටුප් දෙපාර්තමේන්තුව කටයුතු කර නොතිබුණි. ප්‍රතිලාභ ලැබීමට නියමිත සාමාජික සංඛ්‍යාව පිලිබඳ නිවැරදි තොරතුරු නොමැතිවීම හේතුවෙන් වැන්දඹු/වැන්දඹු පුරුෂ හා අනත්දරු විශ්‍රාම වැටුප් ක්‍රමය සඳහා හිමිකම් හා දායක මුදල් ආපසු ගෙවීම් යනාදී ප්‍රතිලාභ හිමිගැන්වීමේදී දායක මුදල් නිශ්චිතව, අඛණ්ඩව ලැබුනේද යන්න දෙපාර්තමේන්තුව තුලින් තහවුරු කර ගැනිමට නොහැකි වී තිබුණි.

පිටුව 15 | 16

## 4. යහපාලනය

### 4.1 අභ්‍යන්තර විගණනය

අභ්‍යන්තර විගණන සැලැස්ම අනුව සැලසුම් කරන ලද, මූල්‍ය පාලන ක්‍රමවේදය පිළිබඳව මූලික පරීක්ෂාව, නිවාඩු සහ අතිකාල පරීක්ෂාව, මහජන පැමිණිලි පෙත්සම් සම්බන්ධව කටයුතු කිරීම වැනි ක්‍රියාකාරකම් විශ්‍රාම වැටුප් දෙපාර්තමේන්තුවේ ක්‍රියාකාරී සැලැස්මේ ඇතුළත් නොවුණි. තවද, 2020 වර්ෂය සඳහා සකස් කරන ලද අභ්‍යන්තර විගණන සැලැස්මෙහි ආදායම් එකතුවීම් පරීක්ෂාව, පුහුණුවීම් සම්බන්ධ ක්‍රියාවලිය පරීක්ෂාව, ඉදිකිරීමේ කොන්ත්‍රාත් හා මිලදීගැනීම් පරීක්ෂාව යනාදී ක්ෂේත්‍ර කෙරෙහි අවධානය යොමුකර නොතිබුණි.

### 4.2 විගණන හා කළමනාකරණ කමිටුව

2020 වර්ෂය සඳහා විගණන හා කළමනාකරණ කමිටු එකක් පමණක් පවත්වා තිබුණි.

Ahangama.

ටී ජී අයි පද්මිණි
සහකාර විගණකාධිපති
විගණකාධිපති වෙනුවට.

පිටුව 16 | 16

ජාතික විගණන කාර්යාලය
தேசிய கணக்காய்வு அலுவலகம்
NATIONAL AUDIT OFFICE

මගේ අංකය / எனது இல. / My No. } එල්ඩබ/ඩ/ඩෂබ /02/20/51    ඔබේ අංකය / உமது இல. / Your No. }    දිනය / திகதி / Date } 2021 ජූලි 07 දින

විශ්‍රාම වැටුප් අධ්‍යක්ෂ ජනරාල්,

විශ්‍රාම වැටුප් දෙපාර්තමේන්තුව.

**රාජ්‍ය සේවා අර්ථසාධක අරමුදලේ 2020 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන සහ වෙනත් නෛතික හා නියාමන අවශ්‍යතා පිළිබඳව 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 11(1) වන වගන්තිය ප්‍රකාරව විගණකාධිපති සම්පිණ්ඩන වාර්තාව.**

---

**1. මූල්‍ය ප්‍රකාශන**

**1.1 මතය වියාචනය**

රාජ්‍ය සේවා අර්ථසාධක අරමුදලේ 2020 දෙසැම්බර් 31 දිනට ශේෂ පත්‍රය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ ආදායම් හා වියදම් ගිණුම සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා මුදල් ප්‍රවාහ ප්‍රකාශනය සහ මූල්‍ය ප්‍රකාශනවලට අදාළ සටහන්, සාරාංශගත වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්තිවලින් සමන්විත 2020 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන 1942 අංක 18 දරන රාජ්‍ය සේවා අර්ථසාධක අරමුදල් ආඥා පනතේ (621 අධිකාරියේ) 24(1) වගන්තිය සහ ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(3) ව්‍යවස්ථාව සමඟ සංයෝජිතව කියවිය යුතු 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154 (6) ව්‍යවස්ථාව ප්‍රකාරව මාගේ වාර්තාව යථා කාලයේදී පාර්ලිමේන්තුවේ සභාගත කරනු ලැබේ

අරමුදලේ මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මම මතයක් ප්‍රකාශ නොකරමි. මතය වියාචනය සඳහා පදනම කොටසේ සාකච්ඡා කර ඇති කරුණුවල වැදගත්කම හේතුවෙන් මෙම මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් විගණන මතයක් සඳහා පදනමක් සැපයීමට ප්‍රමාණවත් හා උචිත විගණන සාක්ෂි ලබා ගැනීමට මා හට නොහැකි විය.

අංක 306/72, පොල්දූව පාර, බත්තරමුල්ල, ශ්‍රී ලංකාව    இல. 306/72, பொல்துவ வீதி, பத்தரமுல்லை, இலங்கை.    No. 306/72, Polduwa Road, Battaramulla, Sri Lanka.
+94 11 2 88 70 28 - 34    +94 11 2 88 72 23    ag@auditorgeneral.gov.lk    www.naosl.gov.lk

### 1.2 විගණනය මතය සඳහා පදනම

පහත නිරීක්ෂණයන් කෙරේ.

(අ) ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරන ප්‍රමිත අංක 01 ප්‍රකාරව අදායම් වියදම් උපචිත පදනමට ගිණුම්ගත කල යුතු වුවත් මූල්‍ය ප්‍රකාශන වල ගිණුම්කරණ ප්‍රතිපත්ති 2.4 හි (ii) හි දායක මුදල් , මුදල් පදනමට ගිණුම්ගත කරන බව දක්වා තිබුණි. ඒ අනුව වර්ෂය තුල ලැබී තිබූ අනිවාර්ය දායක මුදල් රු.328,201,324 ක් මුදල් පදනමට ගිණුම්ගත කර තිබුණි.

(ආ) විගණනය සඳහා සාක්ෂි නොවීම.

පහත නිරීක්ෂණයන් කෙරේ.

(i) සේවක අර්ථසාධක අරමුදලේ දායකයින්ගේ කේවල ගිණුම් නිසි පරිදි පවත්වා ගැනීමට කටයුතු කර නොතිබීම හේතුවෙන් සමාලෝචිත වර්ෂයේ ආරම්භක හා අවසාන සාමාජික සංඛ්‍යාවන් තහවුරු කර ගැනීම සඳහා සාමාජික ලේඛනය විගණනයට ඉදිරිපත් නොවුණි. ඒ හේතුවෙන් 2020 දෙසැම්බර් 31 දිනට අනිවාර්ය දායක මුදල් ගිණුමේ ශේෂය රු. 28,972,771,536 ක්, ස්වේච්ඡා දායක මුදල් ගිණුමේ ශේෂය රු. 44,799,765 ක් හා රජයේ දායක මුදල් ගිණුමේ රු. 44,820,450,342 ක් වූ ශේෂයන් දායකයන්ගේ හිමිකම අනුව වෙන්කර හඳුනා ගැනීමට නොහැකි වී තිබුණි.

(ii) මාසික ගිණුම් සාරාංශ මගින් විවිධ රජයේ ආයතන විසින් අරමුදලේ ගිණුමට සිදු කරන ලද හර හා බැර කිරීම්වලට අදාළ හඳුනා නොගත් ශේෂ නිරවුල් කරන තෙක් ගැලපුම් ගිණුමක සටහන් කර තිබුණි. මේ අනුව 2020 දෙසැම්බර් 31 දිනට හඳුනා නොගත් ගැලපුම් ගිණුමෙහි පවතින වසර ගණනාවක සිට එකතුවෙමින් එන ශේෂය රු. 29,811,314 ක් විය. විස්තරාත්මක උපලේඛයක් ඉදිරිපත් නොකිරීම හේතුවෙන් එම ශේෂය පිළිබඳව විගණනයේදී සතුටුදායක ලෙස සන්නිරීක්ෂණය කිරීමට නොහැකි විය.

ඉහත විස්තර කර ඇති පරිදි ශේෂ පත්‍රයේ, ආදායම් හා වියදම් ගිණුමේ, මුදල් ප්‍රවාහ ප්‍රකාශනයේ ඇතුලත් ප්‍රමාණාත්මක අයිතම විකල්ප ක්‍රම මගින් තහවුරු කිරීමට හෝ සත්‍යාපනය කිරීමට මට නොහැකි විය. මේ හේතුවෙන්, ශේෂ පත්‍රය ආදායම් හා වියදම් ගිණුම සහ මුදල් ප්‍රවාහ ප්‍රකාශනය සැකසෙන වටිනාකම් හෝ අයිතමයන් වල වාර්තාගත හෝ වාර්තා නොකළ වටිනාකම් හෝ ගනුදෙනු සම්බන්ධයෙන් කිසියම් ගැලපීමක් කිරීමට අවශ්‍ය දැයි මට නිශ්චය කිරීමට නොහැකි විය.

### 1.3 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ කළමනාකරණයේ සහ පාලනය කරන පාර්ශවයන්ගේ වගකීම

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා රාජ්‍ය අංශයේ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවනු පිණිස අවශ්‍ය වන අභ්‍යන්තර පාලනයන් තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේදී, අරමුදල අඛණ්ඩව පවත්වාගෙන යාමේ හැකියාව තීරණය කිරීම කළමනාකරණයේ වගකීමක් වන අතර, කළමනාකාරීත්වය අරමුදල ඈවර කිරීමට අදහස් කරන්නේ නම් හෝ වෙනත් විකල්පයක් නොමැති විටදී මෙහෙයුම් නැවැත්වීමට කටයුතු කරන්නේ නම් හැර අඛණ්ඩ පැවැත්මේ පදනම මත ගිණුම් තැබීම හා අරමුදලේ අඛණ්ඩ පැවැත්මට අදාළ කරුණු අනාවරණය කිරීමද කළමනාකරණයේ වගකීමකි.

අරමුදලේ මූල්‍ය වාර්තාකරණ ක්‍රියාවලිය සම්බන්ධව පරීක්ෂා කිරීමේ වගකීම, පාලනය කරන පාර්ශවයන් විසින් දරනු ලබයි.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16 (1) උප වගන්තිය ප්‍රකාරව, අරමුදලේ වාර්ෂික සහ කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වාගෙන යා යුතුය.

### 1.4 මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට අනුකූලව පවත්වනු ලබන විගණනය මත පදනම්ව අරමුදලේ මූල්‍ය ප්‍රකාශන පිළිබඳව විගණකගේ වාර්තාව නිකුත් කිරීම මාගේ වගකීම වේ.

## 2. වෙනත් නෛතික හා නියාමන අවශ්‍යතා පිළිබඳ වාර්තාව

2.1 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ සඳහන් අවශ්‍යතාවයන් සම්බන්ධයෙන් විශේෂ ප්‍රතිපාදන ඇතුලත් වේ .

2.1.2 2018 අංක 19 දරණ ජාතික විගණන පනතේ 6 (1) (ඇ) (iii) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව අරමුදලේ මූල්‍ය ප්‍රකාශන ඉකුත් වර්ෂය සමඟ අනුරූප වේ.

3

2.1.3 2018 අංක 19 දරණ ජාතික විගණන පනතේ 6 (1) (ඇ) (iv) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව මෙම වාර්තාවේ 1.2 (අ) (ආ)ඡේදවල දැක්වෙන නිරීක්ෂණයන් හැර ඉකුත් වර්ෂයේදී මා විසින් සිදුකරන ලද නිර්දේශයන් ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත්ව ඇත.

## 3. මෙහෙයුම් සමාලෝචනය

### 3.1 කාර්යසාධනය

විශ්‍රාම වැටුප් නොලබන රජයේ සේවකයන් හට ප්‍රතිලාභ ප්‍රදානය කිරීම මූලික අරමුණුගතව රාජ්‍ය සේවා අර්ථසාධක අරමුදල පිහිටුවා තිබුණි. ඒ අනුව ප්‍රතිලාභ ලබා ගැනීම සඳහා අරමුදලේ සාමාජිකයන් විසින් ඉදිරිපත් කරන ලද අයදුම්පත්‍ර 5,188 ක් අතරින් අයදුම් පත්‍ර 987 ක් සඳහා සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දින වන විටද ගෙවීම් කර නොතිබුණි. ගෙවීම් කටයුතු ප්‍රමාද වීමට හේතුව කොවිඩ් වසංගත තත්ත්වය නිසා දෙපාර්තමේන්තුව වසා දැමීමට සිදුවීම මත නිලධාරීන් කැඳවීමට නොහැකි වීම බව අරමුදලේ සභාපතිවරයා විසින් අදහස් දක්වා තිබුණි.

ඩබ්ලිව්. පී .සී. වික්‍රමරත්න.
විගණකාධිපති

ජාතික විගණන කාර්යාලය
தேசிய கணக்காய்வு அலுவலகம்
NATIONAL AUDIT OFFICE

මගේ අංකය / எனது இல. / My No. } එල්ඊඩබ/ඩී/ඩබඊ/02/20/56    ඔබේ අංකය / உமது இல. / Your No. }    දිනය / திகதி / Date } 2021 ජුනි 30 දින

විශ්‍රාම වැටුප් අධ්‍යක්ෂ ජනරාල්,

විශ්‍රාම වැටුප් දෙපාර්තමේන්තුව.

**ගුරු වැන්දඹු අනත්දරු විශ්‍රාම වැටුප් අරමුදලේ 2020 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන සහ වෙනත් නෛතික හා නියාමන අවශ්‍යතා පිළිබඳව 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 11 (1) වන වගන්තිය ප්‍රකාරව විගණකාධිපති සම්පිණ්ඩන වාර්තාව**

---

**1. මූල්‍ය ප්‍රකාශන**

**1.1 තත්ත්වාගණනය කළ මතය**

ගුරු වැන්දඹු අනත්දරු විශ්‍රාම වැටුප් අරමුදලේ 2020 දෙසැම්බර් 31 දිනට ශේෂ පත්‍රය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ ආදායම් වියදම් ගිණුම සහ මූල්‍ය ප්‍රකාශනවලට අදාළ සටහන්, සාරාංශගත වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්තිවලින් සමන්විත 2020 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන 1953 අංක 44 දරන පාඨශාලීය ගුරුවරුන්ගේ විශ්‍රාම වැටුප් ආඥා පනතේ 5 හා 9 වගන්ති ප්‍රකාර පනවන ලද රෙගුලාසිවල 6(1) වගන්තිය සහ ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(3) ව්‍යවස්ථාව සමඟ සංයෝජිතව කියවිය යුතු 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ විධිවිධාන ප්‍රකාරව මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154 (6) ව්‍යවස්ථාව ප්‍රකාරව මාගේ වාර්තාව යථා කාලයේදී පාර්ලිමේන්තුවේ සභාගත කරනු ලැබේ.

මාගේ වාර්තාවේ තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම කොටසේ විස්තර කර ඇති කරුණු වලින් වන බලපෑම හැර, අරමුදලේ මූල්‍ය ප්‍රකාශන තුළින් 2020 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරිත්වය හා මුදල් ප්‍රවාහ ශ්‍රී ලංකා රාජ්‍ය අංශයේ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

අංක 306/72, පොල්දූව පාර, බත්තරමුල්ල, ශ්‍රී ලංකාව    இல. 306/72, பொல்தூவ வீதி, பத்தரமுல்லை, இலங்கை.    No. 306/72, Polduwa Road, Battaramulla, Sri Lanka.
+94 11 2 88 70 28 - 34    +94 11 2 88 72 23    ag@auditorgeneral.gov.lk    www.naosl.gov.lk

## 1.2 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම

අරමුදල විසින් ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරන ප්‍රමිත අංක 01 ක ප්‍රකාරව උපචිත පදනම මත ගිණුම් තබන බව මූල්‍ය ප්‍රකාශනවල හෙළිදරව් කර තිබුණද, එයට පටහැනිව, උපකාන පාසල් 3 කට අදාලව 1988 වර්ෂයේ සිට 2019 වර්ෂය දක්වා කාලයට අදාලව ලැබී තිබූ රු.1,631,064 ක් වූ දායක මුදල් අදායම් වියදම් ගිණුමෙහි වර්ෂයේ දායක මුදල් ලෙස ගිණුම්ගත කර තිබුණි. තවද, පූර්ව වර්ෂයන්ට අදාළව 2021 වර්ෂයේදී උපකාන පාසලකින් ලැබී තිබූ රු.1,552,883 ක් සහ පූර්ව වර්ෂයන්ට අදාලව තවදුරත් ලැබිය යුතු දායක මුදල් රු.182,790 ක් ලෙස එකතුව රු.1,735,673 ක් ලැබිය යුතු දායක මුදල් ලෙස සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රකාශවල දක්වා නොතිබුණි.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර) අනුකූලව මා විගණනය සිදු කරන ලදී. මෙම විගණන ප්‍රමිති යටතේ වූ මාගේ වගකීම, මෙම වාර්තාවේ මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම යන කොටසේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ තත්ත්වාගණනය කළ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

## 1.3 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ කළමනාකරණයේ සහ පාලනය කරන පාර්ශවයන්ගේ වගකීම

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා රාජ්‍ය අංශයේ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවනු පිණිස අවශ්‍ය වන අභ්‍යන්තර පාලනයන් තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේදී, අරමුදල අඛණ්ඩව පවත්වාගෙන යාමේ හැකියාව තීරණය කිරීම කළමනාකරණයේ වගකීමක් වන අතර, කළමනාකාරිත්වය අරමුදල ඇවර කිරීමට අදහස් කරන්නේ නම් හෝ වෙනත් විකල්පයක් නොමැති විටදී මෙහෙයුම් නැවැත්වීමට කටයුතු කරන්නේ නම් හැර අඛණ්ඩ පැවැත්මේ පදනම මත ගිණුම් තැබීම හා අරමුදලේ අඛණ්ඩ පැවැත්මට අදාළ කරුණු අනාවරණය කිරීමද කළමනාකරණයේ වගකීමකි.

අරමුදලේ මූල්‍ය වාර්තාකරණ ක්‍රියාවලිය සම්බන්ධව පරීක්ෂා කිරීමේ වගකීම, පාලනය කරන පාර්ශවයන් විසින් දරනු ලබයි.

2

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16 (1) උප වගන්තිය ප්‍රකාරව, අරමුදලේ වාර්ෂික සහ කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වාගෙන යා යුතුය.

## 1.4 මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම

---

සමස්තයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා සහ වැරදි නිසා ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණන වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සැමවිටම ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් අනාවරණය කරගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවිය හැකි අතර, එහි ප්‍රමාණාත්මක භාවය මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කරගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි වන බලපෑම මත රඳා පවතී.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනයේ කොටසක් ලෙස මා විසින් විගණනයේදී වෘත්තීය විනිශ්වය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ක්‍රියා කරන ලදී. මා විසින් තවදුරටත්,

- ප්‍රකාශ කරන ලද විගණන මතයට පදනමක් සපයා ගැනීමේදී වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවීමේ අවදානම් හඳුනාගැනීම හා තක්සේරු කිරීම සඳහා අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලැසුම් කර ක්‍රියාත්මක කරන ලදී. වරදවා දැක්වීම හේතුවෙන් සිදුවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නා වූ බලපෑම ප්‍රබල වන්නේ ඒවා දූස්සන්ධානයෙන්, ව්‍යාජ ලේඛන සැකසීමෙන්, චේතනාන්විත මඟහැරීමෙන්, වරදවා දැක්වීමෙන් හෝ අභ්‍යන්තර පාලනයන් මඟ හැරීමෙන් වැනි හේතු නිසා වන බැවිනි.

- අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමේ අදහසින් නොවුවද, අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස අභ්‍යන්තර පාලනය පිළිබඳව අවබෝධයක් ලබාගන්නා ලදී.

- භාවිතා කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය, ගිණුම්කරන ඇස්තමේන්තුවල සාධාරණත්වය සහ කළමනාකරණය විසින් කරන ලද සම්බන්ධිත හෙළිදරව් කිරීම් අගයන ලදී.

3

- සිද්ධීන් හෝ තත්ත්වයන් හේතුවෙන් අරමුදලේ අඛණ්ඩ පැවැත්ම පිළිබද ප්‍රමාණාත්මක අවිනිශ්චිතතාවයක් තිබේද යන්න සම්බන්ධයෙන් ලබාගත් විගණන සාක්ෂි මත පදනම්ව ගිණුම්කරණය සඳහා ආයතනයේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ පදනම යොදා ගැනීමේ අදාලත්වය තීරණය කරන ලදී. ප්‍රමාණවත් අවිනිශ්චිතතාවයක් ඇති බවට මා නිගමනය කරන්නේ නම් මූල්‍ය ප්‍රකාශනවල ඒ සම්බන්ධයෙන් වූ හෙළිදරව්කිරීම් වලට මාගේ විගණන වාර්තාවේ අවධානය යොමු කළ යුතු අතර, එම හෙළිදරව්කිරීම් ප්‍රමාණවත් නොවන්නේ නම් මාගේ මතය විකරණය කළ යුතුය. කෙසේ වුවද, අනාගත සිද්ධීන් හෝ තත්ත්වයන් මත අඛණ්ඩ පැවැත්ම අවසන් විමට හැකිය.

- මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය හා අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත් වී ඇති බව සහ හෙළිදරව් කිරීම් ඇතුලත් මූල්‍ය ප්‍රකාශනවල සමස්ථ ඉදිරිපත් කිරීම අගයන ලදී.

  මාගේ විගණනය තුළදී හදුනාගත් වැදගත් විගණන සොයාගැනීම්, ප්‍රධාන අභ්‍යන්තර පාලන දූර්වලතා හා අනෙකුත් කරුණු පිළිබඳව පාලනය කරනු ලබන පාර්ශවයන් දැනුවත් කරමි.

## 2. වෙනත් නෛතික හා නියාමන අවශ්‍යතා පිළිබඳ වාර්තාව

2.1 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ පහත සඳහන් අවශ්‍යතාවයන් සම්බන්ධයෙන් විශේෂ ප්‍රතිපාදන ඇතුලත් වේ .

2.1.1 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 6 (1) (ඈ) (iii) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව අරමුදලේ මූල්‍ය ප්‍රකාශන ඉකුත් වර්ෂය සමඟ අනුරූප වේ.

2.1.2 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 6 (1) (ඈ) (iv) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව ඉකුත් වර්ෂයේදී මා විසින් සිදුකරන ලද නිර්දේශයන් ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත්ව ඇත.

4

## 3. මෙහෙයුම් සමාලෝචනය

### 3.1 නීති, රීති හා රෙගුලාසිවලට අනුකූල නොවීම

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) 1953 අංක 44 දරණ පාඨශාලීය ගුරුවරුන්ගේ විශ්‍රාම වැටුප් පනත අනුව පනවන ලද නියෝග අංක 9 (අ) නියෝග ප්‍රකාරව එක් එක් ආධාර මුදල් ගෙවීමට සුදුසුකම් ලැබූ හා මුදල් ගෙවන්නන් පිළිබඳ තොරතුරු ඇතුළත් ලේඛනයක් පවත්වා නොතිබුණි.

(ආ) 1953 අංක 44 දරන පාසල් ගුරුවරුන්ගේ විශ්‍රාම වැටුප් පනත් නියෝග අංක 04 ප්‍රකාරව ගුරු වැන්දඹු අනත්දරු දායක මුදල්වලින් අරමුදලක් ගොඩනගා එමගින් ගුරු වැන්දඹු අනත්දරු විශ්‍රාම වැටුප් ගෙවීම් කළ යුතුයි. එසේ වුවද දායක මුදල් රැස් කිරීම හා ගෙවීම් කිරීම සඳහා අරමුදල වෙනුවෙන් වෙනම බැංකු ගිණුමක් පවත්වාගෙන ගොස් නොතිබූ අතර, දායක මුදල් විශ්‍රාම වැටුප් අධ්‍යක්ෂ ජනරාල්ගේ බැංකු ගිණුමට රැස්කර තිබීම හා උක්ත වියදම් විශ්‍රාම වැටුප් දෙපාර්තමේන්තු වැය ශීර්ෂය යටතේ ගෙවීම් කිරීමත් සිදු කර තිබුණි.

### 3.2 කළමනාකරණ ක්‍රියාකාරකම්

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) උපකාත පාසලක, අරමුදලේ සාමාජිකත්වය ලබාගැනීම පිළිබඳ නියැදි පරීක්ෂාවකදී වැන්දඹු අනත්දරු අරමුදලට දායක මුදල් ලබා දී තිබුණද, එම සාමාජිකයින් වෙනුවෙන් දායක සාමාජික අංක ලබා දී නොතිබුණි.

(ආ) දායක මුදල් ලැබීම් විස්තර ඇතුළත්, අරමුදලේ සාමාජිකත්වය පිළිබඳව දත්ත පද්ධතියක් අරමුදල සතු නොවීම හේතුවෙන්, දායක මුදල් ආපසු ගෙවීමේදී දායකයාගෙන් අයකරගත් මුදල් ප්‍රමාණය චර්යා සටහන පරීක්ෂා කර ගෙවීමට කටයුතු කළද, එම මුදල් ප්‍රමාණයම නිවැරදිව අරමුදලට ලැබුණේද යන්න තහවුරු කර ගත නොහැකි වී තිබුණි.

ඩබ්ලිව්.පී.සී. වික්‍රමරත්න
විගණකාධිපති

5

ජාතික විගණන කාර්යාලය
தேசிய கணக்காய்வு அலுவலகம்
NATIONAL AUDIT OFFICE

මගේ අංකය / எனது இல. / My No. } එල්ඊඩබ/ඩී/ඩීඔපී/0. 20/59 ඔබේ අංකය / உமது இல. / Your No. } දිනය / திகதி / Date } 2021 සැප්තැම්බර් 10 දින

විශ්‍රාම වැටුප් අධ්‍යක්ෂ ජනරාල්,

විශ්‍රාම වැටුප් දෙපාර්තමේන්තුව.

**පළාත් පාලන සේවා විශ්‍රාම වැටුප් අරමුදලේ 2020 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන සහ වෙනත් නෛතික හා නියාමන අවශ්‍යතා පිළිබඳව 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 11(1) වන වගන්තිය ප්‍රකාරව විගණකාධිපති සම්පිණ්ඩන වාර්තාව**

---

**1. මූල්‍ය ප්‍රකාශන**

**1.1 තත්ත්වාගණනය කළ මතය**

පළාත් පාලන සේවා විශ්‍රාම වැටුප් අරමුදලේ 2020 දෙසැම්බර් 31 දිනට ශේෂ පත්‍රය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ ආදායම් හා වියදම් ගිණුම සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා මුදල් ප්‍රවාහ ප්‍රකාශනය සහ මූල්‍ය ප්‍රකාශනවලට අදාළ සටහන්, සාරාංශගත වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්තිවලින් සමන්විත 2020 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන පිළිබඳව පළාත් පාලන සේවා ආඥා පනතේ (264 අධිකාරියේ) 62 වගන්තිය සමඟ සංයෝජිතව කියවිය ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(3) ව්‍යවස්ථාව සහ 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ විධිවිධාන ප්‍රකාරව මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(6) ව්‍යවස්ථාවේ ප්‍රකාරව මාගේ වාර්තාව යථා කාලයේදී පාර්ලිමේන්තුවේ සභාගත කරනු ලැබේ.

මෙම වාර්තාවේ තත්ත්වාගණනය සඳහා පදනම් කොටසේ විස්තර කර ඇති කරුණුවලින් වන බලපෑම් හැර, අරමුදලේ 2020 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරීත්වය හා මුදල් ප්‍රවාහ ශ්‍රී ලංකා රාජ්‍ය අංශයේ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

අංක 306/72, පොල්දූව පාර, බත්තරමුල්ල, ශ්‍රී ලංකාව. இல. 306/72, பொல்தூவ வீதி, பத்தரமுல்லை, இலங்கை. No. 306/72, Polduwa Road, Battaramulla, Sri Lanka.
+94 11 2 88 70 28 - 34 +94 11 2 88 72 23 ag@auditorgeneral.gov.lk www.naosl.gov.lk

## 1.2 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම

(අ) රාජ්‍ය අංශ ගිණුම්කරන ප්‍රමිත අංක 01 ක ප්‍රකාරව අරමුදල විසින් උපචිත පදනම මත ගිණුම් තැබිය යුතු වුවද, ආදායම් හා වියදම් ගිණුමේ සමාලෝචිත වර්ෂය සඳහා ලැබිය යුතු දායක මුදල රු. 72,558,585 ක් උපචිත පදනම මත නියමිත පරිදි බැර කර තිබුණද වර්ෂය තුළදී ලැබී තිබුණු පූර්ව වර්ෂවලට හා මෙම වර්ෂයට අදාළ දායක මුදල් රු.75,230,921 ක් එම ගිණුමට බැර කර තිබුණි. මේ අනුව ඇතිවූ වෙනස රු.2,672,336 ක් වර්ෂයේ ඌනතාවය ලෙස හඳුනාගෙන තිබුණි.

(ආ) මූල්‍ය ප්‍රකාශ අනුව 2020 දෙසැම්බර් 31 දිනට අරමුදලට දායක මුදල් ගෙවනු ලබන පළාත් පාලන ආයතන සංඛ්‍යාව 302 ක් වූ අතර එම ආයතනවලින් අයකර ගත යුතු හිඟ දායක මුදල රු.1,143,420,252 ක් විය. එසේ වුවද, 2020 දෙසැම්බර් 31 දිනට පළාත් පාලන ආයතන 256 කින් විගණනයට ඉදිරිපත් කර තිබූ මූල්‍ය ප්‍රකාශ අනුව, පළාත් පාලන ආයතන 97 කින් අරමුදලට ලැබිය යුතු දායක මුදල් රු.760,406,356 ක් වුවද, එම වටිනාකම පළාත් පාලන ආයතනවල ගෙවිය යුතු දායක මුදල් ලෙස දක්වා නොතිබුණි. තවත් පළාත් පාලන ආයතන 103 කින් අරමුදලට ලැබිය යුතු දායක මුදල් වටිනාකම රු.278,494,348 වුවත් එම පළාත් පාලන ආයතනවල මූල්‍ය ප්‍රකාශන අනුව ගෙවිය යුතු දායක මුදල් වටිනාකම රු.184,054,767ක් වූයෙන් රු.94,439,581 ක් වැඩියෙන්ද, පළාත් පාලන ආයතන 22 කින් අරමුදලට ලැබිය යුතු දායක මුදල් වටිනාකම රු. 14,868,309 ක් වුවත් එම පළාත් පාලන ආයතන වල මූල්‍ය ප්‍රකාශන අනුව ගෙවිය යුතු දායක මුදල් වටිනාකම රු. 19,567,394 ක් වූයෙන් රු. 4,699,085 ක් අඩුවෙන් ද දක්වා තිබුණි.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර) අනුකූලව මා විගණනය සිදු කරන ලදී. මෙම විගණන ප්‍රමිති යටතේ වූ මාගේ වගකීම, මෙම වාර්තාවේ මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම යන කොටසේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

## 1.3 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ කළමනාකරණයේ සහ පාලනය කරන පාර්ශවයන්ගේ වගකීම

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා රාජ්‍ය අංශයේ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවනු පිණිස අවශ්‍ය වන අභ්‍යන්තර පාලනයන් තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේදී, අරමුදල අඛණ්ඩව පවත්වාගෙන යාමේ හැකියාව තීරණය කිරීම කළමනාකරණයේ වගකීමක් වන අතර, කළමනාකාරිත්වය අරමුදල ඈවර කිරීමට අදහස් කරන්නේ නම් හෝ වෙනත් විකල්පයක් නොමැති විටදී මෙහෙයුම් නැවැත්වීමට කටයුතු කරන්නේ නම් හැර අඛණ්ඩ පැවැත්මේ පදනම මත ගිණුම් තැබීම හා අරමුදලේ අඛණ්ඩ පැවැත්මට අදාළ කරුණු අනාවරණය කිරීමද කළමනාකරණයේ වගකීමකි.

අරමුදලේ මූල්‍ය වාර්තාකරණ ක්‍රියාවලිය සම්බන්ධව පරීක්ෂා කිරීමේ වගකීම, පාලනය කරන පාර්ශවයන් විසින් දරනු ලබයි.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16 (1) උප වගන්තිය ප්‍රකාරව, අරමුදලේ වාර්ෂික සහ කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්. වියදම්, වත්කම් හා බැරකම් පිළිබද නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වාගෙන යා යුතුය.

## 1.4 මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම

සමස්තයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා සහ වැරදි නිසා ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණන වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සැමවිටම ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් අනාවරණය කරගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවිය හැකි අතර, එහි ප්‍රමාණාත්මක භාවය මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කරගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි වන බලපෑම මත රඳා පවතී.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනයේ කොටසක් ලෙස මා විසින් විගණනයේදී වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ක්‍රියා කරන ලදී. මා විසින් තවදුරටත්,

ප්‍රකාශ කරන ලද විගණන මතයට පදනමක් සපයා ගැනීමේදී වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවීමේ අවදානම් හඳුනාගැනීම හා තක්සේරු කිරීම සඳහා අවස්ථාචෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කර ක්‍රියාත්මක කරන ලදී. වරදවා දැක්වීම හේතුවෙන් සිදුවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නා වූ බලපෑම ප්‍රබල වන්නේ ඒවා දුස්සන්ධානයෙන්, ව්‍යාජ ලේඛන සැකසීමෙන්, චේතනාන්විත මගහැරීමෙන්, වරදවා දැක්වීමෙන් හෝ අභ්‍යන්තර පාලනයන් මග හැරීමෙන් වැනි හේතු නිසා වන බැවින්,

පිටුව 3 | 5

- අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමේ අදහසින් නොවූවද, අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස අභ්‍යන්තර පාලනය පිළිබඳව අවබෝධයක් ලබාගන්නා ලදී.
- භාවිතා කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය, ගිණුම්කරන ඇස්තමේන්තුවල සාධාරණත්වය සහ කළමනාකරණය විසින් කරන ලද සම්බන්ධිත හෙළිදරව් කිරීම් අගයන ලදී.
- සිද්ධීන් හෝ තත්ත්වයන් හේතුවෙන් අරමුදලේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ ප්‍රමාණාත්මක අවිනිශ්චිතතාවයක් තිබේද යන්න සම්බන්ධයෙන් ලබාගත් විගණන සාක්ෂි මත පදනම්ව ගිණුම්කරණය සඳහා අරමුදලේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ පදනම යොදා ගැනීමේ අදාලත්වය තීරණය කරන ලදී. ප්‍රමාණවත් අවිනිශ්චිතතාවයක් ඇති බවට මා නිගමනය කරන්නේ නම් මූල්‍ය ප්‍රකාශනවල් ඒ සම්බන්ධයෙන් වූ හෙළිදරව්කිරීම් වලට මාගේ විගණන වාර්තාවේ අවධානය යොමු කළ යුතු අතර, එම හෙළිදරව්කිරීම් ප්‍රමාණවත් නොවන්නේ නම් මාගේ මතය විකරණය කළ යුතුය. කෙසේ වුවද, අනාගත සිද්ධීන් හෝ තත්ත්වයන් මත අඛණ්ඩ පැවැත්ම අවසන් වීමට හැකිය.
- මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය හා අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත් වී ඇති බව සහ හෙළිදරව් කිරීම් ඇතුලත් මූල්‍ය ප්‍රකාශනවල සමස්ථ ඉදිරිපත් කිරීම අගයන ලදී.

මාගේ විගණනය තුළදී හඳුනාගත් වැදගත් විගණන සොයාගැනීම්, ප්‍රධාන අභ්‍යන්තර පාලන දුර්වලතා හා අනෙකුත් කරුණු පිළිබඳව පාලනය කරනු ලබන පාර්ශවයන් දැනුවත් කරමි.

## 2. වෙනත් නෛතික හා නියාමන අවශ්‍යතා පිළිබඳ වාර්තාව

---

2.1 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ පහත සඳහන් අවශ්‍යතාවයන් සම්බන්ධයෙන් විශේෂ ප්‍රතිපාදන ඇතුලත් වේ.

2.1.2 2018 අංක 19 දරණ ජාතික විගණන පනතේ 6 (1) (ඈ) (iii) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව අරමුදලේ මූල්‍ය ප්‍රකාශන ඉකුත් වර්ෂය සමඟ අනුරූප වේ.

2.1.3 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 6 (1) (ඈ) (iv) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව මෙම වාර්තාවේ 1.2. (අ) ඡේදයේ දැක්වෙන නිරීක්ෂණයන් හැර ඉකුත් වර්ෂයේදී මා විසින් සිදුකරන ලද නිර්දේශයන් ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත්ව ඇත.

3. මෙහෙයුම් සමාලෝචනය

3.1. නීති,රීති හා රෙගුලාසිවලට අනුකූල නොවීම.

(අ) 2018 අගෝස්තු 28 දිනැති හා අංක 2/2018 දරන රාජ්‍ය මුදල් චක්‍රලේඛයේ 5 ඡේදය අනුව පසුගිය වසර 2 තුල ක්‍රියාත්මක නොවූනු යම් අරමුදල් පවතින්නේ නම් එකී අරමුදල් වල කටයුතු අවසන් කල යුතු බව හා 2020 අගෝස්තු 28 දිනැති . අංක 1/2020 දරන රාජ්‍ය මුදල් චක්‍රලේඛයේ 15 (2) (ආ) ඡේදය අනුව අරමුදල් මගින් අපේක්ෂිත අරමුණු රජයේ අයවැය යටතේ ඉටුකර ගත හැකි නම් එකී අරමුදල් වල කටයුතු අවසන් කල යුතු බවද දක්වා තිබුණි. .ඒඃ අනුව මෙම අරමුදලේ කටයුතු විශ්‍රාම වැටුප් දෙපාර්තමේන්තු වැය ශීර්ෂය යටතේ අයවැය ප්‍රතිපාදන සලසාගෙන සිදු කරන බැවින් හා අරමුදල් අක්‍රිය තත්වයේ පවතින බව ගිණුම් සටහන් අංක 4 මගින් හෙලිදරව් කර ඇතත් පවතින චක්‍රලේඛ ප්‍රතිපාදන යටතේ අරමුදල වසා දැමීම සඳහා අවශ්‍ය කටයුතු සිදුකර නොතිබුණි.

3.2 ලැබිය යුතු ගිණුම්

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) 2012 පෙබරවාරි 08 දිනැති අංක 01/2012 දරන විශ්‍රාම වැටුප් චක්‍රලේඛය පරිදි ඒ ඒ මාසයේ අරමුදලට අදාල සාමාජිකයන්ගේ මියයෑම් පිළිබඳ වාර්තා ඊළඟ මාසයේ 25 දිනට පෙර දිස්ත්‍රික් ලේකම්වරුන්ගෙන් ගෙන්වාගෙන එම වාර්තා අනුව කාලීනව මියයෑම් ගැලපීමට පියවර ගත යුතුය. එසේ වුවද වාර්ෂිකව එම ගැලපීම සිදු නොකිරීම හේතුවෙන් සමාලෝචිත වර්ෂයේදී 2014 වර්ෂයේ සිට 2020 වර්ෂය අතර කාලයේදී මියගිය සාමාජිකයන් 647 කට අදාලව රු 2,306,611 ක් ලැබිය යුතු දායක කපා හැර තිබුණි.

(ආ) 2020 දෙසැම්බර් 31 දිනට මූල්‍ය ප්‍රකාශනය අනුව පළාත් පාලන ආයතන 302 කින් ලැබිය යුතු දායක මුදල් රු.1,143,420,252 ක් විය. එම ශේෂය සම්බන්ධයෙන් මූල්‍ය ප්‍රකාශනය සමඟ ඉදිරිපත් කර තිබූ උපලේඛන අනුව පළාත් පාලන ආයතන 88 කින් ලැබිය යුතු රු. 459,007,662 ක දායක මුදල් සම්බන්ධයෙන් වූ කිසිදු මුදලක් සමාලෝචිත වර්ෂයේදී ලැබී නොතිබුණි.

ඩබ්ලිව්. පී. සී. වික්‍රමරත්න
විගණකාධිපති

පිටුව 5 | 5

4

# කාර්ය සාධන දර්ශක

## 4.1. ආයතනයේ කාර්ය සාධන දර්ශක (ක්‍රියාකාරී සැලැස්ම මත පදනම්ව)

| ක්‍රියාකාරකම | උප ක්‍රියාකාරකම | කාර්ය සාධන දර්ශක | ඇස්තමේන්තු ගත ප්‍රමාණය | අපේක්ෂිත නිමැවුමේ ප්‍රතිශතයක් (%) ලෙස සත්‍ය නිමැවුම | | | |
|---|---|---|---|---|---|---|---|
| | | | | 100%-90% | 75%-89% | 50%-74% | 49% ට අඩු |
| නව විශ්‍රාම වැටුප් ප්‍රදානය | විශ්‍රාම වැටුප් ප්‍රදානය - විමධ්‍යගත | 2020 වර්ෂයේ විශ්‍රාම වැටුප් ප්‍රදාන ලබාගත් විශ්‍රාමිකයින් ගණන | 30,000 | | 82.05% | | |
| | විශ්‍රාම වැටුප් ප්‍රදානය- මධ්‍යගත | | 1,500 | | | 68.60% | |
| | වැන්දඹු අනත්දරු විශ්‍රාම වැටුප් ප්‍රදානය | | 8,000 | 94.87% | | | |
| සංශෝධන ගෙවීම් | විශ්‍රාම වැටුප් සංශෝධන - විමධ්‍යගත | ගෙවූ සංශෝධිත විශ්‍රාම වැටුප් ප්‍රමාණය | 5,000 | | | | *** 32.22% |
| | විශ්‍රාම වැටුප් සංශෝධන - මධ්‍යගත | | 600 | | | | *** 32% |
| පාරිතෝෂික හා වෙනත් ගෙවීම් | මරණ පාරිතෝෂිකය | | 1,100 | 100.27% | | | |
| | ආබාධිත විශ්‍රාම වැටුප් | | 5,000 | 93.24% | | | |
| | සත්කාර පියස | සම්මුඛ පරීක්ෂණයට කැඳවන ලද සංඛ්‍යාව | 30,000 | | | 67.64% | |
| මාසික විශ්‍රාම වැටුප් | මාසික විශ්‍රාම වැටුප් සිවිල් | මාසිකව ප්‍රතිලාභ ලද විශ්‍රාමිකයින් ගණන | 460,000 | 100% | | | |
| | පාරිතෝෂික ගෙවීම හා ණය වාරික | මාසිකව ප්‍රතිලාභ ලද විශ්‍රාමිකයින් ගණන | 30,000 | | 83.35% | | |
| සමාජ සුභසාධන | ත්‍රිවිධ හමුදා සහ පොලිස් | මාසිකව ප්‍රතිලාභ ලද පුද්ගලයින් ගණන | 42,183 | 97% | | | |
| වැන්දඹු හා අනත්දරු විශ්‍රාම වැටුප් | වැන්දඹු හා අනත්දරු විශ්‍රාම වැටුප් ගෙවීම | මාසිකව ප්‍රතිලාභ ලද පුද්ගලයින් ගණන | 185,000 | 100% | | | |
| වැන්දඹු හා අනත්දරු දායක මුදල් අදායම : ආදායම් රැස් කිරීම | මධ්‍යම රජය | මාසික අදායම | 19000* | 102.41% | | | |
| | පළාත් සභා | මාසික අදායම | 11700* | 94.18% | | | |
| | ගුරු වැන්දඹු අනත්දරු | මාසික අදායම | 104* | 231.96% | | | |

| ක්‍රියාකාරකම | උප ක්‍රියාකාරකම | කාර්ය සාධන දර්ශක | ඇස්තමේන්තු ගත ප්‍රමාණය | අපේක්ෂිත නිමැවුමේ ප්‍රතිශතයක් (%) ලෙස සත්‍ය නිමැවුව | | | |
|---|---|---|---|---|---|---|---|
| | | | | 100%-90% | 75%-89% | 50%-74% | 49% ට අඩු |
| වැන්දඹු හා අනත්දරු දායක මුදල් ආපසු ගෙවීම. | සිවිල් | ප්‍රතිලාභීන් සංඛ්‍යාව | 1500 | | | 59.13% | |
| | හමුදා | ප්‍රතිලාභීන් සංඛ්‍යාව | 1300 | | | 74.85% | |
| | ගුරු වැන්දඹු අනත්දරු | ප්‍රතිලාභීන් සංඛ්‍යාව | 40 | | | 67.50% | |
| රාජ්‍ය සේවා අර්ථසාධක අරමුදල | රා.සේ.අ.අ. සාමාජිකයින් සංඛ්‍යාව | වාර්ෂික නව සාමාජිකයින් සංඛ්‍යාව | 7,000 | 116.08% | | | |
| | දායක මුදල් ගෙවීම් | ප්‍රතිලාභීන් සංඛ්‍යාව | 7,200 | | | | *** 49.73% |
| | දායක මුදල් ලැබීම් | මාසික දායකත්වය 8% හා 12% | 760* | 112% | | | |
| | ආයෝජන | වර්ෂය තුල සිදු කරන ලද නව ආයෝජන | 6400* | 114.75% | | | |
| මානව සම්පත් සංවර්ධනය | ලිපිගොනු කළමනාකරණය | ලිපිගොනු යාවත්කාලීන කිරීම | | 100% | | | |
| | ධාරිතා සංවර්ධනය | පුහුණු සැලැස්මට අනුව පුහුණු වැඩසටහන් පැවැත්වීම | | | | 60% | |
| පද්ධති සංවර්ධන කටයුතු | පද්ධති නඩත්තු කටයුතු | පද්ධතිවල නිවැරදි ක්‍රියාකාරිත්වය | | 100% | | | |
| දෘඩාංග සංවර්ධන කටයුතු | ලැප්ටොප් යන්ත්‍ර මිලදී ගැනීම | ලැප්ටොප් යන්ත්‍ර ගණන | 10 | 100% | | | |
| | ඩෙක්ස්ටොප් යන්ත්‍ර මිලදී ගැනීම | ඩෙක්ස්ටොප් යන්ත්‍ර ගණන | 10 | 100% | | | |
| ආයතනික පරිසරය වැඩි දියුණු කිරීම | වැන්දඹු අනත්දරු විශ්‍රාම වැටුප් අංශය නවීකරණය කිරීම | 2020 වර්ෂය තුල සියළුම ව්‍යාපෘති අවසන් කිරීම | | | | 50% | |
| | කැළණිය නිවාඩු නිකේතනයේ දෙමහල් ගොඩනැගිල්ල තීන්ත ආලේප කර නවීකරණය කිරීම | | | 100% | | | |

| ක්‍රියාකාරකම | උප ක්‍රියාකාරකම | කාර්ය සාධන දර්ශක | ඇස්තමේන්තු ගත ප්‍රමාණය | අපේක්ෂිත නිමැවුමේ ප්‍රතිශතයක් (%) ලෙස සත්‍ය නිමැවුව | | | |
|---|---|---|---|---|---|---|---|
| | | | | 100%-90% | 75%-89% | 50%-74% | 49% ට අඩු |
| හිඟ විශ්‍රාම වැටුප් ගෙවීම | සිවිල් | විශ්‍රාමිකයින් ගණන | 8,000 | 115.03% | | | |
| | හමුදා | | | | | | |
| | විෂමතා | | | | | | |
| විදේශ විශ්‍රාම වැටුප් ගෙවීම | සිවිල් විශ්‍රාම වැටුප් | විශ්‍රාමිකයන් හා වැන්දඹුවන් සංඛ්‍යාව | 320 | 100.31% | | | |
| | වැන්දඹු හා අනත්දරු විශ්‍රාම වැටුප් | | 300 | | | | *** 40.66% |
| | විශ්‍රාම වැටුප් සංශෝධන | | 500 | * 2180.20% | | | |
| | හිඟ විශ්‍රාම වැටුප් ගෙවීම | | 1000 | ** 782.40% | | | |

*14/2019 රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ අනුව විදේශගත විශ්‍රාමිකයින්ගේ විශ්‍රාම වැටුප් විෂමතා ඉවත් කිරීමේ කටයුතු සිදු කළ අතර 2020 වර්ෂය සඳහා ඇස්තමේන්තු කරන ලද විශ්‍රාම වැටුප් සංශෝධන ප්‍රමාණය 500ක් වේ. එනමුත් එම වර්ෂයේදී විශ්‍රාම වැටුප් සංශෝධන 10,901ක් සිදු කර ඇත. එය ප්‍රතිශතයක් ලෙස ගත් කල 2180.20% ක් වේ.

**2020 වර්ෂය සඳහා ඇස්තමේන්තු කරන ලද හිඟ විශ්‍රාම වැටුප් ගෙවීම් ප්‍රමාණය 1000ක් වන අතර වාර්ෂික ප්‍රතිලාභීන් සංඛ්‍යාව 7,824 ක් දක්වා වැඩිවී ඇත. ප්‍රතිශතයක් ලෙස ගත් කල එය 782.40% ක් වේ.

***දිවයින පුරා ව්‍යාප්තව පැවති කොරෝනා වසංගත තත්ත්වය හේතුවෙන් කාර්යාල කටයුතු නිසි පරිදි පැවැත්වීමට නොහැකි වීම නිසා සහ ඇස්තමේන්තු කරන ලද ප්‍රමාණයට වඩා අඩුවෙන් අයදුම්පත් ලැබීම හේතුවෙන් ප්‍රගතිය අඩුවී ඇත.

# 5

# තිරසාර සංවර්ධන අරමුණු සපුරා ගැනීමේ කාර්ය සාධනය

## 5.1. හඳුනා ගන්නා ලද තිරසාර සංවර්ධන අරමුණු

| ඉලක්කය/ අරමුණ | ඉලක්කය | ජයග්‍රහණ දර්ශක | මේ දක්වා ජයග්‍රහණ ලබා ගැනීමේ ප්‍රගතිය | | |
|---|---|---|---|---|---|
| | | | 0%-49% | 50%-74% | 75%-100% |
| කොතැනක හෝ පවතින ඕනෑම ආකාරයකින් වන දුගී බව අවසන් කිරීම | තිරසාර හා සමාජ ආරක්ෂණ පද්ධති ස්ථාපිත කිරීම හා සංවර්ධනය කිරීම | රජයේ විශ්‍රාම වැටුපක් ලබන වයස්ගත ජනගහනය - ස්ත්‍රී පුරුෂ භාවය අනුව | | | |

## 5.2. තිරසාර සංවර්ධන ඉලක්ක සපුරා ගැනීමේ ජයග්‍රහණ හා අභියෝග

*විශ්‍රාම වැටුප් දෙපාර්තමේන්තුවේ මූලික කාර්යය වනුයේ රජයේ ස්ථිර, විශ්‍රාම වැටුප් හිමි තනතුරක සේවය කර විශ්‍රාම ගිය පුද්ගලයින් හට විශ්‍රාම වැටුප් හිමිගැන්වීම වේ. මෙම රජයේ විශ්‍රාමිකයින් ප්‍රමාණය මුළු ජනගහනයෙන් 3%ක් පමණ වේ.

*ශ්‍රී ලංකා ජනගහනයේ අනාගත ප්‍රක්ෂේපන සහ අවශ්‍යතා සළකා 'සැමට විශ්‍රාම' නම් ප්‍රතිපත්තිමය යෝජනා මාලාවක් 2020 වර්ෂයේදී එළිදක්වන ලදී. එමගින් මෙරට සෑම පුරවැසියෙකුටම විශ්‍රාම වැටුප් හිමිකමක් ලබාදීමට අදාලව යෝජනා ඉදිරිපත් කර ඇත. එම ප්‍රතිපත්තිය හෝ එහි වඩාත් දියුණු කරන ලද ප්‍රතිපත්තියක්, විශ්‍රාම වැටුප් පිළිබඳ රාජ්‍ය ප්‍රතිපත්තිය ලෙස අනුමත වන්නේ නම්, තිරසාර සංවර්ධන අරමුණු අදාල උප දර්ශකයට අදාල අරමුණු සාක්ෂාත් කර ගැනීමට හැකි වනු ඇත.

*එවැනි ප්‍රතිපත්තියක් ක්‍රියාත්මක කිරීමේදී විශ්‍රාම වැටුප් දෙපාර්තමේන්තුවට අමතරව සමාජ සේවා අමාත්‍යාංශය, කම්කරු දෙපාර්තමේන්තුව හා ගොවිජන රක්ෂණ මණ්ඩලය වැනි රාජ්‍ය ආයතන මෙන්ම අදාල ජාත්‍යන්තර සහ රාජ්‍ය නොවන ආයතනවල, පෞද්ගලික ආයතනවල සහයෝගය හා දායකත්වය ලබා ගැනීමට සිදු වනු ඇත.

# 6

# මානව සම්පත් පැතිකඩ

## 6.1. සේවක සංඛ්‍යා කළමනාකරණය

| | අනුමත සේවක සංඛ්‍යාව | පවතින සේවක සංඛ්‍යාව | පුරප්පාඩු (අතිරික්ත) |
|---|---|---|---|
| ජ්‍යෙෂ්ඨ | 34 | 26 | 8 |
| තෘතියික | 11 | 05 | 6 |
| ද්විතියික | 1078 | 931 | 147 |
| ප්‍රාථමික | 75 | 59 | 16 |
| **එකතුව** | **1198** | **1021** | **177** |

## 6.2. මානව සම්පත් සංවර්ධනය

| වැඩසටහනේ නම | පුහුණු කරන ලද සේවක සංඛ්‍යාව | පුහුණු වැඩසටහනේ කාල සීමාව | සමස්ථ ආයෝජන (රු) | | වැඩසටහනේ ස්වභාවය (විදේශීය/ දේශීය) |
|---|---|---|---|---|---|
| | | | දේශීය | විදේශීය | |
| වාර්ෂික වාර්තා පිළියෙල කිරීම - APFA | 2 | දින 01 | 8000 | | |
| Government Payroll system - Miloda | 2 | දින 03 | 36,000 | | |
| ආර්ථික සංවර්ධන පශ්චාත් ඩිප්ලොමාව - UOC DKRA | 1 | වසර 01 | 91,500 | | |
| කොළඹ දිස්ත්‍රික්කයේ ප්‍රාදේශීය ලේකම් කාර්යාල සඳහා විශ්‍රාම වැටුප් පිළිබඳ වැඩමුළුව | 40 | දින 01 | 21,425 | | |
| පශ්චාත් උපාධි පාඨමාලාව - UOC | 1 | වසර 01 | 147,500 | | දේශීය |
| W&OP new online system | 60 | දින 01 | 33,090 | | |
| W&OP new online system for all island internal Auditors | 65 | දින 01 | 36,025 | | |
| Government Payroll system - Miloda | 2 | දින 03 | 36,000 | | |
| විශ්‍රාම වැටුප් පිළිබඳ දැනුවත් කිරීම - මොණරාගල දිස්ත්‍රික්කය | 85 | දින 01 | 55,549 | | |
| Master of Business Administration | 2 | වසර 02 | 1,150,000 | | |

| වැඩසටහනේ නම | පුහුණු කරන ලද සේවක සංඛ්‍යාව | පුහුණු වැඩසටහනේ කාල සීමාව | සමස්ථ ආයෝජන (රු) | | වැඩසටහනේ ස්වාභාවය (විදේශීය/ දේශීය) |
|---|---|---|---|---|---|
| | | | දේශීය | විදේශීය | |
| වැන්දඹු අනත්දරු විශ්‍රාම වැටුප් මාර්ගගත පද්ධතිය සම්බන්ධයෙන් හම්බන්තොට දිස්ත්‍රික් වි.වැ.දෙ. කාර්යමණ්ඩලය දැනුවත් කිරීම | 32 | දින 01 | 190,000 | | දේශීය |
| වැන්දඹු අනත්දරු විශ්‍රාම වැටුප් මාර්ගගත පද්ධතිය සම්බන්ධයෙන් කොළඹ දිස්ත්‍රික්කයේ ප්‍රාදේශීය ලේකම් කාර්යාලවල වි.වැ.දෙ. කාර්යමණ්ඩලය දැනුවත් කිරීම | 63 | දින 05 | 7,700 | | |
| වැන්දඹු අනත්දරු විශ්‍රාම වැටුප් මාර්ගගත පද්ධතිය සම්බන්ධයෙන් නුවර, නුවරඑළිය, මාතලේ, කෑගල්ල දිස්ත්‍රික්කයේ සියළුම ප්‍රාදේශීය කාර්යාලයන්හි විශ්‍රාම වැටුප් විෂය භාර නිලධාරීන් දැනුවත් කිරීම | 90 | දින 01 | 67,300 | | |
| 2021 වර්ෂයේ අයවැය සඳහා වියදම් ඇස්තමේන්තු සැකසීම | 60 | දින 01 | 43,200 | | |

7

# අනුකූලතා වාර්තාව

| අංකය | අදාල කර ගත යුතු අවශ්‍යතාව | අනුකූලතා තත්ත්වය (අනුකූල වේ/ අනුකූල නොවේ) | අනුකූල නොවේ නම් ඒ සඳහා කෙටි පැහැදිලි කිරීම | අනුකූල නොවීම අනාගතයේදී වළක්වා ගැනීමට යෝජනා කරන නිරවද්‍ය තීරණ ක්‍රියාමාර්ග |
|---|---|---|---|---|
| **1.** | **පහත සඳහන් මූල්‍ය ප්‍රකාශ / ගිණුම් නියමිත දිනට ඉදිරිපත් කොට තිබේ** | | | |
| 1.1 | වාර්ෂික මූල්‍ය ප්‍රකාශ | අනුකූල වේ | | |
| 1.2 | රාජ්‍ය නිලධාරීන්ගේ අත්තිකාරම් ගිණුම | අනුකූල වේ | | |
| 1.3 | ව්‍යාපාර හා නිෂ්පාදන අත්තිකාරම් ගිණුම (වාණිජ අත්තිකාරම් ගිණුම) | අදාල නොවේ | | |
| 1.4 | ගබඩා අත්තිකාරම් ගිණුම | | | |
| 1.5 | විශේෂ අත්තිකාරම් ගිණුම | | | |
| 1.6 | වෙනත් | | | |
| **2.** | **පොත්පත් හා ලේඛන නඩත්තු කිරීම් (මු.රෙ.445)** | | | |
| 2.1 | රා.ප.ච. 267/2018 අනුව ස්ථාවර වත්කම් ලේඛනය යාවත්කාලින කර පවත්වාගෙන යාම | අනුකූල වේ | | |
| 2.2 | පුද්ගල පඩිනඩි ලේඛනය/පුද්ගල පඩිනඩි කාඩ්පත් යාවත්කාලීන කර පවත්වාගෙන යාම | අනුකූල වේ | | |
| 2.3 | විගණන විමසුම් ලේඛනය යාවත්කාලීන කර පවත්වාගෙන යාම | අනුකූල වේ | | |
| 2.4 | අභ්‍යන්තර විගණන වාර්තා ලේඛනය යාවත්කාලීන කර පවත්වාගෙන යාම | අනුකූල වේ | | |
| 2.5 | සියලුම මාසික ගිණුම් සාරාංශ (CIGAS) පිළියෙල කර නියමිත දිනට මහා භාණ්ඩාගාරයට ඉදිරිපත් කිරීම | අනුකූල වේ | | |
| 2.6 | චෙක්පත් හා මුදල් ඇණවුම් ලේඛනය යාවත්කාලීන කර පවත්වාගෙන යාම | අනුකූල වේ | | |
| 2.7 | ඉන්වෙන්ට්‍රි ලේඛනය යාවත්කාලීන කර පවත්වාගෙන යාම | අනුකූල වේ | | |
| 2.8 | තොග ලේඛනය යාවත්කාලින කර පවත්වාගෙන යාම | අනුකූල වේ | | |
| 2.9 | හානි පාඩු ලේඛනය යාවත්කාලීන කර පවත්වාගෙන යාම | අනුකූල වේ | | |
| 2.10 | බැරකම් ලේඛනය යාවත්කාලීන කර පවත්වාගෙන යාම | අනුකූල වේ | | |
| 2.11 | උප පත්‍රිකා ලේඛනය (GA - N20) යාවත්කාලීන කර පවත්වාගෙන යාම | අනුකූල වේ | | |
| **03** | **මූල්‍ය පාලනය සඳහා කාර්යයන් අභියෝජනය කිරීම (මු.රෙ. 135)** | | | |
| 3.1 | මූල්‍ය බලතල ආයතනය තුළ පවරා දී තිබීම | අනුකූල වේ | | |
| 3.2 | මූල්‍ය බලතල පවරාදීම පිළිබඳ ආයතනය තුළ දැනුවත් කර තිබීම | අනුකූල වේ | | |

| | | | | |
|---|---|---|---|---|
| 3.3 | සෑම ගනුදෙනුවක්ම නිලධාරීන් දෙදෙනෙක් හෝ ඊට වැඩි සංඛ්‍යාවක් හරහා අනුමත වන පරිදි බලතල පවරා දී තිබීම | අනුකූල වේ | | |
| 3.4 | 2014.05.11 දිනැති අංක 171/2004 දරණ රාජ්‍ය ගිණුම් චක්‍රලේඛය අනුව, රජයේ පඩිපත් මෘදුකාංග පැකේජය භාවිතා කිරීමේ දී ගණකාධිකාරීවරයන්ගේ පාලනයට යටත්ව කටයුතු කිරීම | අනුකූල වේ | | |
| **4** | **වාර්ෂික සැලසුම් සකස් කිරීම** | | | |
| 4.1 | වාර්ෂික ක්‍රියාකාරී සැලැස්ම සකස් කිරීම | අනුකූල වේ | | |
| 4.2 | වාර්ෂික ප්‍රසම්පාදන සැලැස්ම සකස් කිරීම | අනුකූල වේ | | |
| 4.3 | වාර්ෂික අභ්‍යන්තර විගණන සැලසුම සකස් කිරීම | අනුකූල වේ | | |
| 4.4 | වාර්ෂික ඇස්තමේන්තුව සකස් කොට ජාතික අයවැය දෙපාර්තමේන්තුවට (NBD) නියමිත දිනට ඉදිරිපත් කිරීම | අනුකූල වේ | | |
| 4.5 | වාර්ෂික මුදල් ප්‍රවාහ ප්‍රකාශය නියමිත දිනට භාණ්ඩාගාර මෙහෙයුම් දෙපාර්තමේන්තුවට ඉදිරිපත් කර තිබීම | අනුකූල වේ | | |
| **5** | **විගණන විමසුම්** | | | |
| 5.1 | විගණකාධිපති විසින් නියම කොට ඇති දිනට, සියළුම විගණන විමසුම්වලට පිළිතුරු ලබා දී තිබීම | අනුකූල නොවේ | * ප්‍රාදේශීය ලේකම් කාර්යාල හා අනෙකුත් සම්බන්ධිත ආයතනයන්ගෙන් පිළිතුරු ලබා නිවැරදි කිරීම් කර පිළිතුරු විගණකාධිපති වෙත ඉදිරිපත් කිරීමේදී කාල ප්‍රමාදයක් ඇති වේ. | |
| **6** | **අභ්‍යන්තර විගණනය** | | | |
| 6.1 | මුදල් රෙගුලාසි 134 (2) DMA/1-2019 අනුව වසර ආරම්භයේදී විගණකාධිපතිවරයා සමඟ සාකච්ඡා කිරීමෙන් අනතුරුව, අභ්‍යන්තර විගණන සැලසුම සකස් කිරීම | අනුකූල වේ | | |
| 6.2 | සෑම අභ්‍යන්තර විගණන වාර්තාවකටම මාසයක කාලයක් තුලදී පිළිතුරු සපයා තිබීම | අනුකූල වේ | | |
| 6.3 | 2018 අංක 19 දරණ ජාතික විගණන පනතේ 40(4) උප වගන්තිය ප්‍රකාරව, සියළුම අභ්‍යන්තර විගණන වාර්තාවල පිටපත් කළමනාකරණ විගණන දෙපාර්තමේන්තුවට ඉදිරිපත් කර තිබීම | අනුකූල වේ | | |
| 6.4 | මුදල් රෙගුලාසි 134(3) ප්‍රකාරව, අභ්‍යන්තර විගණන වාර්තාවල පිටපත් විගණකාධිපතිවරයාට ඉදිරිපත් කර තිබීම | අනුකූල වේ | | |

| | | | | |
|---|---|---|---|---|
| **7** | **විගණන හා කළමනාකරණ කමිටුව** | | | |
| 7.1 | DMA චක්‍රලේඛ 1-2019 අනුව, අවම වශයෙන් විගණන හා කළමනාකරණ කමිටු 04 ක් වත් අදාළ වර්ෂය තුළ පවත්වාගෙන තිබීම | අනුකූල නොවේ | කොරෝනා වසංගතය හේතුවෙන් ඒ ඒ ආයතනයන්හි පැවති තත්ත්වය තුල නිලධාරීන් බාහිර ආයතනයන් වෙත යාම වැලකීම තුල රැස්වීම් පැවැත්වීම සීමාවිය. | |
| **8** | **වත්කම් කළමනාකරණය** | | | |
| 8.1 | අංක 01/2017 දරණ වත්කම් කළමනාකරණ චක්‍රලේඛයේ 07 වන පරිච්ජේදය අනුව, වත්කම් මිල දී ගැනීම් හා අපහරණය කිරීම් පිළිබඳ තොරතුරු කොම්ප්ට්‍රෝලර් ජනරාල් කාර්යාලය වෙත ඉදිරිපත් කර තිබිම | අනුකූල වේ | | |
| 8.2 | ඉහත සඳහන් චක්‍රලේඛයේ 13 වන පරිච්ජේදය ප්‍රකාරව, එම චක්‍රලේඛයේ විධිවිධාන ක්‍රියාත්මක කිරීම සම්බන්ධීකරණය සඳහා සුදුසු සම්බන්ධතා නිලධාරියෙකු පත් කර එම නිලධාරියා පිළිබඳ තොරතුරු කොම්ප්ට්‍රෝලර් ජනරාල් කාර්යාලයට වාර්තා කර තිබීම | අනුකූල වේ | | |
| 8.3 | රාජ්‍ය මූල්‍ය චක්‍රලේඛ අංක 01/2020 අනුව භාණ්ඩ සමීක්ෂණ පවත්වා අදාළ වාර්තා නියමිත දිනට විගණකාධිපතිවරයා වෙත ඉදිරිපත් කර තිබීම | අනුකූල වේ | | |
| 8.4 | වාර්ෂික භාණ්ඩ සමීක්ෂණයෙන් අනාවරණය වු අතිරික්ත, ඌනතා හා වෙනත් නිර්දේශ චක්‍රලේඛයේ සඳහන් කාලය තුළ සිදුකොට තිබීම | අනුකූල වේ | | |
| 8.5 | ගර්හිත භාණ්ඩ අපහරණය කිරීම මු.රෙ.772 අනුව සිදු කිරීම | අනුකූල වේ (2019 වර්ෂයට අදාල භාණ්ඩ සමීක්ෂණයෙන් අනාවරණය වු භාණ්ඩ අපහරණය කර අවසන් කර ඇත ) | | |
| **9.** | **වාහන කළමනාකරණය** | | | |
| 9.1 | සංචිත වාහන සඳහා දෛනික ධාවන සටහන් සහ මාසික සාරාංශ වාර්තා සකස් කොට නියමිත දිනට විගණකාධිපති වෙත ඉදිරිපත් කිරීම | අනුකූල වේ | | |

| | | | | |
|---|---|---|---|---|
| 9.2 | වාහන ගර්හිත වී මාස 6කට වඩා අඩු කාලයක දී අපහරණය කර තිබීම | අනුකූල වේ | | |
| 9.3 | වාහන ලොග් පොත් පවත්වා ගනිමින් ඒවා යාවත්කාලීන කර පවත්වාගෙන යාම | අනුකූල වේ | | |
| 9.4 | සෑම වාහන අනතුරක් සම්බන්ධයෙන්ම මුදල් රෙගුලාසි 103, 104, 109 හා 110 ප්‍රකාරව කටයුතු කිරීම | අනුකූල වේ | | |
| 9.5 | 2016.12.29 දිනැති අංක 30/2016 දරණ රාජ්‍ය පරිපාලන චක්‍රලේඛයේ 3.1 ඡේදයේ සඳහන් විධිවිධාන ප්‍රකාරව වාහනවල ඉන්ධන දහනය වීම නැවත පරීක්ෂා කිරීම | අනුකූල වේ | | |
| 9.6 | කල්බදු කාල සීමාවෙන් අනතුරුව, බදු වාහන ලොග් පොත්වල සම්පූර්ණ අයිතිය පවරා ගෙන තිබීම | අනුකූල වේ | | |
| **10** | **බැංකු ගිණුම් කළමනාකරණය** | | | |
| 10.1 | නියමිත දිනට බැංකු සැසඳුම් ප්‍රකාශ පිළියෙල කර සහතික කර ඒවා විගණනය සඳහා ඉදිරිපත් කර තිබීම | අනුකූල වේ | | |
| 10.2 | සමාලෝචිත වර්ෂයේදී හෝ ඊට පෙර වර්ෂ වල සිට ඉදිරියට රැගෙන ආ අක්‍රීය බැංකු ගිණුම් නිරවුල් කර තිබීම | අනුකූල වේ | | |
| 10.3 | බැංකු සැසඳුම් ප්‍රකාශ වලින් අනාවරණය වූ හා ගැලපුම් කළ යුතුව තිබූ ශේෂ සම්බන්ධයෙන් මුදල් රෙගුලාසි ප්‍රකාරව කටයුතු කොට එම ශේෂ මාසයක කාලයක් ඇතුළත නිරවුල් කර තිබීම | අනුකූල වේ | | |
| **11** | **ප්‍රතිපාදන උපයෝජනය** | | | |
| 11.1 | සලසා තිබූ ප්‍රතිපාදන ඒවායේ සීමාව ඉක්මවා නොයන පරිදි වියදම් දැරීම | අනුකූල වේ | | |
| 11.2 | මු.රෙ.94(1) ප්‍රකාරව, සලසන ලද ප්‍රතිපාදනයෙන් උපයෝජනය කළ පසු වර්ෂ අවසානයේදී ඉතිරි ප්‍රතිපාදන සිමාව නොඉක්මවන පරිදි බැරකම්වලට එළඹීම | අනුකූල වේ | | |
| **12** | **රාජ්‍ය නිලධාරීන්ගේ අත්තිකාරම් ගිණුම** | | | |
| 12.1 | සීමාවන් වලට අනුකූල වීම | අනුකූල වේ | | |
| 12.2 | හිඟහිටි ණය ශේෂ පිළිබඳ කාල විශ්ලේෂණයක් සිදු කර තිබීම | අනුකූල වේ | | |
| 12.3 | වර්ෂයකට වැඩි කාලයක සිට පැවත එන හිඟහිටි ණය ශේෂ නිරවුල් කර තිබීම | අනුකූල නොවේ | *එම ණය ශේෂ කපාහැරීමට අනුමැතිය ලබා ගැනීම සඳහා රාජ්‍ය සේවා අමාත්‍යාංශ ලේකම් වෙත යවා ඇත. | |

| | | | | |
|---|---|---|---|---|
| **13** | **පොදු තැන්පත් ගිණුම** | | | |
| 13.1 | කල් ඉකුත් වූ තැන්පතු සම්බන්ධයෙන් මු.රෙ.571 ප්‍රකාරව කටයුතු කර තිබීම | අනුකූල වේ | | |
| 13.2 | පොදු තැන්පතු සඳහා වන පාලන ගිණුම යාවත්කාලීන කර පවත්වාගෙන යාම | අනුකූල වේ | | |
| **14** | **අග්‍රිම ගිණුම** | | | |
| 14.1 | සමාලෝචිත වර්ෂය අවසානයේදී මුදල් පොතේ ශේෂය භාණ්ඩාගාර මෙහෙයුම් දෙපාර්තමේන්තුවට ප්‍රේෂණය කර තිබීම | අනුකූල වේ | | |
| 14.2 | මු.රෙ.371 ප්‍රකාරව නිකුත් කළ තත්කාර්ය අතුරු අග්‍රිම, එම කාර්යය අවසන් වී මාසයක් ඇතුළත නිරවුල් කර තිබීම | අනුකූල වේ | | |
| 14.3 | මු.රෙ.371 ප්‍රකාරව අනුමත සීමාව ඉක්මවා නොයන පරිදි තත්කාර්ය අතුරු අග්‍රිම නිකුත් කර තිබීම | අනුකූල වේ | | |
| 14.4 | අග්‍රිම ගිණුමේ ශේෂය, භාණ්ඩාගාරයේ පොත් සමඟ මාසිකව සැසඳුම් කිරීම | අනුකූල වේ | | |
| **15** | **ආදායම් ගිණුම** | | | |
| 15.1 | අදාළ රෙගුලාසි වලට අනුකූලව, රැස් කළ ආදායමෙන් ආපසු ගෙවීම් සිදු කොට තිබීම | අනුකූල වේ | | |
| 15.2 | රැස් කර තිබූ ආදායම්, තැන්පතු ගිණුමට බැර නොකොට සෘජුවම ආදායමට බැර කර තිබීම | අනුකූල වේ | | |
| 15.3 | මු.රෙ.176 අනුව හිඟ ආදායම් වාර්තා විගණකාධිපතිවරයා වෙත ඉදිරිපත් කර තිබීම | අනුකූල වේ | | |
| **16** | **මානව සම්පත් කළමනාකරණය** | | | |
| 16.1 | අනුමත කාර්යය මණ්ඩල සීමාව තුළ කාර්යය මණ්ඩලය පවත්වාගෙන යාම | අනුකූල වේ | | |
| 16.2 | කාර්යය මණ්ඩලයේ සියළුම සාමාජිකයන් වෙත රාජකාරී ලැයිස්තු ලිඛිතව ලබා දී තිබීම | අනුකූල වේ | | |
| 16.3 | 2017.09.20 දිනැති MSD චක්‍රලේඛ අංක 04/2017 ප්‍රකාරව සියළුම වාර්තා කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුව වෙත ඉදිරිපත් කර තිබීම | අනුකූල වේ | | |

| | | | | |
|---|---|---|---|---|
| **17** | **මහජනයා වෙත තොරතුරු ලබා දීම** | | | |
| 17.1 | තොරතුරු දැන ගැනීමේ පනත හා රෙගුලාසි ප්‍රකාරව තොරතුරු නිලධාරියෙකු පත් කොට තොරතුරු ලබාදීමේ ලේඛනයක් යාවත්කාලීන කර පවත්වාගෙන යාම | අනුකූල වේ | | |
| 17.2 | ආයතනය පිළිබඳ තොරතුරු එහි වෙබ් අඩවිය හරහා ලබා දී තිබෙන අතර, වෙබ් අඩවිය හරහා හෝ විකල්ප මාර්ග හරහා ආයතනය පිළිබඳ මහජනයාගේ ප්‍රශංසා/ චෝදනා පල කිරීමට පහසුකම් සලසා තිබීම | අනුකූල වේ | | |
| 17.3 | තොරතුරු දැන ගැනීමේ පනතේ 08 වන හා 10 වන වගන්ති ප්‍රකාරව වසරකට දෙවතාවක් හෝ වසරකට වරක් වාර්තා ඉදිරිපත් කිරීම | අනුකූල වේ | | |
| **18** | **පුරවැසි ප්‍රඥප්තිය ක්‍රියාත්මක කිරිම** | | | |
| 18.1 | අංක 05/2008 හා 05/2018(1) දරණ රාජ්‍ය පරිපාලන හා කළමනාකරණ අමාත්‍යාංශ චක්‍රලේඛ අනුව පුරවැසි/ සේවාලාභී ප්‍රඥපතියක් සම්පාදනය කොට ක්‍රියාත්මක කර තිබීම | අනුකූල නොවේ | | |
| 18.2 | එම චක්‍රලේඛයේ 2.3 ඡේදය පරිදි, පුරවැසි/ සේවාලාභී ප්‍රඥප්තියක් සම්පාදනය කිරීම හා ක්‍රියාත්මක කිරීමේ කටයුතු අධීක්ෂණය කිරීම හා ඇගයීම සඳහා ආයතන විසින් ක්‍රමවේදයක් සකස් කොට තිබීම | අනුකූල නොවේ | | |
| **19** | **මානව සම්පත් සැලැස්ම සම්පාදනය කිරීම** | | | |
| 19.1 | 2018.01.24 දිනැති රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ අංක 02/2018 ඇමුණුම 02 ආකෘතිය පදනම් කරගෙන මානව සම්පත් සැලැස්මක් සකස් කොට තිබීම | අනුකූල නොවේ | මෙම චක්‍රලේඛය ඇමුණුම 02 ප්‍රකාරව පිළියෙල කිරීමට ප්‍රායෝගික අපහසුතා ඇති බව නිරීක්ෂණය වේ. ආයතනයට සුදුසු පරිදි මානව සම්පත් සැලැස්මක් පිළියෙල කිරීමට කටයුතු කරමින් පවතී. | |
| 19.2 | කාර්ය මණ්ඩලයේ සෑම සාමාජිකයෙකු සඳහාම වර්ෂයකට අවම වශයෙන් පැය 12 කට නොඅඩු පුහුණු අවස්ථාවක් ඉහත සඳහන් මානව සම්පත් සැලැස්ම තුළ තහවුරු කොට තිබීම | අනුකූල නොවේ | කොරෝනා වසංගත තත්ත්වය හේතුවෙන් කාර්යාලයන්හි බාහිර සෞඛ්‍ය ආරක්ෂිත නිර්දේශ අනුව පුහුණු වැඩසටහන් පැවැත්වීම සීමා කෙරිණි. | |

| | | | | |
|---|---|---|---|---|
| 19.3 | ඉහත සඳහන් චක්‍රලේඛයේ ඇමුණුම 1 හි දැක්වෙන ආකෘතිය පදනම් කරගෙන සමස්ත කාර්යය මණ්ඩලය සඳහාම වාර්ෂික කාර්ය සාධන ගිවිසුම් අත්සන් කර තිබීම | අනුකූල නොවේ | මාණ්ඩලික නිලධාරීන් සඳහා පමණක් මෙම ගිවිසුම් අත්සන් කරයි. | |
| 19.4 | ඉහත චක්‍රලේඛයේ 6.5 ඡේදය ප්‍රකාරව මානව සම්පත් සංවර්ධනය සැලැස්ම පිළියෙල කිරීම ධාරිතා සංවර්ධන වැඩසටහන් සංවර්ධනය කිරීම" නිපුණතා සංවර්ධන වැඩසටහන් ක්‍රියාත්මක කිරීම පිළිබඳ වගකීම් පවරා ජ්‍යෙෂ්ඨ නිලධාරියෙකු පත් කොට තිබීම | අනුකූල වේ | | |
| **20** | **විගණන ඡේද වලට ප්‍රතිචාර දැක්වීම** | | | |
| 20.1 | ඉකුත් වර්ෂ සඳහා විගණකාධිපති විසින් නිකුත් කල විගණන ඡේද මඟින් පෙන්වා දී ඇති අඩුපාඩු නිවැරදි කොට තිබීම | අනුකූල වේ | | |